# ත්‍රිපිටක ධර්මය

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

## 5 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ත්‍රිපිටක ධර්මය**
මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය
5 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0514-0

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

මුද්‍රණය : හෝමාගම, කටුවාන පාර, කාර්මික ජනපදය, 145 දරන ස්ථානයෙහි පිහිටි සවින්ද ග්‍රැෆික් සිස්ටම්ස් (පුද්ගලික) සමාගමෙහි මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී.

## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය

පිරිවෙන් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත් වෙමි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායී බව උදෙසා පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑතකාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධන තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑතකාලීන ක්‍රියාමාර්ග අතරට එක් වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සියලු විෂයයන් ආවරණය කරමින් සකස් කර ඇති මෙම මාර්ගෝපදේශ පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවාලීම වෙනුවෙන් සැබෑ මෙහෙවරක් වනු ඇති බව මගේ විශ්වාසයයි.

මෙම සත්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා, නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තුමිය ප්‍රමුඛ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයට ද කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**
අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උරදිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි අධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් මිදීමට අපට නොහැකි ය.

කාලීනව වෙනස් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රම ශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව ආයෝජන කර ගැනීමටත් විෂය මාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියෙකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශ, ඔබට මහඟු පිටුවහලක් වනු ඇත.

ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගනිමින් වඩාත් උචිත ක්‍රම ශිල්ප යොදා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපනික අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නොවී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තත් ක්‍රියාකාරකම් පදනම් කරගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂය මාලාවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

පිරිවෙන් ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණීතලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසුකර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්නව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙන මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂාකර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදකව නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙන සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදකව නව විෂය මාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදුවන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක්ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාටද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මාගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුවයි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එකම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325 ක ඉතිහාසයක් ඇති මහා විහාරීය අධ්‍යාපන සම්ප්‍රදායයේ කේන්ද්‍රස්ථානය වූ ‘පිරිවෙණ’ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ සෘජු දයකත්වයක් නොතිබුණි.

පිරිවෙන් අංශයක්/ දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමැතිතුමන් 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශීර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No. 5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායකවීමට ජාතික අධ්‍යාපන ආයතනයට සෘජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදුතාව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කරගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවධිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙනෙහි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මකව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ පන්සියයක් දෙනා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කරගත් සමයාන්තර ඥානයත් සම්භාව්‍ය හා නූතන භාෂාවනුත් ශිල්ප කලා ඥානයත් ජ්‍යොතිර්විද්‍යා, වාස්තුවිද්‍යා ඥානයත් ආදි ඥාන සම්භාරයත් කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදනය කෙරේ.

21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුන ද පිළිගත් ක්‍රම ශිල්ප ඔස්සේ පිරිවෙනට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම, මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදු කරන්නට ලැබීම පිළිබඳ ව අනතිමානී ආනන්දයක් ලබමි. පන්ති කාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස් ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහාය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත් උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත්දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

## විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය :**

ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**මෙහෙයවීම :**

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

**විජිත වෙලගෙදර**
අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**අධීක්ෂණය :**

**ආචාර්ය, පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය :**

**පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන, පිරිවෙන් අධ්‍යාපන ඒකකය,
ජාතික අධ්‍යාපන ආයතනය

**පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය නියාමනය :**

**පූජ්‍ය උඩුගම සුදස්සි හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දෙපාර්තමේන්තු ප්‍රධානි, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ත්‍රිපිටක ධර්මය), පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය.

**විෂය විශේෂඥ උපදේශනය :**

**පූජ්‍ය කනත්තේගොඩ සද්ධාරතන හිමි**
මහාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය

**ලේඛක මණ්ඩලය :**

**පූජ්‍ය උඩුගම්පල ගුණානන්ද හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය

**පූජ්‍ය උඩුගම සුදස්සි හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දෙපාර්තමේන්තු ප්‍රධානි, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**පූජ්‍ය මැටිබැඹියේ ධම්මසිරි හිමි**
සහාය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**පූජ්‍ය රම්මලේ සුමනරතන හිමි**
ගුරු උපදේශක (ගම්පහ), මිනු/ විද්‍යාදර්ශි මූලික පිරිවෙණ, හිරිකුළුව, මුද්දරගම

**ජී. ආර්. එම්. ඒ. ගම්ලත්**
සහකාර කථිකාචාර්ය, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**ඊ. ඒ. ජයසේන එදිරිසිංහ**
විශ්‍රාමික විෂය උපදේශක, අංක 498 බී, කොස්වත්ත, රදාවාන

**ඩබ්. පී. එස්. වීරසූරිය**
පරිවේණාචාර්ය, සිරි නිකේත මහ පිරිවෙණ, ගල්කන්ද, හොරම්පැල්ල

**බැලීම/භාෂා සංස්කරණය :**

**ඩී. එම්. ජේ. පුෂ්පකුමාර**
නියෝජ්‍ය කොමසාරිස් (පාලන), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**පරිගණක වදන් :**

**පී. ඒ. ශයිනි ඉමල්ෂා විජේවර්ධන**
පරිගණක අංශය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**විවිධ සහාය :**
**පී. ජී. බුද්ධිකා කරුණාරත්න**
කළමනාකරණ සේවා නිළධාරී
අධ්‍යාපන අමාත්‍යාංශය

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් ප්‍රතිබල සම්පන්න භික්ෂු පරපුරක් නිර්මාණය කිරීම ජාතික පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රමුඛ පරමාර්ථයයි. ශාක්‍යමුනීන්ද්‍ර ගෞතම බුදුරජාණන් වහන්සේ මෙලොවට දායාද කළ නෛර්‍යාණික ශ්‍රී සද්ධර්මය අධ්‍යාත්මය සුවපත් කරලීම උදෙසා පවත්වාගෙන යාමේ මූලිකත්වය ගත් භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය උදෙසා වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය ප්‍රබල දායකත්වයක් සපයයි.

පිරිවෙන් අධ්‍යාපනය වඩාත් ඵලදායී හා ගුණාත්මක අර්ථ පූර්ණ භාවයට පත් කරලීම උදෙසා වර්තමාන අධ්‍යාපන ප්‍රවාහය තුළ ක්‍රියාත්මක නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දී ඇත. ඒ අනුව විෂය මාලා ප්‍රතිසංස්කරණය සිදු කර පරිවේණාචාර්යවරුන්ට අවශ්‍ය පහසුකම් සලසා දීමට ක්‍රියාකර ඇත. එයට අදාල විෂය නිර්දේශය හා පෙළපොත සම්පාදනයෙන් අනතුරුව ගුරු මාර්ගෝපදේශය සකස් වන්නේ ඵලදායී බව තවත් වැඩිකර ගැනීමේ අරමුණ පෙරදැරි කොට ගෙනයි.

ජාතික පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රධානතම විෂය ධාරාව වන්නේ ත්‍රිපිටක ධර්මයයි. ත්‍රිපිටක අධ්‍යාපනයෙන් තොරව භික්ෂු අධ්‍යාපනය සාර්ථකත්වය කරා පියමැනිය නොහැක. සූත්‍ර, විනය, අභිධර්මය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් වර්තමාන භික්ෂූන් වහන්සේ ලබා ගැනීම යුගයේ අවශ්‍යතාවක් ද වෙයි. සම්බුද්ධ ශාසනය විෂයයෙහි එල්ලවන නොයෙක් අභියෝග ජය ගැනීමට ඇති එක ම විසඳුම වන්නේ භික්ෂූන් වහන්සේ ප්‍රතිබල සම්පන්න වීමයි.

ත්‍රිපිටක ධර්මය විෂය භාර ගුරු භවතා දැඩි වගකීමෙන් යුතු ව ක්‍රියා කරන්නේ නම් යථෝක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉතා පහසු ය. සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රම මෙන් ම නූතන අධ්‍යාපන ක්‍රමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් අපේක්ෂිත ඉලක්කයන් කරා ශිෂ්‍ය ප්‍රජාව මෙහෙයවීම ඔවුන්ගේ වගකීමක් බව ද අවධාරණය කරමි.

ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයාණන් වහන්සේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ය. උන්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රම සරල ය. ප්‍රායෝගික ය. අවස්ථෝචිත ය. තමන් වහන්සේ හමුවට පැමිණෙන තැනැත්තාගේ මානසික ස්වභාවය හඳුනාගෙන ඊට අවශ්‍ය මාර්ගෝපදේශ සලස්වාදීමට බුදුරජාණන් වහන්සේ ක්‍රියා කළ අන්දම සූත්‍ර දේශනාවන් පරිශීලනය කරන විට මෙන් ම සම්බුද්ධ චරිතය හදාරන විට ද අපට මැනවින් පසක් වේ.

නූතන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය තුළින් ද ගුරුවරයා ශිෂ්‍යයාට මාර්ගෝපදේශකයකු ලෙස ඉගෙනුම් අවස්ථා හා පරිසර නිර්මාණය කරදීමට දක්ෂයකු විය යුතු බව අවධාරණය කර ඇත. ත්‍රිපිටක ධර්මය විෂය, විෂය දැනුමින් එහා ගිය පුද්ගල අධ්‍යාත්ම සංවර්ධනය ඉලක්ක කර ගත් දාර්ශනික ප්‍රවාහයකි. විෂය ක්ෂේත්‍ර වශයෙන් ගත් කල පුද්ගලයාගේ සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා වර්ධනය උදෙසා අවශ්‍ය මාර්ගෝපදේශ ත්‍රිපිටකය තුළින් මනාව විග්‍රහ වී ඇත.

පිරිවෙන් ත්‍රිපිටක ධර්මය විෂය මාලාව සකස් කිරීමේ දී එම සියලු ක්ෂේත්‍ර පරිශීලනය කිරීමට අවශ්‍ය මූලික දැනුම අන්තර්ගත කිරීමට අප උත්සාහ දරා ඇත.

බුද්ධ චරිතය, චරිත කතා, විනය, සූත්‍ර, අභිධර්මය, ධම්ම පදය, භාවනා, මූලික ධර්ම කරුණු, බෞද්ධ සමාජ හා සංස්කෘතිය, ශාසනික චර්යා හා වත් පිළිවෙත් ආදි ක්ෂේත්‍ර හරහා නවක භික්ෂුවකට සිය භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීම උදෙසා මග පෙන්වීම් ලබා දීමට හැකි වී ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනයේ දී මෙහි ඇතුළත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතය ඔබේ ඉගැන්වීම් ක්‍රමයට පහසුවක් වනු ඇත. මෙහි යෝජනා කර ඇති පාඩම් සැලසුම් එලෙසින් ම භාවිත කිරීම අනිවාර්ය නොවන අතර එය මග පෙන්වීමක් බව සලකන්න. ඔබේ ප්‍රදේශයේ, පිරිවෙන් සංස්කෘතියේ මෙන් ම ශිෂ්‍ය සංඛ්‍යාවට අනුව එය ගැළපෙන ලෙස භාවිත කළ හැකි ය. එහෙත් මෙම ගුරු මාර්ගෝපදේශය යෝජනා කර ඇති නිපුණතා හා නිපුණතා මට්ටම් වෙනස් නොකළ යුතු බව අවධාරණය කරමි. පන්තියට අදාළ පෙළපොත ද භාවිත කරමින් ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සංවිධානය කොට පාඩම් අවසානයේ දී එම නියමිත ඉගෙනුම් පල ඔස්සේ නිපුණතා මට්ටමට ළඟාවීම අපේක්ෂා කෙරේ. එසේ නිපුණතා මට්ටම් කීපයක් මගින් නිපුණතාවට ශිෂ්‍යයා මෙහෙයවිය යුතු ය.

ඔබගේ නව නිර්මාණ හා අදහස් ද එක්කොට ගනිමින් ප්‍රාදේශීය වශයෙන් හෝ ඔබ පිරිවෙනට ආවේණික සංස්කෘතියට අනුව පාඩම් සැලසුම් සකස්කොට ගන්න. එහි දී වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළ භාවිත වන නවීන තාක්ෂණික මෙවලම් ද ඔබ හැකි තරම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට භාවිත කරන්න. එහි දී ත්‍රිපිටක ධර්ම විෂයයට එම උපකරණ ගැළපේ දැයි සිතන්න. උපකරණ භාවිතයේ දී බෞද්ධ සංස්කෘතියට හෝ ආගමික වටපිටාවට හෝ ශිෂ්‍ය විනයට හානි නොවන ලෙස භාවිතයට කටයුතු කරන්න.

පාඩම ආරම්භයේ දී ආකර්ෂණීය මෙන් ම ප්‍රබෝධාත්මක පිවිසීම් භාවිත කිරීම වැඩි ප්‍රතිඵල ලැබීමට රුකුලක් වනු ඇත. පාඩම් සංවර්ධනයේ දී භාවිත කළ හැකි ගුණාත්මක යෙදවුම් හැකි උපරිමයෙන් භාවිත කරන්න. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබ පන්ති කාමරයේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරමින් පාඩම් සංවර්ධනය කිරීම වැඩි ප්‍රතිඵලදායක බව අවධාරණය කරමි.

ත්‍රිපිටක ධර්මය විෂය සාර්ථකව ශිෂ්‍යයා වෙත යොමු කිරීම අප සතු යුතුකමකි. ඒ සඳහා ශිෂ්‍යයා මැනවින් තේරුම් ගෙන ඊට ගැළපෙන ඉගෙනුම් ක්‍රමවේද භාවිත කිරීම අඛණ්ඩව කළ යුතු ය. අදාළ නිපුණතා මට්ටමට ළඟාවීමට අවශ්‍ය තක්සේරු හා ඇගයීම් නිර්ණායක සකස් කොට ඇගයීමට ලක් කරමින් අපහසුතා දක්වන සිසුන් වෙතොත් නැවත නැවත ඇගයීමට ලක් කරමින් නිපුණතා මට්ටමට ළඟා වන්න ශිෂ්‍යයාට දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කර සටහන් තබන්න. සෑම පාඩමක් අවසානයේ දී ම හැකි තරම් අභ්‍යාසවල ශිෂ්‍යයින් යෙදවීමට කටයුතු කරන්න. ශිෂ්‍යයාට වැඩිපුර ප්‍රායෝගික අවස්ථා ලබා දී නිපුණතාවට ළඟාවීමට හැකි බව සිතන්න.

ගුරු මාර්ගෝපදේශය පරිශීලනයේ දී ගුරු භවතුන් මෙකී කරුණු පිළිබඳ දැඩි අවධානය යොමු කොට ශාසනික චර්යාවෙන් ද ආකල්ප සම්පත්තියෙන් ද දැනුමෙන් ද පරිපූර්ණ ශිෂ්‍ය පිරිසක් උදෙසා තම මගපෙන්වීම ලබාදීම අගය කොට සලකමි.

පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
දෙපාර්තමේන්තු ප්‍රධානී
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

## පටුන


| | පිටුව |
|---|---|
| ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය | iii |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය | iv |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| පෙරවදන | vi |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | vii |
| පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය | viii |
| විෂය මාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | ix-x |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | xi-xii |
| ජාතික අරමුණු | xiv |
| මූලික නිපුණතා | xv-xvi |
| ත්‍රිපිටක ධර්මය විෂයයේ අරමුණු | xvii |
| ත්‍රිපිටක ධර්මය 5 ශ්‍රේණිය - වාර නියමය | xviii |
| විෂය නිර්දේශය | xix-xxviii |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | xxix |
| 1 පාඩම - බුදු පියාණෝ උතුමන්ටත් උතුම් මිනිසෙකි | 1-4 |
| 2 පාඩම - බුදුරදුන් සම වන්නේ බුදුවරුන්ට පමණි | 5-7 |
| 3 පාඩම - කරුණාවෙන් සිසිල් හද ඇති බුදු සඳාණෝ | 8-10 |
| 4 පාඩම - ගුණයෙන් අගපත් අගසවු බුදුපුත් | 11-12 |
| 5 පාඩම - තෙරණින් අතර අගපත් දීපශිඛාවෝ | 13-14 |
| 6 පාඩම - බුදු සසුන් මග යති පහන් | 15-17 |
| 7 පාඩම - තල් කරටියෙන් බිඳ වැටීම (විනය) | 18-20 |
| 8 පාඩම - සාසනික පුනරුත්ථාපනය (විනය) | 21-22 |
| 9 පාඩම - අවිනිශ්චිත විනිශ්චය (අනියත) | 23-24 |
| 10 පාඩම - ත්‍රිපිටක සාහිත්‍යය | 25-26 |
| 11 පාඩම - ගිහි සමාජ සම්බන්ධතාව (සිගාල සූත්‍රය) | 27-28 |
| 12 පාඩම - ආගමික මතවාද පිළිගැනීමේ නිවැරැදි විදිය (කාලාම සූත්‍රය) | 29-30 |
| 13 පාඩම - දැහැමින් නැගෙති අදැහැමින් වැටෙති (පරාභව සූත්‍රය) | 31-32 |
| 14 පාඩම - වරදට බිය නිවනට පියවරකි (ආපත්තිභය සූත්‍රය) | 33-34 |
| 15 පාඩම - ඔබ ඔබේ රූපය හඳුනනවා ද? | 35-37 |
| 16 පාඩම - අපේ රූප විසි අටකි | 38-40 |
| 17 පාඩම - නිවනින් නිවීම | 41-43 |
| 18 පාඩම - දහසින් එකක්වත් නොවටිනා දේ | 44-45 |
| 19 පාඩම - පාපය නම් බිහිසුණුය | 46-48 |
| 20 පාඩම - ඔබ දඬුවමට බිය නම් අනුන් ද එසේ ම ය | 49-50 |
| 21 පාඩම - බෞද්ධ දර්ශනය හෙවත් විදර්ශනාව | 51-52 |
| 22 පාඩම - සිහියේ සිව්කොන (සතර සතිපට්ඨානය) | 53-54 |
| 23 පාඩම - බුදු දහමේ හේතුඵල වාදය | 55-56 |
| 24 පාඩම - කලොත් කර්මය භවය එතැනය | 57-58 |
| 25 පාඩම - බුදු දහමේ චරණය | 59-60 |
| 26 පාඩම - මිහින්තලාවයි දහම් අමාවයි | 61-62 |
| 27 පාඩම - මහතෙර සසුනෙන් බිඳී ගිය වාදය - මහායානය | 63-64 |
| 28 පාඩම - දහමත් දැන දෙසුමත් දැන දහම් දෙසමු | 65-67 |
| 29 පාඩම - රජු දැහැමි වේ නම් රට දැහැමි වේ ම ය | 68-70 |
| 30 පාඩම - දහම රකින්නා දහමින් රැකේ | 71-72 |
| තක්සේරුකරණ හැඳින්වීම | 73-74 |

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුම්වත් වීම සහ හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව ඇගයීම්වලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

### i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

### ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

### iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, ශ්වසනය නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

### iv. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

- ආර්ථික සංවර්ධනයට දායක වීම.
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

### v. ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය

### vi. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

### vii. ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

# ත්‍රිපිටක ධර්මය විෂය අරමුණු

1. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවත් ව හා යථාර්ථවාදී ව කටයුතු කරන, නිවැරැදි ප්‍රායෝගික වතාවත්වල යෙදෙන පැවිදි හා ගිහි පරපුරක් බිහි කිරීම.

2. ජීවන ගමනේ දී මුහුණපාන අභියෝග ජයගැනීමට හා නිවැරැදි යහපත් ජීවන රටාවක් ගොඩනගා ගැනීමට බුදු දහමේ මූලික ඉගැන්වීම් උපයෝගීකොට ගෙන සිව්වණක් පිරිසේ යහපත් ආදර්ශ ද එක්කොට ගත් දැහැමි පරපුරකට මඟ පෙන්වීම.

3. නිවැරැදි හා යහපත්, ආදර්ශවත්, යථාර්ථවාදී භික්ෂු ජීවිතයක් ගොඩනඟා ගැනීමට භික්ෂු විනය හා ශික්ෂාපද ප්‍රගුණ කිරීමට මඟ පෙන්වීම.

4. ත්‍රිපිටකාගත සූත්‍ර අධ්‍යයනයෙන් භික්ෂු ජීවිතය සාර්ථක කරගැනීමටත් ගිහි ජනතාවට මඟ පෙන්වීමටත් ඒ තුළින් සුපෞරුෂයක් ගොඩනඟා ගැනීමටත් මඟ පෙන්වීම.

5. ධම්මපද ගාථා අධ්‍යයන කොට ආදර්ශ සපයාගනිමින් භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීමටත්, ගිහි ජීවිත සාර්ථක කර ගැනීමට ධර්ම දේශනා කිරීමටත් මඟ පෙන්වීම.

6. ශ්‍රී ලාංකේය හා බෞද්ධ සංස්කෘතික උරුමය හැඳින ශාසනික උරුමය රැකගැනීමත්, ඒවා පවත්වා ගැනීමටත් අවශ්‍ය ආදර්ශ සපයන භික්ෂු හා ගිහි සිසු පිරිසක් බිහිකිරීම.

7. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට භාවනාව ප්‍රගුණ කිරීම සඳහා යොමු කරවීම.

8. සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කොටගෙන ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගැනීමටත්, ගිහි ජනතාවට මඟ පෙන්වීමටත් අවශ්‍ය ශක්තිය ලබාදීම.

# ත්‍රිපිටක ධර්මය - 5 ශ්‍රේණිය

## වාර නියමය

| නිපුණතා මට්ටම / පාඩම | | කාලච්ඡේද |
|---|---|---|
| 1 වාරය | 1.1 - 1 පාඩම<br>2.1 - 4 පාඩම<br>3.1 - 7, 8 පාඩම්<br>4.1 - 10, 11 පාඩම්<br>4.2 - 15 පාඩම<br>5.1 - 18 පාඩම<br>7.1 - 23 පාඩම<br>8.1 - 26 පාඩම<br>9.1 - 29 පාඩම | 60 |
| 2 වාරය | 1.2 - 2 පාඩම<br>2.1 - 5 පාඩම<br>3.1 - 9 පාඩම<br>4.1 - 12, 13 පාඩම්<br>4.2 - 16 පාඩම<br>5.1 - 19 පාඩම<br>7.2 - 24 පාඩම<br>8.2 - 27 පාඩම<br>9.2 - 30 පාඩම | 60 |
| 3 වාරය | 1.3 - 3 පාඩම<br>2.1 - 6 පාඩම<br>3.1 - 9 පාඩම<br>4.1 - 14 පාඩම<br>4.2 - 17 පාඩම<br>5.1 - 20 පාඩම<br>6.1 - 21, 22 පාඩම්<br>7.3 - 25 පාඩම<br>8.3 - 28 පාඩම | 60 |
| | | 180 |

# විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන ගුණ හැඳින, චරිතායනය කරයි. | 1.1 බුද්ධ චරිතයෙන් පැහැදිලි වන අසමසම මිනිස් ගුණ අධ්‍යයනය කර, තම ජීවිතය සාර්ථක කර ගනියි. | බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මිනිස් ගුණ. | ● බුදු රජාණන් වහන්සේගේ උත්තරීතර මිනිස් ගුණ විස්තර කරයි.<br>● බුදුරජාණන් වහන්සේ සුවිශේෂ වූ උත්තරීතර මනුෂ්‍ය ගුණයෙන් යුක්ත බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>● බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මිනිස් ගුණ වගුගත කරයි.<br>● යහපත් මිනිස් ගුණ ධර්ම ප්‍රගුණ කරයි.<br>● ආදර්ශවත් ජීවිතයක් ගත කරයි. | 05 |
| | 1.2 බුදුගුණ භික්ෂු ජීවිතයට බද්ධ කරගනිමින්, තම භික්ෂු ජීවිතය පෝෂණය කර ගනියි. | අසමසම බුදු ගුණ. (මහා සීහනාද සූත්‍රය) | ● බුදුගුණ භික්ෂු ජීවිතයට ආදර්ශ කර ගන්නා අන්දම විස්තර කරයි.<br>● බුදුගුණ භික්ෂු ජීවිතයට එක්කර ගැනීමෙන්, භික්ෂු ජීවිතය පෝෂණය වන බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>● බුද්ධ චරිතයෙහි ආදර්ශවත් බුදුගුණවලට උදාහරණ දක්වමින් ඒවා ලැයිස්තුගත කරයි.<br>● උතුම් බුදුගුණ මෙනෙහි කරයි.<br>● ආදර්ශවත් භික්ෂු ජීවිතයක් ගතකරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **1.3** බුදුගුණ භික්ෂු ජීවිතයට එකතු කරගනිමින්, ආගමික හා සාමාජික මෙහෙවරෙහි යෙදෙයි. | අසරණ සරණ ගුණය. | • බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය විස්තර කරයි.<br>• බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• බුදුරජාණන් වහන්සේගෙන් සරණ ලැබූවන්ගේ ලැයිස්තුවක් පිළියෙළ කරයි.<br>• අසරණයන්ට පිහිට වෙයි.<br>• අසරණ සරණ සේවය, ජීවිතාදර්ශයක් කොට ගනියි. | 06 |
| **2.0** භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කථා හා සිව්වනක් පිරිසෙහි චරිතාදර්ශ උපයෝග කරගනියි. | **2.1** අග්‍රශ්‍රාවක, ශ්‍රාවිකාවන් වහන්සේලාගේ චරිත අධ්‍යයනය කර, භික්ෂු ජීවිතය සාර්ථක කර ගනියි. | අග්‍රශ්‍රාවකයන් වහන්සේලා හා අග්‍රශ්‍රාවිකාවන් වහන්සේලා (සැරියුත් මහරහතන් වහන්සේ, මුගලන් මහරහතන් වහන්සේ, ඛේමා මහරහත් තෙරණිය, උප්පලවණ්ණා මහරහත් තෙරණිය) | • අග්‍රශ්‍රාවක ශ්‍රාවිකාවන් වහන්සේලාගේ චරිත කථා විස්තර කරයි.<br>• අග්‍රශ්‍රාවක ශ්‍රාවිකාවන් වහන්සේලාගේ චරිත ආදර්ශවත් බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• අග්‍රශ්‍රාවක ශ්‍රාවිකාවන් වහන්සේලාගේ චරිතවලින් තම ජීවිතය සාර්ථක කරගත හැකි අවස්ථා වගුගත කරයි.<br>• ආදර්ශවත් චරිත, චරිතායනය කරයි.<br>• ආදර්ශයෙන් කටයුතු කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **2.2** බෞද්ධ ශ්‍රාවකයන් වහන්සේලාගේ ආගමික, ශාසනික, සමාජ හා ශාස්ත්‍රීය සේවාවේ වැදගත්කම හැඳින, අර්ථාන්විතව කටයුතු කරයි. | අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමි, වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමි. | • අදාළ ශ්‍රාවකයන් වහන්සේලාගේ ආගමික, ශාසනික, සාමාජික හා ශාස්ත්‍රීය සේවාව විස්තර කරයි.<br>• අදාළ ශ්‍රාවකයන් වහන්සේලාගෙන් සිදු වූ සේවාව අර්ථවත් බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• අදාළ ශ්‍රාවකයන් වහන්සේලාගෙන් සිදු වූ ආගමික, ශාසනික, සාමාජික හා ශාස්ත්‍රීය සේවාව වෙන් වෙන් ව වගුගත කරයි.<br>• පරාර්ථ චර්යාවෙහි යෙදෙයි.<br>• අර්ථාන්විත ජීවිතයක් ගතකරයි. | 06 |
| **3.0** බෞද්ධ විනය හා ශික්ෂණ පිළිබඳ දැනුම වර්ධනය කර, භික්ෂු ජීවිතය හැඩගසා ගනියි. | **3.1** භික්ෂු ජීවිතයේ නිපුණතා සාධනයට අදාළ මූලික භික්ෂු විනය නීති අනුගමනය කරගනිමින්, තම ජීවිතය සාර්ථක කරගනියි. | භික්ෂු ප්‍රාතිමෝක්ෂය, පාරාජිකා, සංඝාදිසේස, අනියත. | • භික්ෂු ජීවිතයට අදාළ මූලික භික්ෂු විනය නීති විස්තර කරයි.<br>• භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීමට විනය නීති වැදගත් වන බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• භික්ෂු විනය නීති අතර, භික්ෂු ප්‍රාතිමෝක්ෂය, පාරාජිකා, සංඝාදිසේස, අනියත වශයෙන් වෙන් වෙන් ව වගුගත කරයි.<br>• විනයගරුක ජීවිතයක් ගතකරයි.<br>• අන් අයට ආදර්ශවත් වෙයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර, ගුණාත්මක හා සාර්ථක යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසා ගනියි. | 4.1 සූත්‍ර ධර්මයන්හි අන්තර්ගත ධර්ම කරුණු විග්‍රහ කරමින්, ආගමික හා ශාසනික මෙහෙවරෙහි යෙදෙයි. | ත්‍රිපිටක සාහිත්‍ය හැඳින්වීම, සිඟාලෝවාද සූත්‍රය, කාලාම සූත්‍රය, පරාභව සූත්‍රය, ආපත්තිභය සූත්‍රය. | • සූත්‍ර ධර්මයන්හි අන්තර්ගත දහම් කරුණු විස්තර කරයි.<br>• සූත්‍ර ධර්මයන්හි අන්තර්ගත දහම් කරුණු පිළිපැදීමෙන් මෙලොව පරලොව ජීවිතය සාර්ථක වන බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• අදාළ සූත්‍රයන්හි ඇතුළත් දහම් කරුණු වෙන් වෙන් ව වගුගත කරයි.<br>• සූත්‍ර ධර්ම අධ්‍යයනය කරයි.<br>• ධර්මානුකූල ජීවිතයක් ගතකරයි. | 32 |
| | 4.2 අභිධර්ම පිටකයට අයත් රූප හා නිබ්බාන පරමාර්ථ අධ්‍යයනය කර, ගැඹුරු අවබෝධයකින් යුතු ව කටයුතු කරයි. | රූප පරමාර්ථය, නිබ්බාන පරමාර්ථය | • අභිධර්ම පිටකයට අයත් රූප නිබ්බාන පරමාර්ථ විස්තර කරයි.<br>• රූප, නිබ්බාන පරමාර්ථ ගැඹුරින් අධ්‍යයනය කළයුතු බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• රූප හා නිබ්බාන පරමාර්ථවලට අයත් දහම් කරුණු වෙන් වෙන් ව ලැයිස්තුගත කරයි.<br>• දහම පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබයි.<br>• අවබෝධයෙන් කටයුතු කරයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **5.0** බෞද්ධ ශික්ෂා පද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබලසම්පන්න භික්ෂු චරිතයකට මග සලසා ගනියි. | **5.1** සහස්සවග්ගය, පාපවග්ගය, දණ්ඩවග්ගයන්හි ඇතුළත් ගාථාවල අර්ථ සහ දහම් කරුණු හැඳින චරිතායනයෙන් කටයුතු කරයි. | සහස්සවග්ගය, පාපවග්ගය, දණ්ඩවග්ගය | • සහස්සවග්ගය, පාපවග්ගය, දණ්ඩවග්ගය යන ගාථාවන්හි අර්ථ සහ දහම් කරුණු විස්තර කරයි.<br>• ධම්මපද ගාථාවලින් ජීවිතාදර්ශ සපයන බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• සහස්සවග්ගය, පාපවග්ගය, දණ්ඩවග්ගය යන ගාථාවන්හි අර්ථ සහ ආදර්ශ වෙන් වෙන් ව ලැයිස්තුගත කරයි.<br>• අර්ථවත් හා චරිතවත් ජීවිතයක් ගත කරයි.<br>• චරිතායනයෙන් කටයුතු කරයි. | 24 |
| **6.0** බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින් යථාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි. | **6.1** විදර්ශනා භාවනාව ප්‍රගුණ කරයි. | විදර්ශනා භාවනාව හැඳින්වීම, සතර සතිපට්ඨාන භාවනාව (මහා සතිපට්ඨාන සූත්‍රය) | • විදර්ශනා භාවනාව වඩන අයුරු විස්තර කරයි.<br>• නිර්වාණාවබෝධය පිණිස විදර්ශනාව වැඩිය යුතු බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• සතර සතිපට්ඨාන භාවනාවට අයත් දහම් කරුණු වෙන් වෙන් ව වගුගත කරයි.<br>• සතර සතිපට්ඨාන භාවනාව ප්‍රගුණ කරයි.<br>• සිහියෙන් කටයුතු කරයි. | 13 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **7.0** බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර, සත්ත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවධිකමින් යුතුව, ලෝක ධර්මතා හමුවේ නො සැලී කටයුතු කරයි. | 7.1 පටිච්ච සමුප්පාද ධර්මය අධ්‍යයනය කොට හේතුඵල සමවායෙන් යුතුව කටයුතු කරයි. | පටිච්ච සමුප්පාදය | • පටිච්ච සමුප්පාදය විස්තර කරයි.<br>• හේතුඵල දහම ලොව සනාතන දහමක් බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• පටිච්ච සමුප්පාදයට අයත් දහම් කරුණු විස්තරාත්මකව වගුගත කරයි.<br>• හේතුඵල දහමින් යුතුව කටයුතු කරයි.<br>• සත්‍යවාදී වෙයි. | 06 |
| | 7.2 බෞද්ධ කර්ම සංකල්ප විග්‍රහ කරමින්, තම ජීවිතය සාර්ථක කොට ශාසනික මෙහෙවරෙහි යෙදෙයි. | කර්මය හා පුනර්භවය | • බෞද්ධ කර්ම සංකල්පය විග්‍රහ කරයි.<br>• බෞද්ධ කර්ම සංකල්පය පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• කර්මයෙහි ප්‍රභේද වෙන් වෙන් ව වගුගත කරයි.<br>• කුසල කර්මයෙහි යෙදෙයි.<br>• ධාර්මික දිවි පෙවෙතක් ගත කරයි. | 07 |
| | 7.3 ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඉගෙන, අවබෝධයෙන් කටයුතු කරයි. | ආර්ය අෂ්ඨාංගික මාර්ගය | • ආර්ය අෂ්ඨාංගික මාර්ගය විස්තර කරයි.<br>• මධ්‍යම ප්‍රතිපදාව නිවනට මග බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• ආර්ය අෂ්ඨාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට අනුව බෙදා දක්වයි.<br>• අන්තගාමී පිළිවෙත්වලින් බැහැර වෙයි.<br>• විචාරාත්මකව කටයුතු කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 ශාසන ඉතිහාසය හැඳින, බෞද්ධ අගමික වත්පිළිවෙත් හා ඓතිහාසික උරුමය ආරක්‍ෂා කිරීමට පියවර ගනියි. | 8.1 මහින්දාගමනය සහ ශ්‍රී ලංකාවේ ශාසන ව්‍යාප්තිය හැඳින, ශාසන චිරස්ථිතිය උදෙසා කටයුතු කරයි. | මහින්දාගමනය සහ ශ්‍රී ලංකාවේ ශාසන ව්‍යාප්තිය. | • මහින්දාගමනය සහ ශ්‍රී ලංකාවේ ශාසනික ව්‍යාප්තිය විස්තර කරයි.<br>• මහින්දාගමනයෙන් ශ්‍රී ලංකාවේ ශාසනික ව්‍යාප්තිය සිදු වූ බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• මහින්දාග මනයෙන් සිදු වූ ශාසනික සේවාව ලැයිස්තුගත කරයි.<br>• අතීත උරුමයන් රැක ගනියි.<br>• ශාසනික ව්‍යාප්තියට දායක වෙයි. | 04 |
| | 8.2 භාරතීය මහායාන බුදු දහමේ ව්‍යාප්තිය හැඳින, අවබෝධයෙන් කටයුතු කරයි. | භාරතීය මහායාන බුදු දහමේ ව්‍යාප්තිය. | • භාරතීය මහායාන බුදු දහමේ ව්‍යාප්තිය විස්තර කරයි.<br>• වර්තමානයේ ද මහායාන බුදු දහම ව්‍යාප්ත වී ඇති බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• මහායාන බුදු දහමේ මූලික කරුණු ලැයිස්තුගත කරයි.<br>• ශාසනික සහයෝග යෙන් කටයුතු කරයි.<br>• එකමුතු බව රැකගනියි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **8.3** ආගමික කටයුතු පිළිබඳ අධ්‍යයනය කොට, වත් පිළිවෙත්හි නිරත වෙයි. | ධර්මදේශනා විධි (කඨිනානිසංස ධර්ම දේශනා, මතක ධර්මදේශනා, ධර්ම දේශනා) | • සුවිශේෂ ධර්මදේශනාවන්හි දේශනා විලාශයන් විස්තර කරයි.<br>• දුර්ලභ පිංකම්හි සුවිශේෂ ආනිසංස ඇති බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• විවිධ ධර්මදේශනාවන්හි දේශනා විධි ප්‍රායෝගිකව කර දක්වයි.<br>• පරාර්ථචර්යාවේ යෙදෙයි.<br>• ධර්මානුකූල ජීවිතයකට මග සලසා ගනියි. | 07 |
| **9.0** සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝග කොටගෙන, ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගනියි. | **9.1** බෞද්ධ දේශපාලනය, ආර්ථික දර්ශනය, හැඳින යහපත් පාලනයකට දායක වෙයි. | බුදු දහම හා දැහැමි රාජ්‍ය පාලනය (දස සක්විති වත්, දසරාජ ධර්ම, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු) | • දැහැමි රාජ්‍ය පාලනයට බුදු දහමින් ලැබෙන උපදෙස් විස්තර කරයි.<br>• බුදු දහමෙහි දැහැමි රාජ්‍ය ප්‍රතිපත්ති දේශනා කොට ඇති බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>• දැහැමි රාජ්‍ය ප්‍රතිපත්ති වෙන් වෙන් ව වගුගත කරයි.<br>• දැහැමි රාජ්‍ය පාලනයකට දායක වෙයි.<br>• දැහැමි දිවිපෙවෙතක් ගතකරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **9.2** බෞද්ධ ආර්ථික දර්ශනය හැඳින, නිවැරැදි ආර්ථික ප්‍රතිපත්තියකට දායක වෙයි. | බෞද්ධ ආර්ථික ප්‍රතිපත්ති (චක්කවත්ති සීහනාද සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය) | ● බෞද්ධ ආර්ථික දර්ශනය විස්තර කරයි.<br>● බුදු දහම තුළ නිවැරැදි ආර්ථික දර්ශනයක් දේශනා කොට ඇති බව පිළිගෙන ප්‍රකාශ කරයි.<br>● බෞද්ධ ආර්ථික දර්ශනය දේශනා කොට ඇති සූත්‍ර අන්තර්ගතයන් වෙන් වෙන් ව විස්තර කරයි.<br>● නිවැරැදි ආර්ථික දර්ශනයෙන් කටයුතු කරයි.<br>● යහපත් රැකියාවන්හි නිරත වෙයි. | 04 |

* කාලච්ඡේද වෙන්කර ගැනීමේදී විෂය නිර්දේශයේ සිදු කර ඇති සංශෝධන පිළිබඳ සැලකිලිමත් වන්න.

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 1 පාඩම

## බුදු පියාණෝ උතුමන්ටත් උතුම් මිනිසෙකි

**01. නිපුණතාව :- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන් ගුණ හැඳින, චරිතායනය කරයි.

**02. නිපුණතා මට්ටම :- 1.1**

- බුද්ධ චරිතයෙන් පැහැදිලි වන අසමසම මිනිස් ගුණ අධ්‍යයනය කර, තම ජීවිතය සාර්ථක කරගනියි.

**03. කාලපරිච්ඡේද :-** 05 යි.

**04. ඉගෙනුම් පල :-**

- ලොව පහළ වූ මහා කරුණාවේ හා මහා ප්‍රඥාවේ ප්‍රතිමූර්තිය සම්මා සම්බුදුරජාණන් වහන්සේ බව පැහැදිලි කරයි.
- බුදුරජාණන් වහන්සේ සුවිශේෂ වූ උත්තරීතර මනුෂ්‍ය ගුණයෙන් යුක්ත බව පිළිගනිමින් කතා කරයි.
- බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මිනිස් ගුණ පිළිබඳ ලේඛනයක් සකසයි.
- යහපත් මිනිස් ගුණ ධර්ම ප්‍රගුණ කරමින් ආදර්ශවත් ජීවිතයක් ගත කරයි.
- වැරැදි බහුල සමාජයක ඉන් මිදී යහපත වෙනුවෙන් කටයුතු කරමින් චරිත පාරිශුද්ධිය රැක ගැනීම සඳහා කටයුතු කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- පෙළ පොතෙහි සඳහන් "බුදුපියාණෝ උතුමන්ටත් උතුම් මිනිසෙකි." යන පළමු වන පාඩම හොඳින් කියවා පාඩමෙහි සඳහන් බුද්ධ චරිත කොටස අධ්‍යයනය කරමින් යහපත් දරුවකු තුළ පැවතිය යුතු ලක්ෂණ 5ක් ලියාගෙන පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- "බුදුරජාණන් වහන්සේගේ උතුම් මිනිස් පිහිට ලද පුද්ගලයන් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න. බුද්ධ චරිතයෙන් ගත හැකි ආදර්ශ පිළිබඳ අදහස් ලබා ගනිමින් පාඩමට ප්‍රවේශ වන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලච්ඡේද පහකට පාඩම වෙන්කර ගන්න.
- බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මිනිස් ගුණ පැහැදිලි කරන්න.

- ලොව පහළ වූ මහා කරුණාවේ හා මහා ප්‍රඥාවේ ප්‍රතිමූර්තිය සම්මා සම්බුදුරජාණන් වහන්සේ බව පෙන්වා දෙන්න.
- සියලු ලෝක සත්ත්වයන්ට යහපත සැලසූ බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ අප ජීවිතය සකස් කර ගැනීමට වැදගත් වන බව පැහැදිලි කරන්න.
- බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යයෙකු වශයෙන් ඉපිද විඳිය යුතු සැප හා දුක් විඳ සිත උසස් ම තත්ත්වයට දියුණු කළ බව විස්තර කරන්න.
- සත්ත්වයා හා ලෝකය පිළිබඳ යථා තත්ත්වය මැනවින් වටහාගෙන සියලු ධර්මයන් අවබෝධ කරගත් බැවින් සම්මා සම්බුද්ධ නම් වන බව පැහැදිලි කරන්න.
- සිය සංඛතා ධර්මය අවබෝධ කළේ ය, අවබෝධ කරයි, අවබෝධ කරන්නේ ය. (සබ්බේ සංඛථා සංඛත ධම්මේ අබුජ්ඣි, බුජ්ඣති බුජ්ඣිස්සතීති බුද්ධො) යන අරුතින් බුද්ධ නම් වන බවත් හා එය තමා විසින් මැනවින් සිදු කළ බැවින් සම්මා සම්බුද්ධ නම් වන බවත් විස්තර කරන්න.
- මිනිසුන් අතර උපන්නත් බුදුරජාණන් වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයෙකු නොව උත්තරීතර මනුෂ්‍යයෙක් බව පෙන්වා දෙන්න.
- බුදුරජාණන් වහන්සේ සාමාන්‍ය මිනිසුන්ට සමාන කළ නොහැකි බවත් සමාන කළ හැක්කේ තවත් බුදුරජාණන් වහන්සේ නමකට පමණක් බවත් එබැවින් උන්වහන්සේ අසම සම වන බවත් විස්තර කරන්න.
- උන්වහන්සේලා තුළ පවතින කරුණාව, දයාව, අනුකම්පාව, මෛත්‍රිය, පරාර්ථ චරියාව, නිහතමානී බව, ඉවසීම, කළගුණ සැළකීම, සමානාත්මතාව උතුම් මානුෂීය ගුණාංග බව සාකච්ඡා කරන්න.
- අනුන්ගේ දුක දැක ගුණභරිත හදවතක් ඇති අයකු තුළ ඇති වන දයානුකම්පාව කරුණාව බව පෙන්වා දෙන්න.
- බුදුරජාණන් වහන්සේ ලෝක සත්ත්වයා වෙත සමසිතින් ක්‍රියා කරමින් දක්වන අසීමිත වූ කරුණාව මහා කරුණාව බව ප්‍රකට කරන්න.
- සසරෙහි වෛර බැඳ නොයෙක් උවදුරු පැමිණ වූ දේවදත්ත තෙරුන්ටත්, නාලාගිරි ඇතාටත්, ගුරුවරයා නිසා නොමග ගොස් තමන් පසුපස එළවා පැමිණි අංගුලිමාලටත්, ගිහි කල තම පුතණුවන් වූ රාහුල කුමරුටත් සම සිතින් ක්‍රියා කළ බව පෙන්වා දෙන්න.
- හිමිදිරි පාන්දර බුදු රජාණන් වහන්සේ දින චර්යාව ආරම්භ කරමින් සසර දුකට පත් ව සිටින සත්ත්වයා පිළිබඳ විමසා බලා පිහිටවීමට බුදුවරයකු තුළ ඇතිවන අනුකම්පාව මහා කරුණාව බව පෙන්වා දෙන්න.
- සුනීත, සෝපාක, රජ්ජුමාලා, කිසාගෝතමී, මට්ටකුණ්ඩලී, පූතිගත්තතිස්ස තෙරුන්, හත්ථාලවක කුමරු, කෙත පාළු වූ ගොවියා, හදවතිකා ඇතින්න ආදීන්ගේ කථා පුවත් මගින් මෙම ගුණය පිළිබිඹු වන බව පැහැදිලි කරන්න.
- මුළු මහත් බුද්ධ චරිතය පුරා ම මෙම ගුණය පිළිබිඹු වන බව පෙන්වා දෙන්න.
- බුදුරජාණන් වහන්සේ නිහතමානී නායකයෙක් බව පැහැදිලි කරන්න.
- නිහතමානී බව යනු මානය සම්පූර්ණයෙන් බැහැර කිරීම බව පෙන්වා දෙන්න.
- බුදු, පසේබුදු, මහරහත් යන උතුමන් නිහමානී ගුණයෙන් යුතු බව පෙන්වා දෙන්න.
- බුද්ධ චරිතයෙන් නිහතමානී ගුණ ප්‍රකට වන අවස්ථා විස්තර කරන්න.
- බුද්ධත්වය අවබෝධ කරගැනීමෙන් ධර්මය ගුරු තනතුරේ තබාගැනීම, දානය සඳහා රජ මාලිගයටත්, දුගී පැල්පතටත් කිසිදු භේදයකින් තොරව වැඩම කිරීම නිහතමානී ගුණය බව ප්‍රකට කරන්න.
- තාදි ගුණයෙහි ඇති විශේෂතා පෙන්වා දෙන්න.

- බුදුරජාණන් වහන්සේ අටලෝ දහමින් කම්පා නොවී ලෝක ධර්මතා විෂයයෙහි අකම්පිතව සියල්ල උපේක්ෂාවෙන් විඳදරා ගැනීමේ හැකියාව තාදී ගුණය බව ප්‍රකට කරන්න.
- කොසොල් මහරජතුමාගේ අසදෘශ මහා දානය මෙන් ම දුගී දුප්පත් දාසදාසීන් වෙතින් ලැබුණු රළු ආහාර දානය ද ඉවසීමෙන් තාදී ගුණය හෙළිවන බව ප්‍රකට කරන්න.
- සේල නැමැති බමුණු පඬිවරුන්ගෙන් ද කොසොල් ආදි මහ රජවරුන්ගෙන් ද අනේපිඬු වැනි සිටුවරුන්ගෙන් ද උපාලි වැනි ගෘහපතීන්ගෙන් ද දිව්‍ය බ්‍රහ්ම ආදි විවිධ පිරිස්වලින් ද ප්‍රශංසා මෙන් ම යසස ලැබුණ ද නොසැලුණු බව පෙන්වා දෙන්න.
- අග්ගික භාරද්වාජ, අක්කෝසක භාරද්වාජ වැනි බ්‍රාහ්මණයන්ගෙන්ද මාගන්දිය, චිංචාමානවිකා, සුන්දරී පරිබ්‍රාජිකාව, සුප්පබුද්ධ, දේවදත්ත වැන්නන්ගේ ද ආක්‍රොෂ පරිභව, නින්දා සහ අපහාස ලැබුණ ද එමඟින් නොසැලුණු බව විස්තර කරන්න.
- උදය නම් බමුණාගේ ආරාධනයෙන් දොළොස්වන වස් කාලය වෙරඤ්ජාව නම් ප්‍රදේශයේ ගත කරමින් සිදු වූ අපහසුතාව මැදහත් සිතින් ඉවසමින් කටයුතු කිරීම තාදී ගුණය ප්‍රකට වන බව සාකච්ඡා කරන්න.
- අපගේ ජීවිතවල සාර්ථකත්වයට ඉහත කී උතුම් බුදු ගුණය ආදර්ශ කොටගත හැකි බව පෙන්වා දෙන්න.
- ශාස්තෘවරු අතරින් බුදුරජාණන් වහන්සේගේ අසහාය ශාස්තෘත්වය ප්‍රකට කරන්න.
- ශ්‍රාවකයන්ට නිවැරැදි මග පෙන්වමින් ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකත්වය සැපයීම ගුරුවරයාගේ වගකීම බව ප්‍රකට කරන්න.
- මංගල සූත්‍රය, පරාභව සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ් සූත්‍රය, වේලුද්වාර සූත්‍රය හා සිඟාලෝවාද සූත්‍රය වැනි සූත්‍ර දේශනාවන්ගෙන් පැහැදිලි වන්නේ මිනිසාගේ ලෞකික ජීවිතය සාර්ථකව පවත්වා ගැනීමේත්, ධනයෙන් පොහොසත් වීමේත්, ගුණධර්මවලින් පොහොසත් වීමේත් මග බව පෙන්වා දෙන්න.
- ධනයෙන් බලයෙන් පිරිපුන් රජවරුන්ට මෙන්ම ඒකසාටක වැනි බමුණන්ටත්, දුගී දුප්පත් ජනතාවටත්, මිනිස් ගුණ දහමින් තොර තිරිසන් ජීවිත ගත කරන පිරිසට හා සත්ත්වයන්ට මෙන්ම  අංගුලිමාල වැනි පුද්ගලයන්ට ද පිහිට වෙමින් නිවැරැදි මගපෙන් වූ බව ප්‍රකට කරන්න.
- "තුම්හෙහි කිච්චමාතප්පං, අක්ඛාතාරො තථාගතා" යන පාඨය කටපාඩම් කරගන්නා ලෙසට උපදෙස් දෙන්න.
- නිරහංකාර පුද්ගලයන්ට ද, අග්ගික භාරද්වාජ සුන්දරී භාරද්වාජ වැනි පුද්ගලයන්ට, සුනීත සෝපාක වැනි කුල වාදයෙන් පීඩාවට පත් පුද්ගලයන්ට මෙන්ම සමාජයේ සියලු දෙනාට බුදුරජාණන් වහන්සේ නිවැරැදි මගපෙන් වූ අයුරු සාකච්ඡා කරන්න.
- ශාස්තෘවරු අතරින් බුදුරජාණන් වහන්සේ උත්තරීතර සමාජ දාර්ශනිකයාණෝ බව පැහැදිලි කර දෙන්න.
- බුදුරජාණන් වහන්සේ සමාජයේ පහළ වූ ශ්‍රේෂ්ඨතම සමාජ දාර්ශනිකයා බව පැහැදිලි කරන්න.
- "න ජච්චා වසලො හොති, න ජච්චා හොති බ්‍රාහ්මණො" යන ගාථාව කටපාඩම් කරගන්නා ලෙසට උපදෙස් දෙන්න.
- බුදුරජාණන්වහවහන්සේ සියලු අසාධාරණ සමාජ බේදීම් ප්‍රතික්ෂේප කරමින් සියල්ලන්ට මානව හිතවාදී ව කටයුතු කළ අයුරු පහදා දෙන්න.
- විමුක්තිය ඇත්තේ තමා තුළ මිස දෙවියන් තුළ හෝ වෙනත් කිසිවකු තුළ නොවන බව පෙන්වා දෙමින් මිථ්‍යා විශ්වාස පිළිබඳව පැවැති ආකල්පය වෙනස් කළ අයුරු සාකච්ඡා කරන්න.

- බුදුරජාණන් වහන්සේ කාන්තාවගේ වටිනාකම් පෙන්වා දී කාන්තා නිදහස අගය කළ අයුරු පෙන්වා දෙන්න.
- භික්ෂුණී ශාසනයේ ආරම්භය පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- බෞද්ධ දර්ශනය සියලු ම ශ්‍රාවකයන්ට විමසා බලා අනුගමනය කිරීමට අවස්ථාව ලබා දුන් අයුරු පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ශාස්තෘවරයෙකු තුළ පැවතිය යුතු ගුණාංග මොනවාද යන්න විමසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කර ගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළගා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- කරුණාව :- "පරදුක්ඛේ සති සාධූනං හදය කම්පනං කරෝතීති කරුණා" (අනුන්ගේ දුකෙහි දී සත්පුරුෂයන්ගේ හදවතෙහි ඇති කරන කම්පනය කරුණාව යි.) "අහිත දුක්ඛාපනයනකාමතා කරුණා" (අන්‍යයන්ගේ දුක් කරදර නැති කිරීමේ කැමැත්ත කරුණාව යි.) "කිණාති වා පරදුක්ඛං හිංසති විනාසේතීති කරුණා" (අන්‍යයන්ගේ දුක් විනාශ කිරීම කරුණාව යි.)
- මානය :- ජාතිය, කුලය, ධනය, තනතුරු, උගත්කම, රූපය ආදී කරුණු සලකමින් මැනබැලීම
- සෙය්‍ය මාන :- අනුන්ට වඩා තමා උසස් යැයි සිතීම
- සදිස මාන, :- අනුන් හා තමා නිතර ම සමාන කරමින් මැනීම
- හීන මාන :- තමා පහත් කර නිතර සිතීම
- මානය :- තුදුස් අකුසලයන්ගෙන් එකකි.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ පළමුවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- බුද්ධ චරිතයෙන් ඉගෙන ගත් යහපුරුදු පන්තියට ඉදිරිපත් කිරීම.
- "බුද්ධ චරිතය ආදර්ශ කර ගනිමින් යහපත් දරුවකු තුළ පැවතිය යුතු ලක්ෂණ " යන මාතෘකාව යටතේ උපදෙස් පත්‍රිකාවක් සකස් කිරීම.
- දෛනික වශයෙන් සිදු කරන යහපුරුදු ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- අංගුත්තර නිකාය, III. ද්‍රෝණ සූත්‍රය, 364 පිටුව (2005) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පුනර් මුද්‍රණය.
- ඛුද්දක නිකාය, ධම්මපදය මග්ගවග්ගය, (2005) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පුනර් මුද්‍රණය.
- ධම්මපද-අට්ඨකථාව
- සු.නි., වසල සූත්‍රය, 42 පිට

# 2 පාඩම

# බුදුරදුන් සමවන්නේ බුදුවරුන්ට පමණි

**01. නිපුණතාව :- 1.0**

- සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සංවර්ධනය උදේසා බෞද්ධ ඉගැන්වීම් උපයෝග කොටගෙන, ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 1.2**

- බෞද්ධ, දේශපාලනය, ආර්ථික දර්ශනය, හැඳින යහපත් පාලනයකට දායක වෙයි.

**03. කාලපරිච්ඡේද :-** 08 යි.

**04. ඉගෙනුම් පල :-**

- බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති මොනවාද යන්න පැහැදිලි කරයි.
- නායකත්ව අවස්ථාවන්ට මුහුණ දීමේ දී බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ගුරු කොට ගත හැකි බව පෙන්වාදෙයි.
- දස සක්විති වත්, දස රාජ ධර්ම, සප්ත අපරිහානිය ධර්ම, සතර සංග්‍රහ වස්තු ලැයිස්තුගත කරයි.
- නිවැරැදි නායකත්ව ලක්ෂණවලට ගරු කරයි.
- දෛනික ක්‍රියාකාරකම්හි දී නායකත්ව ලක්ෂණ පෙන්වයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- පෙළ පොතෙහි සඳහන් බුදුරදුන් සමවන්නේ බුදුවරුන්ට පමණි යන 02 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

චක්කවරංකිත රත්තසුපාදෝ
ලක්ඛණමණ්ඩිත ආයතපණ්හි
චාමරඡත්ත විභූසිත පාදෝ
ඒස හි තුය්හපිතා නරසීහො

යන ගාථාව පළමුකොට සිසුන් සමග සජ්ඣායනා කරන්න. දෙවනුව මෙහි ඇතුළත් මහාපුරුෂ ලක්ෂණ, පෙන්වා දෙමින් සාකච්ඡාව මෙහෙය වන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලච්ඡේද අටකට පාඩම වෙන්කර ගන්න.
- බුදුරජාණන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ දීඝ නිකායේ ලක්ඛණ සූත්‍රයේ සඳහන්ව ඇති බව සාකච්ඡා කරන්න.

- සම්මා සම්බුදුරජාණන් වහන්සේ අසමසම ගුණයන්ගෙන් යුක්ත බව පැහැදිලි කරන්න.
- දෙතිස් මහා පුරුෂ ලක්ෂණ පිළිබඳව පැහැදිලි කරමින් බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂත්වය පැහැදිලි කරන්න.
- බුදුරජාණන්වහන්සේ සතු අසීති අනුව්‍යඤ්ජන මොනවාද යන්න සාකච්ඡා කරන්න.
- බුදුරජාණන් වහන්සේගේ වාග් විලාසයෙහි සුවිශේෂත්වය සාකච්ඡා කරන්න.
- දුරවබෝධ වචනවල අර්ථ අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- බුදුරජාණන් වහන්සේ තුළ පැවති "ඤාණ" පිළිබඳ සාකච්ඡා කරන්න.
- "නත්ථි තස්ස භගවතො අඤ්ඤාතං අදිට්ඨං" යන ගාථා පාඨය කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.
- බුදු රජාණන් වහන්සේ තුළ පැවති ඤාණාධිගමයන් මහාසීහනාද සූත්‍රයේ ඇති බව පෙන්වා දෙන්න.
- බුදුරජාණන් වහන්සේ අසම සම වන්නේ උන්වහන්සේ තුළ පැවති ඤාණයන් නිසා බව ප්‍රකට කරන්න.
- බුදු රජාණන් වහන්සේ සතු දසබල ඤාණයන් අර්ථය නිවැරැදිව පැහැදිලි කර දෙන්න.
- කාරණය, කාරණය වශයෙන් ද, අකාරණය, අකාරණය වශයෙන් ද දන්නා ඤාණය 'ඨානඅට්ඨානඤාණය' බව පැහැදිලි කරන්න.
- අතීත, අනාගත සහ වර්තමාන කර්ම සමාදානයන්ගේ විපාක ප්‍රත්‍ය වශයෙන්, හේතු වශයෙන් තත් වූ පරිදි දන්නා ඤාණය 'කම්මවිපාකඤාණය' බව විස්තර කරන්න.
- නිරයාදී හැම තැන්හි ම යන්නා වූ සර්වත්‍රගාමිණී ප්‍රතිපදාව තතුසේ දන්නා ඤාණය 'සබ්බත්ථගාමිනීපටිපදාඤාණය' බව විස්තර කරන්න.
- නොයෙක් ධාතු නොයෙක් ධාතු ලෝක තතු සේ දන්නා ඤාණය 'අනෙක ධාතු නානා ලෝකධාතු ඤාණය' බව පෙන්වා දෙන්න.
- සත්ත්වයන්ගේ නොයෙක් ප්‍රාර්ථනා හෙවත් අධිමුක්තීන් තතු සේ දන්නා ඤාණය 'නානාධිමුත්තිකතාඤාණය' බව විස්තර කරන්න.
- සත්ත්වයන්ගේ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්හි වෘද්ධිය හා හානිය තතු සේ දන්නා ඤාණය 'ඉන්ද්‍රියපරෝපරියත්තඤාණය' බව විස්තර කරන්න.
- ධ්‍යාන විමෝක්ෂ, සමාධි, සමාපත්තීන්ගේ කෙලෙසීම, පිරිසිදු වීම, නැඟී සිටීම තතු සේ දන්නා (ඣානවිමොකඛ සමාධිසමාපතීනං සංකි ලසං වොදානං වුට් ඨානං යථාභතු තං පජානාති) ඤාණය 'ඣානාදි සංකිලේස ඤාණය' බව විස්තර කරන්න.
- නොයෙක් ආකාර වූ කල්ප ගණන් දුර පූර්වජාති සිහි කිරීම නම් වූ ඤාණය 'පුබ්බෙනිවාසානුස්සතිඤාණය' බව පෙන්වා දෙන්න.
- කාය, වාක්, මනෝ දුශ්චරිතයෙන් යුතු සත්ත්වයන් මරණයෙන් පසු දුගතියට යාමත්, කාය, වාක්, මනෝ, සුචරිතවත් සත්ත්වයන් මරණයෙන් පසු සුගතියට යාමත් යනාදි වශයෙන් මැරෙන, උපදින, හීනප්‍රණීත, සුගතිගාමී දුගතිගාමී, සත්ත්වයන් දැන හඳුනාගන්නා වූ මිනිස් ඇස ඉක්මවා සිටින ඤාණය 'දිබ්බචක්ඛු ඤාණය හෙවත් චුතුපපාතඤාණය' බව පෙන්වා දෙන්න.
- ආශ්‍රවයන් ක්ෂය වීමෙන් ආශ්‍රව නැති චේතෝ විමුක්තයින් ප්‍රඥාවිමුක්ත මෙලොව දී ම තමා ම දැන ප්‍රත්‍යක්ෂ කළ ඤාණය 'ආසවක්ඛයඤාණය' බව විස්තර කර දෙන්න.
- ඇත් කුල දහයෙහි (10) උපමා ආශ්‍රය කරගනිමින් බුදුරජාණන් වහන්සේ තුළ පැවති කාය බලය නිවැරැදිව පෙන්වා දෙන්න.
- "කළාවකඤ්ච ගංගෙය්‍යං" යන ගාථාව කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.
- බුදුරජාණන් වහන්සේ සතු වූ සිව් විසාරද ඤාණය විස්තර කර දෙන්න.

- බුදුරජාණන් වහන්සේගේ ෂඩ් අසාධාරණ ඥානයන් පැහැදිලි කරන්න.
- බුදුරජාණන් වහන්සේගේ ත්‍රි විද්‍යා ඥාන විස්තර කරන්න.
- බුදුරජාණන් වහන්සේගේ අෂ්ට විද්‍යා ඥාන විස්තර කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- අසීති අනුව්‍යඤ්ජන - අසූ දෙකක් වූ අනු ලක්ෂණ
- දෙතිස් මහා පුරුෂ ලක්ෂණ - තිස් දෙකක් වූ මහා පුරුෂ ලක්ෂණ

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ දෙවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- තමා තුළ නායකත්ව ලක්ෂණ ගොඩනගා ගැනීමේ දී බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ඉවහල් කර ගත හැකි අන්දම පෙන්වා දීම.
- නිවස තුළ ද නිවැරැදි නායකත්වයක් ගොඩනැගීමෙන් දියුණුව සැලසෙන අයුරු පෙන්වා දීම
- අදාළ ගාථා කටපාඩමෙන් පවසමින් එහි අදහස ඉදිරිපත් කිරීම.
- බුදුරජාණන් වහන්සේ තුළ පැවැති මහා ඥාණ විස්තර කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- දී.නි. I,අම්බට්ඨ සූත්‍රය, 150 පිටුව.
- දී.නි. III, ලක්ඛණ සූත්‍රය, 235 පිටුව
- දී.නි. I, තේවිජ්ජ සූත්‍රය, 594 පිටුව.

# 3 පාඩම

## කරුණාවෙන් සිසිල් හද ඇති බුදු සඳාණෝ

**01. නිපුණතාව :- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන් ගුණ හැඳින, චරිතායනය කරයි.

**02. නිපුණතා මට්ටම :- 1.3**

- බුදුගුණ භික්ෂු ජීවිතයට එකතු කර ගනිමින්, ආගමික හා සාමාජික මෙහෙවරෙහි යෙදෙයි.

**03. කාලපරිච්ඡේද :-** 06 යි.

**04. ඉගෙනුම් පල :-**

- බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය විස්තර කරයි.
- බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය පිළිගනිමින් අන්අයට පිහිට වෙයි.
- බුදුරජාණන් වහන්සේගෙන් සරණ ලැබූවන්ගේ ලැයිස්තුවක් පිළියෙල කරයි.
- අසරණයන්ට පිහිට වෙයි.
- අසරණ සරණ සේවය, ජීවිතාදර්ශයක් කොට ගනියි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- පෙළ පොතෙහි සඳහන් "කරුණාවෙන් සිසිල් හද ඇති බුදුසඳාණෝ" යන තුන් වන පාඩම හොඳින් කියවා පාඩමෙහි සඳහන් අන්‍යයන්ට පිහිට වූ අයුරු අධ්‍යයනය කර පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- බුදුන් වහන්සේ අසරණයන්ට පිහිට වූ අයුරු පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවමින් සුනීත, සෝපාක, රජ්ජුමාලා ආදී උදාහරණ ඉස්මතු කර පාඩමට ප්‍රවේශ වන්න.
- බුද්ධ චරිතයෙන් ගත හැකි චරිතාදර්ශ ඉස්මතු කර පන්තියට ඉදිරිපත් කරන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලච්ඡේද පහකට පාඩම වෙන්කර ගන්න.
- බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මිනිස් ගුණ පැහැදිලි කරන්න.
- බුදුරජාණන් වහන්සේ සියලු සත්ත්වයන්ට පිහිට වෙමින් යහමග කියාදුන් අයුරු පෙන්වා දෙන්න.
- ජාති ආගම් භේදයකින් තොරව සියලුදෙනාට නිවැරැදි මග පෙන්වීම සිදුකළ අයුරු විස්තර කරන්න.
- කායික හා මානසික පීඩාවන්ගෙන් පෙලුණු පුද්ගලයන්ට බෞද්ධ දර්ශනයෙන් මගපෙන් වූ අයුරු විස්තර කරන්න.

- බුදුන් වහන්සේගේ අසරණ සරණ ගුණයට හිමිවන ස්ථානය පෙන්වා දෙන්න.
- බුදුන් වහන්සේගේ නිවැරැදි මඟ පෙන්වීම මත ජීවිතය සාර්ථක කරගත් පුද්ගලයන්ගේ ලැයිස්තුවක් නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.
- සත්ත්වයන් නිවැරැදි මාර්ගයට ගැනීමට බුදුරජාණන් වහන්සේ කළ කැපකිරීම සාකච්ඡා කරන්න.
- "යො සාගරෙ ජලධිකං රුධිරං අදාසි" යන ගාථාව කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.
- අසරණයන්ට පිහිට වූ අයුරු ඇතුළත් කථා පුවත් පැහැදිලි කරන්න.
- සුනීත සැඩොල් පුතු යන කථා පුවත පැහැදිලි කරමින් ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න.
- දෙව්ලොව උපන් සැඩොල් ස්ත්‍රිය යන කථා පුවත පැහැදිලි කරමින් එයින් ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න.
- මළකඳක බැඳ සිටි සෝපාක  කථා පුවත පැහැදිලි කරමින් එයින් ගත හැකි ආදර්ශ පෙන්වා දෙන්න.
- බුදුරජාණන් වහන්සේ තිරිසන් සත්ත්වයන්ටත් පිහිට වූ අයුරු භද්‍රවතිකා ඇතින්නගේ කථා පුවතින් පැහැදිලි කරන්න.
- "ජිගච්ඡා පරමා රෝගා" යන ගාථාව හා එහි අර්ථය කටපාඩම් කරගැනීමට උපදෙස් දෙමින් "බණ ඇසුමට ගොස් ආහාර ලැබූ දුප්පතා" යන කථා පුවත පැහැදිලි කරමින් ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න.
- සොවන් වූ පේසකාර දුව යන කථා පුවත පැහැදිලි කරමින් ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න.
- රජ්ජුමාලා මෙහෙකාරිය යන කථා පුවත පැහැදිලි කරමින් ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න.
- තිස්ස භික්ෂුව යන කථා පුවත පැහැදිලි කරමින් ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න.
- උදරාබාධයෙන් පෙළුණු භික්ෂුව යන කථා පුවත පැහැදිලි කරමින් ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න.
- බුදුන් වහන්සේගේ අසරණ සරණ වීමේදී භාවිත කළ ප්‍රායෝගික ක්‍රම පැහැදිලි කරමින් ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න.
- දුරවබෝධ වචනවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකතු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- සැඩොල්-බුද්ධ කාලීන සමාජයේ පැවති පංචම කුලයට අයත් හීන කුලයක්.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ තුන්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- අසරණ සරණ සේවය, ජීවිතාදර්ශයක් කොට ගත් අයුරු පන්තියට ඉදිරිපත් කිරීම
- බුද්ධ චරිතයෙන් ඉගෙන ගත් අසරණ සරණ ගුණය ඇතුළත් යහපුරුදු පන්තියට ඉදිරිපත් කිරීම.
- "බුද්ධ චරිතයෙන් අසරණ සරණ ගුණයන් අදර්ශකර ගනිමින් යහපත් දරුවකු තුළ පැවතිය යුතු ලක්ෂණ" යන මාතෘකාව යටතේ උපදෙස් පත්‍රිකාවක් සකස් කිරීම.

- දෛනික වශයෙන් සිදු කරන යහපුරුදු ඇතුළත් කිරීමට පොත් පිංචක් නිර්මාණය කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-


- විමානවත්ථු පාළි (2005) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පුනර් මුද්‍රණය.
- ඛුද්දක නිකාය, ධම්මපදය, සුඛ වග්ගය, (2005) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පුනර් මුද්‍රණය.
- ඛුද්දක නිකාය, ථෙරගාථා පාළි, (2005) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පුනර් මුද්‍රණය.

# 4 පාඩම
## ගුණයෙන් අගපත් අගසවු බුදුපුත්

**01. නිපුණතාව :- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කථා හා සිව්වනක් පිරිසේ චරිතාදර්ශ උපයෝග කර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 2.1**

- අග්‍රශ්‍රාවක ශ්‍රාවිකාවන් වහන්සේලාගේ චරිත අධ්‍යයනය කර, භික්ෂු ජීවිතය සාර්ථක කර ගනියි.

**03. කාලපරිච්ඡේද :-** 04 යි

**04. ඉගෙනුම් පල :-**

- සැරියුත්, මුගලන් මහරහතන් වහන්සේලාගේ චරිත කථා ගෙනහැර දක්වයි.
- උන්වහන්සේලාගේ චරිතවලින් ජීවිතාදර්ශ ලැබිය හැකි බව පිළිගනිමින් කටයුතු කරයි.
- සැරියත් මුගලන් මහරහතන් වහන්සේලාගේ චරිතයන්හි වැදගත් සිදුවීම් හා ආදර්ශ, වගුගත කරයි.
- ආදර්ශවත් පුද්ගලයන්ට ගරු බුහුමන් දක්වයි.
- සත්පුරුෂ ලක්ෂණ ප්‍රදර්ශනය කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- පෙළ පොතෙහි හතර වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- දුකේදී සැපේදී පිහිටවන, හොඳ ගුණ ධර්ම කියාදෙන, ධර්මයට මග පෙන්වීම යනාදී යහපතෙහි යොදවන ඔබගේ මිත්‍රයකු ඔබට සිටී ද යන්නත්, අපේ බෞද්ධ සාහිත්‍යයේ සඳහන් එවන් කල්‍යාන මිතුරන් දෙදෙනෙකු වන සැරියුත් මුගලන් මහරහතන්වහන්සේ පිළිබඳ හඳුන්වා දෙමින් පාඩමට ප්‍රවේශ වන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලා ගෞතම බුදුරජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවක තනතුරු හෙබ වූ ශ්‍රාවකයන් වහන්සේලා බව පැහැදිලි කරන්න.
- කළණ මිතුරන් වූ දෙදෙනා ගිහි අවධියේ සිටම අන් අයට ආදර්ශවත් වූ බව පැහැදිලි කරන්න.
- උපතිස්ස කෝලිත නම් වූ මිතුරන් දෙදෙනා ගිරග්ග සමජ්ජ නම් වූ සැණකෙළිය නරඹා ජීවිතයේ හරය සෙවීමට තීරණය කළ බව පැහැදිලි කරන්න.

- සත්‍ය අවබෝධයට අස්සජි තෙරුන් ඔවුනට මගපෙන් වූ බව පැහැදිලි කරන්න.
- "යෙ ධම්මා හෙතුප්පභවා, තෙසං හෙතුං තථාගතො ආහ" යන ගාථාව කටපාඩම් කරගන්නා ලෙස උපදෙස් දෙන්න.
- කෝලිත පිරිවැජියා ද පසුව උපතිස්ස පිරිවැජියාගෙන් එම ගාථා ධර්මය අසා සෝවන් වූ බව පෙන්වා දෙන්න.
- සැරියුත් තෙරුන් සිය ගුරු ගෞරවය ඉහළින් පිළිබිඹු කළ අවස්ථා විස්තර කරන්න.
- "යො මෙ ආචරියො ආසි - අස්සජි නාම සාවකො" යන ගාථාව කටපාඩම් කරගන්නා ලෙස උපදෙස් දෙන්න.
- සත්හැවිරිදි සාමණේර නමක් පෙන්වා දුන් වරද පිළිගැනීම මගින් සැරියුත් තෙරුන් නිහතමානී ගුණය ප්‍රකට කළ බව පැහැදිලි කරන්න.
- "තදහු පබ්බජිතො සන්තො, ජාතියා සත්තවස්සිකො" යන ගාථාව කටපාඩම් කරගන්නා ලෙස උපදෙස් දෙන්න.
- ගුරු ගෞරවය, නිහතමානී බව, අන් අය පහදවා ගැනීම, විචාරශීලී බව, ඉවසීම, නොමගට ගිය අය සුමගට ගැනීම ආදිය ද මෙම චරිතවලින් මූර්තිමත් වන බව පෙන්වා දෙන්න.
- දකුණත් සව් තනතුර, ප්‍රඥාවන්ත භික්ෂූන් අතර අග්‍රස්ථානය හා ධර්ම සේනාධිපති තනතුර සැරියුත් මා හිමියන් දැරූ බව විස්තර කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- අග්‍රශ්‍රාවක - ප්‍රධාන ශ්‍රාවකයන්

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඉහත ගාථා ලියන ලද පුවරු.
- පෙළ පොතේ හතරවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේලාට සංඝ සමාජය තුළ සුවිශේෂී තැනක් හිමි වන බව ප්‍රකට කරන්න.
- අගසව් චරිතයන්ගෙන් ලබා ගත හැකි ජීවිතාදර්ශ ඉදිරිපත් කරන්න.
- අදාළ ගාථා කටපාඩමෙන් පවසමින් එහි අදහස ඉදිරිපත් කරන්න.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- තෙසඤ්ච යො නිරොධො, එවං වාදී මහාසමණො (අපදාන පාළි, 01 සාරිපුත්තත් ථෙර අපදානය, 285 ගාථාව, 44 පිටුව)
- යස්සං දිසායං වසති - උස්සීසම්හි කරොමහං (අපදාන පාළි, 1 සාරිපුත්තත් ථෙර අපදානය, 369 ගාථාව, 54 පිටුව)
- සොපි මං අනුසාසෙය්‍ය, සම්පටිච්ඡාමි මත්ථකෙ (මිලින්දපඤ්හ පාළි ගොරුපඬිග පඤ්හො)

# 5 පාඩම

## තෙරණින් අතර අගපත් දීපශිඛාවෝ

**01. නිපුණතාව :- 5.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කථා හා සිව්වනක් පිරිසේ භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කථා හා සිව්වනක් පිරිසේ චරිතාදර්ශ උපයෝග කර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 2.1**

- අග්‍රශ්‍රාවක ශ්‍රාවිකාවන් වහන්සේලාගේ චරිත අධ්‍යයනය කර, භික්ෂු ජීවිතය සාර්ථක කර ගනියි.

**03. කාලපරිච්ඡේද :-** 06 යි.

**04. ඉගෙනුම් පල :-**

- ඛේමා මහරහත් තෙරණියගේ චරිතයෙන් පිළිබිඹු වන ප්‍රඥා සම්පන්න බව ප්‍රකාශ කරයි.
- උප්පලවණ්ණා මහරහත් තෙරණියගේ චරිතයෙන් ගත හැකි ආදාර්ශ වගු ගත කරයි.
- ආදර්ශවත් චරිත, චරිතායනය කරයි.
- ජීවිතාවබෝධයෙන් කටයුතු කරයි.
- දැහැමි ජීවිතයක් ගත කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- පෙළ පොතෙහි සඳහන් තෙරණින් අතර අගපත් දීපශිඛාවෝ යන 05 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- බුදුසසුනේ ශ්‍රාවක ශ්‍රාවිකාවන් අතරින් ප්‍රඥාසම්පන්න බවින් හා සෘද්ධිමත් බවින් යුතු වූ භික්ෂුණීන් බුදු සසුනේ චිරස්ථිතිය උදෙසා සිදුකළ මෙහෙවර ඇගයීමට ලක්කරමින් සාකච්ඡාව මෙහෙය වන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- ඛේමා තෙරණිය නොයෙක් බුදුවරුන්ගේ ශාසන තුළ මහදන් පවත්වමින් සසර සැරිසැරූ අයුරු විස්තර කරන්න.
- භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදී මහා සංඝරත්නයට මහදන් පැවැත් වූ බව පැහැදිලි කරන්න.
- පදුමුත්තර බුදුරජාණන් වහන්සේ යම් භික්ෂුණියකට අගතනතුරු ප්‍රදානය කරනු දැක මම ද බුදු කෙනකුන් වහන්සේ හමුවේ එම තනතුරු ලබන්නේ යැයි ප්‍රාර්ථනා කළ අයුරු පැහැදිලි කරන්න.

- බිම්බිසාර රජුගේ අගබිසව වූ බව පැහැදිලි කරන්න.
- ඛේමා බිසවට බුදුන් වහන්සේ දෘශ්‍යාධාර භාවිත කොට රූපයේ යථා තත්ත්වය අවබෝධ කරදුන් බව පැහැදිලි කරන්න.
- මහා නිදාන සූත්‍රය' ඇසීමෙන් සෝවන් පලයට පත් වූ බව විස්තර කර දෙන්න.
- බිම්බිසාර මහජතුමාගේ අවසරය ද ලබා පසු කලෙක ශාසනයේ පැවිදි ව කොසොල් රජතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට දක්ෂ ලෙසින් පිළිතුරු ලබා දුන් බවත් ප්‍රඥාසම්පන්න භික්ෂුණීන් අතරින් ඛේමා රහත් තෙරණිය අග්‍ර වූ බවත් විස්තර කරන්න.
- උප්පලවණ්ණා මහරහත් තෙරණියගේ ජීවිත කථාව විස්තර කර දෙන්න.
- නොයෙක් ආත්ම භවයන්හි උත්පත්තිය ලබමින් බුදුසසුනේ දියුණුවට කටයුතු කළ ආකාරය පෙන්වා දෙන්න.
- නොයෙක් ආත්ම භවයන්හි උත්පත්තිය ලබමින් ඒ ඒ රජවරුන්ගේ අගමෙහෙසිය වූ බව ද විස්තර කරන්න.
- නොයෙක් ආත්ම භාවවල උප්පත්තිය ලබමින් පසේ බුදුරජාණන් වහන්සේලාට ද දන් පිළිගැන් වූ බව සාකච්ඡා කරන්න.
- ගෞතම බුදුරජාණන් වහන්සේගේ සමයේ සැවැත් නුවර එක්තරා සිටු කුලයක උපන් බව විස්තර කරන්න.
- පූර්ව ප්‍රාර්ථනාවන් අනුව නිල් මානෙල් මල් හා සමානව ඇස් ලැබූ බවත් එම නිසාම උප්පලවණ්ණා යන නම් ලැබූ බවත් විස්තර කරන්න.
- පහන් දැල්ල අරමුණු කරගෙන තේජෝ කසිණයට සමවැදී ධ්‍යාන උපදවාගෙන රහත් භාවයට පත් වූ බව සාකච්ඡා කරන්න.
- ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමේ භික්ෂුණීන් අතර අග්‍රස්ථානයට පත් වූ බව සාකච්ඡා කරන්න.
- මාර දිව්‍ය පුත්‍රයා සමග පැවති සංවාදය සංයුක්ත නිකායේ උප්පලවණ්ණා සූත්‍රයේ සඳහන් බව එහි සූත්‍ර ඇසුරින් සාකච්ඡා කරන්න.
- කාමයන්ගේ ආදීනව ප්‍රකාශ කළ බවත් පෙර ආත්මයක කාමය නිසා විඳින්නට වූ දුක් ගැහැට නිසා කාමය පිළිබඳ කළකිරුණු බව උප්පලවණ්ණා ථෙරීගාථාවේ සඳහන් බව පෙන්වා දෙන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- සිවුපිළිසිඹියා :- අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ පස්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- ඛේමා තෙරණිය හා උප්පලවණ්ණා තෙරණියගේ ජීවිතයන් තුළින් ගත හැකි ආදර්ශ පිළිබඳ කථාවක් කරන්න.
- කාමයෙහි ආදීනව පිළිබඳ ලියා දක්වන්න.
- ථෙරී ගාථා කටපාඩමෙන් පවසමින් එහි අදහස ඉදිරිපත් කරන්න.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ථෙරීගාථා පාළි, උප්පලවණ්ණා ථෙරීගාථා

# 6 පාඩම

## බුදු සසුන් මග යති පහන්

**01. නිපුණතාව :- 5.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කථා හා සිව්වනක් පිරිසේ චරිතාදර්ශ උපයෝග කර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 2.2**

- බෞද්ධ ශ්‍රාවකයන් වහන්සේලාගේ ආගමික, ශාසනික, සමාජ හා ශාස්ත්‍රීය සේවාවේ වැදගත්කම හැඳින අර්ථාන්විතව කටයුතු කරයි.

**03. කාලපරිච්ඡේද :-** 06 යි.

**04. ඉගෙනුම් පල :-**

- වැලිවිට සංඝරාජ මාහිමියන්ගෙන් හා අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමිගෙන් සිදු වූ සමාජ මෙහෙවර පැහැදිලි කරයි.
- මෙම චරිතවලින් ජීවිතාදර්ශ ලැබිය හැකි බව පිළිගනිමින් කටයුතු කරයි.
- මෙම චරිතවලට ආරෝපණය වී කථා කරයි.
- ආදර්ශවත් චරිත පිළිබඳ සොයා බලයි.
- අභිමානයක් ඇති කර ගත හැකි පරිදි තම චරිතය සංවර්ධනය කර ගනියි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- පෙළ පොතෙහි සඳහන් "බුදු සසුන්මග යති පහන්" යන හය වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් ව දැනුවත් කරන්න.

**II** ප්‍රවේශය

- සරණංකර සංඝරාජ මාහිමි හා අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමිගෙන් ශාසනික හා ජාතික වශයෙන් මහත් මෙහෙවරක් කළ බවත්
- වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමි නූතන ශාසනික හා ශාස්ත්‍රීය පුනරුදයට පුරෝගාමී වූ බවත්
- අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමි වැදගත් ශාස්ත්‍රීය කාර්ය භාරයක් ඉටු කළ බවත් මෙවැනි ශ්‍රේෂ්ඨ චරිත ඇසුරින් ජීවිතාදර්ශ බොහෝමයක් අපට ලබාගත හැකි බව ප්‍රකාශ කරමින් පාඩමට ප්‍රවේශ වන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන් ගිලිහී ගිය ශාසනික ප්‍රබෝධය නැවත ඇති කිරීමට උද්යෝගිමත්ව ධර්ම ශාස්ත්‍රීය කටයුතු සිදු කිරීමට පුරෝගාමී වූ බව පැහැදිලි කර දෙන්න.

- වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිගෙන් සිදු වූ උදාර ආගමික හා ශාසනික මෙහෙවර පැහැදිලි කරන්න. (සිල්වත් සමාගම ආරම්භ කිරීම, පරිහානියට පත්ව තිබූ උපසම්පදාව ප්‍රතිෂ්ඨාපනය කිරීම, ශාස්ත්‍රීය පොත පත රචනා කිරීම)
- සියල්ලන්ට ආදර්ශ ලබා දෙමින් ධර්ම ශාස්ත්‍රීය ප්‍රබෝධයක් ඇති කිරීමට පෙර තමන් වහන්සේ අධ්‍යාපනය ලබාගත් බව පෙන්වා දෙන්න.
- නොයෙක් ග්‍රන්ථ රචනා කරමින් නැති වී ගිය අධ්‍යාපනය නැවත නගා සිටුවීම සඳහා ක්‍රියා කළ බව පැහැදිලි කරන්න.
- සියම් දේශයෙන් උපසම්පදාව මෙරටට ගෙන මෙරට උපසම්පදාව නැවත ආරම්භ කිරීමට පුරෝගාමී වූ අයුරු පැහැදිලි කරන්න.
- "මෙබඳු සිත් ඉපදී" යන කවිය කටපාඩම් කරගැනීමට උපදෙස් දෙන්න.
- තමන්වහන්සේට පළමුව උපසම්පදාව ලැබීමට අවස්ථාව උදා වුවද ගුරු තන්හි තබා ගැනීම සඳහා වැඩිමහල් භික්ෂුවක් උපසම්පදා කළ අයුරු පැහැදිලි කර දෙන්න.
- උන්වහන්සේගේ නිහතමානී ගුණය ප්‍රකට කර දෙන්න.
- විශාල ග්‍රන්ථ රාශියක් සම්පාදනය කළ බව පැහැදිලි කර දෙන්න.
- ශාසන පුනරුදය උදෙසා විශාල භික්ෂු පිරිසක් මෙන්ම ගිහි ශිෂ්‍ය පරපුරක් නිර්මාණය කළ බව පැහැදිලි කර දෙන්න.
- වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිගේ චරිතයෙන් ජීවිතාදර්ශ රැසක් ලබා ගත හැකි බව පෙන්වා දෙන්න.
- අටුවා යනු බුද්ධභාෂිත ධර්මයෙහි දුරවබෝධ වචන නිරවුල් කර ගැනීම සඳහා රචනා කරන ලද රචනා බව පැහැදිලි කරන්න.
- හෙළ බසින් තිබූ අටුවාවන් පෙළ බසට පරිවර්තනය කිරීමේදී පුරෝගාමී වූ බව පැහැදිලි කරන්න.
- සිංහල භාෂාවෙන් පැවති අටුවාවන් පාළියට පරිවර්තනය කිරීම බුදුදහමේ අභිවෘද්ධියට හේතුවන බව සිතූ රේවත හිමියන්, උන්වහන්සේ ලක්දිවට එවූ බව මහාවංසයේ සඳහන් වන බව පැහැදිලි කරන්න.
- ලක්දිවට පැමිණීමට පෙරත් උන්වහන්සේ අටුවා රචනා කළ බව පැහැදිලි කරන්න
- සර්වාස්තිවාදී ශ්‍රාවකයෙකු වී පසුව ථේරවාදී බුදුදහම වැළඳගත් බව පෙන්වා දෙන්න
- මහානාම රජදවස ලක්දිවට වැඩම කළ බව පැහැදිලි කරන්න.
- බුද්ධඝෝෂ හිමියන් පිළිබඳ තොරතුරු මහාවංසයේ 37වන පරිච්ඡේදයේ 216 වන ගාථාවේ සිට 240 වල සඳහන් බව පැහැදිලි කර දෙන්න.
- "බොධිමණ්ඩ සමීපම්හි" යන ගාථා කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.
- අටුවා ලිවීමට පෙර බුද්ධඝෝෂ හිමියන්ගේ ඒ පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා සංයුත්ත නිකායේ සගාථක වර්ගයේ දේවතා සංයුත්තයේ ගාථාවක් බව පැහැදැලි කරන්න.
- "අන්තොජටා බහිජටා - ජටාය ජටිතා පජා" යන ගාථා කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.
- "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො - චිත්තං පඤ්ඤඤ්ච භාවයං" ගාථාව කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- හිරි - පවු කිරීමට ඇති ලැජ්ජාව
- සොළොස් - දහසය
- පහන් මනසින් - පැහැදුණු සිතින්

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඉහත ගාථාවන් ලියන ලද පුවරු.
- පෙළ පොත හයවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- ශාසනික ආගමික සේවයට සුවිශේෂී මෙහෙයක් කළ බව ප්‍රකට කරන්න.
- චරිතවලින් ලබා ගත හැකි ජීවිතාදර්ශ ඉදිරිපත් කරන්න.
- අදාළ ගාථා කටපාඩමෙන් ඉදිරිපත් කරන්න.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- විසුද්ධි මාර්ගය ප්‍රස්ථාවනාව
- සමන්ත පාසාදිකා විනය අටුවාව
- සංඝරාජ සාධු චරිතය

# 7 පාඩම

## තල් කරටියේ බිඳ වැටීම (විනය)

**01. නිපුණතාව :- 3.0**

- බෞද්ධ විනය හා ශික්ෂණ පිළිබඳ දැනුම වර්ධනය කර, භික්ෂු ජීවිතය හැඩගසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 3.1**

- භික්ෂු ජීවිතයේ නිපුණතා සාධනයට අදාළ මූලික භික්ෂු විනය නීති අනුගමනය කරගනිමින්, තම ජීවතය සාර්ථක කර ගනියි.

**03. කාලපරිච්ඡේද :-** 05 යි.

**04. ඉගෙනුම් පල :-**

- සතර පාරාජිකා නම්කර, කටපාඩමින් කියමින් අර්ථ පැහැදිලි කරයි.
- සතර පාරාජිකා කඩවීමෙන් උපසම්පදාව නැතිවෙන බව පිළිගනියි.
- පාරාජිකා කඩ කිරීමෙන් තමාගෙන් සංස්ථාවට වන හානිය සලකා ලජ්ජාශීලී වෙයි.
- සතර පාරාජිකාවලට හසුවන කාරණාවලදී ඇවතට බිය ඇති නීති ගරුක භික්ෂුවක් වශයෙන් ක්‍රියා කරයි.
- තමා සංඝසමාජයේ ආදර්ශවත් චරිතයක් වීමේ අධිෂ්ඨානයෙන් කටයුතු කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- පළමුවෙනි පාරාජිකාව කටපාඩම් කරගෙන ඒමට දැනුම් දෙන්න. (මෙය ගුරුවරයා විසින් පෙර දැනුම් දෙන ලද කුමක් හෝ විය හැකිය. මෙහි ඇත්තේ ආදර්ශයක් පමණි)

**II** ප්‍රවේශය

- හොඳින් වැඩුණු තල් ගසක හෝ පොල් ගසක රූපයක් සහ කරටිය කැඩුණු එවැනි ගසකම රූපයක් ප්‍රදර්ශනය කොට සිසුන්ගෙන් ප්‍රශ්න කරන්න. කරටිය කැඩුණු පොල් ගසක් නැවත නොවැඩෙන බවත්, එසේම පාරාජිකාව යනු භික්ෂුවකගේ උපසම්පදාවේ අවසානය බවත් පවසන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සාමණේර සීලයත්, උපසම්පදා සීලයත් අතර ඇති පරතරය පිළිබඳ සාමාන්‍ය හැඳින්වීමක් කරන්න.
- වරදේ බරපතල කම් අනුව ශික්ෂාපද ස්කන්ධ 07 කට බෙදා ඇති බව පහදා දෙන්න. එහිදී ඒ ආපත්තිස්කන්ධ හත පිළිබඳ පරිවාර පාළියේ එන පහත සඳහන් හැඳින්වීම් උපයෝගී කරගෙන විස්තර කිරීම සුදුසුය.

01. පාරාජිකා - මෙම ශික්ෂා පද උල්ලංඝනය කිරීමෙන් සාසනයෙන් පැරදී චුතවන්නේ ය. ලිහෙන්නේ ය. දුරුවන්නේ ය. උන්වහන්සේ සමග සංඝයාගේ පොහෝ කිරීම් පවාරණාදී සංඝ කර්ම කිරීමක් නැත යන මේ කාරණා නිසා පාරාජිකා යැයි කියනු ලැබේ.

02. සංඝාදිසේස - මෙම ඇවැත් කඩ වූ විට ඒ සඳහා පිළියම් වශයෙන් පිරිවෙස් දීම, මූලාය පටිකස්සන හෙවත් අවශ්‍ය වූ විට පිරිවෙස් මුලට ඇදීම, මානත් දීම අබ්භාන කර්මය යන සියල්ල සංඝයා ම කරන හෙයින් ද මේ ආකාරයෙන් එම විනය කර්මයේ මුල මැද අග යන තුන් තැනම සංඝයාගේ මුල් වීම අවශ්‍ය වන හෙයින් ද සංඝාදිසේස යැයි කියනු ලැබේ.

03. ථුල්ලච්චය - තවත් භික්ෂුවක් ලඟ දේශනාවෙන් පිරිසිදු කරගන්නා ඇවැත් අතර ලොකු ම ඇවැත්ය යන අර්ථයෙන් ථුල්ලච්චය යැයි කියනු ලැබේ. ථුල්ලච්චය කියා වෙනම ඇවැත් වර්ගයක් නැත. පාරාජිකා ආදී ඇවතකදී එම ඇවත සිදු නොවී ඊට ආසන්න බරපතල වරදක් සිදු කිරීම ථුල්ලච්චය නමින් සැලකේ. ඒවා එම ශික්ෂා පද පිළිබඳ අතිරේක පැනවීම්වල දී බුදුරදුන් විසින් ම නියම කර තිබේ. උදාහරණයක් ලෙස තුන්වෙනි පාරාජිකාවේ දී කෙනෙකු වැටී මැරීම සඳහා කෙනෙක් වලක් කපයි. ඒ තැනැත්තා  එහි වැටී මළහොත් පාරාජිකා වෙයි. නොමැරී දුක් වේදනාවට පත් වුවහොත් ථුල්ලච්චය වෙයි.

04. පාචිත්තිය - කුසල් සිත පහත හෙළන බැවින් ද ආර්ය මාර්ගය වරද්දන බැවින් ද සිත මුලා වීමට හේතුවන බැවින් ද පාචිත්තිය යැයි කියනු ලැබේ.

05. පාටිදේසනීය - කෙනෙකුගෙන් ආහාර ලබා ගෙන වැළඳීමේ දී සිදුවන ගැරහිය යුතු වැරැදි හතරක් පාටිදේසනීය නමින් හැඳින් වෙයි.

06. දුක්කට - කරන ලද නරක දෙයක්, වරදවා කරන ලද දෙයක් ප්‍රමාද දෝෂයක් දුක්කට නම් වෙයි. ඒ සඳහා ද වෙනම ඇවැත් නැත. එහි දී ද ඇවතක් සිදු නොවී එම වරදට අදාළ සුළු ක්‍රියාවක් දුක්කට නම් වෙයි. උදාහරණයක් ලෙස  කෙනෙකු නසන්නට වලක් කැපූ විට ඒ තැනැත්තා එහි නොවැටුණත් ඔහුට හානියක් නොවුණත් වල කැපූ හෙයින් දුක්කට වෙයි.

07. දුබ්භාසිත - කියන නරක දේවල්, කිලිටි වචන, අසභ්‍ය වචන දුබ්භාසිත නම් වෙයි. ඒ සඳහා ද වෙනම ශික්ෂාපද නැත. බොරුවක් කේලමක් පරුෂ වචනයක් නොවුනත් කෙනෙකුගේ සිත රිදෙන කෙනෙකු අප්‍රිය කරන වචනයක් දුබ්භාසිතයක් විය හැකිය.

- පාරාජිකා සතර අර්ථ සහිතව වනපොත් කරවන්න.
- එවායේ විවරණ කොටසේ ඇති විශේෂ පදවල අර්ථ හොඳින් පැහැදිලි කර දෙන්න.
- එම ඇවැත් පැනවීමට හේතු වූයේ ඇයි ද යන්න නිදාන කථා ආශ්‍රයෙන් පහදා දෙන්න.
- පාරාජිකා ආපත්තියකට පත්වීමේ බරපතලකම සහ එවැන්නකට පත් වූ පුද්ගලයෙකු සම්බන්ධයෙන් පිළිපැදිය යුතු ක්‍රියාමාර්ගය කුමක් දැයි පහදා දෙන්න.
- පාරාජිකා පාළි පොත පන්තියට ගෙන අවුත් මේ ශික්ෂාපදවල ප්‍රඥප්ති අනුප්‍රඥප්ති දුක්කට ථුල්ලච්චය යන කරුණු මේ මේවා යැයි පෙන්වාදීමේ පාඩමක් කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරන්න.

### 07. මූලික වදන් හා සංකල්ප :-

- ආභිසමාචාරික - උසස් හැසිරීමට අයත්, ඛන්ධකයන්හි (චුල්ලවග්ගපාලි, මහාවග්ග පාලි) දක්වෙන වුත් සියල්ල
- ආදි බ්‍රහ්මචරියක ශික්ෂාපද - උභතො විභංගයෙහි (පාරාජිකාපාලි, පාචිත්තියපාලි) එන ශිෂ්‍යාපද සමූහය
- පාරාජිකා - පැවිදි බව සහමුලින් ම නැතිවන කරුණු සතරකි.
- උපසම්පදාවෙන් ඉවත් වන බව නිසි පරිදි දැනුම් නොදී ගිහියෙක් වී මේ වැරැදි සිදු කළත් පාරාජිකා වන බවත් ඔහුටත් නැවත උපසම්පදා වීමට අවසරයක් නැති බවත් පහදා දෙන්න.

### 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ හත්වන පාඩම
- පාරාජිකා පාළි, පාචිත්තිය පාළි, කලු ලැල්ල,
- ගුරු මාර්ගෝපදේශය

### 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- සතර පාරාජිකා නිවැරැදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් කීම
- පාරාජිකාවල අර්ථ සරලව පැහැදිලි කිරීම.
- නිදාන කථාව පැහැදිලිව, සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම.

### 10. වැඩිදුර පරිශීලනයට :-

- චන්ද විමල මහා නාහිමි, රේරුකානේ, උපසම්පදා ශීලය.
- පරිවාර පාළි 2 කාණ්ඩය 102 පිටුව
- පාරාජිකා පාළි

### 11. ඇමුණුම 1 :-

- කරටිය ඇති තල් ගසක හෝ පොල් ගසක ඡාය රූපය  සහ එවැනිම කරටිය නැති ගසක ඡායා රූපයක්.

# 8 පාඩම

## සාසනික පුනරුත්ථාපනය (විනය)

**01. නිපුණතාව :- 3.0**

- බෞද්ධ විනය හා ශික්ෂණ පිළිබඳ දැනුම වර්ධනයකර, භික්ෂු ජීවිතය හැඩගසාගනියි.

**02. නිපුණතා මට්ටම :- 3.1**

- භික්ෂු ජීවිතයේ නිපුණතා සාධනයට අදාළ මූලික භික්ෂු විනය නීති අනුගමනය කරගනිමින්, තම ජීවිතය සාර්ථක කරගනියි.

**03. කාලපරිච්ඡේද :-** 16 යි.

**04. ඉගෙනුම් පල :-**

- සංඝාදිසේස දහතුන නම් කරයි. එකින් එක වරද කුමක්දැයි සැකෙවින් කියයි.
- සංඝාදිසේසාපත්ති පාරාජිකා තරමට ම ප්‍රවේශම් විය යුතු වැරැදි බව පිළිගනියි.
- සංඝාදිසේසාපත්තියක් සිදුවී වසන් කරගෙන සිටි කාලයේ පමණට පරිවාස කාලය දික්වෙන හෙයින් ඇවතක් සිදු වුණු සැණින් ඇවැත් දෙසා ගනියි.
- සංඝාදිසේසාපත්තිවලට බියෙන් බ්‍රහ්මචරියාව කෙළෙසෙන පැවිද්දන්ට නුසුදුසු ක්‍රියාවලින් වැළකී සිටියි.
- සංඝාදිසේස ආපත්ති පාඩමට ගෙන චරිතවත්, තම පිරිසට හිතවත්, කීකරු භික්ෂු ජීවිතයත් ගත කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- ප්‍රථම සංඝාදිසේසාපත්ති කටපාඩම් කරගෙන ඒමට දැනුම් දෙන්න. (මෙසේ මේ පාඩමට අදාළ සෑම කාලච්ඡේදයකට ම සංඝාදිසේස පාඩම් කර ගෙන ඒම පෙර සූදානම ලෙස දැනුවත් කරන්න)

II ප්‍රවේශය

- විදුලිබල මණ්ඩලයෙන් සපයන විදුලිය භාවිත කරන කෙනෙක් බිල් නොගෙවීම නිසා හෝ නීති විරෝධී අයුතු ලෙස විදුලිය භාවිත කිරීම නිසා හෝ විදුලිබල මණ්ඩලය විසින් විදුලි බලය විසන්ධි කරනු ලැබේ. ඔහුට නැවත විදුලි බලය ලබා ගත හැක්කේ බිල් ගෙවීමෙන් හෝ වරදට දඩ හෝ දඬුවම් විඳීමෙන් පසුවය. මේ ආකාරයෙන්ම සංඝාදිසේස නම් වූ බරපතල ඇවතට පත් වූ කෙනෙකුගේ ශාසනික අයිතිවාසිකම් සංඝයාවිසින් තාවකාලිකව අත් හිටවනු ලැබේ. නැවත ඔහු ප්‍රකෘති භික්ෂුවක් ලෙස සංඝ සම්මුතියෙන් පිළිගැනෙන්නේ එම වරද පිළිගෙන ඊට නියමිත පරිවාස හා මානත් යන දඬුවම් කාලය සම්පූර්ණ කිරීමෙන් පසුව බව පැහැදිලි කරමින් පාඩමට ප්‍රවේශ වන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- සංඝාදිසේසාපත්ති, පාරාජිකා හතර මෙන් උපසම්පදාව නැතිවෙන වැරැදි නොවූවත් තාවකාලිකව උසම්පදා භික්ෂු වරප්‍රසාද අහිමි වන තරම් ගරුකාපත්ති හෙවත් බරපතල වැරැදි බව පහදා දෙන්න.
- සංඝයාගෙන් වෙන් කොට පිරිවෙස් පිරීමට නියම කිරීම, දිනපතා පිරිවෙස් පුරන බවට කරන ආරෝචනය පිළිගැනීම, මානත් දීම සහ අබ්භාන විනය කර්මය මගින් නැවත සංඝයා අතරට ගැනීම යන මුල මැද අග අවස්ථා තුනටම සංඝයා මුල්වන බැවින් මේවා සංඝාදිසේස නම් වන බව පහදා දෙන්න.
- පාඩමට නියමිත කාලච්ඡේද ප්‍රමාණය අනුව සංඝාදිසේස බෙදාගෙන කට පාඩම් ගැනීම සහ අර්ථ පාඩම් ගැනීම කරන්න.
- සෑම සංඝාදිසේසයකදීම ප්‍රඥප්තිය අනු ප්‍රඥප්තිය සහ නිදාන කථාව පැහැදිලි කරදෙන්න.
- පළමු සංඝාදිසේස පහෙන් අදාළ වන්නේ භික්ෂුවගේ බ්‍රහ්මචාරී ගුණයටයි. හීන වූ ග්‍රාම්‍ය වූ එබඳු ගිහි කාමුක ක්‍රියාවන්ගෙන් භික්ෂුවක් අනිවාර්යයෙන්ම දුරු විය යුතුබව එම ශික්ෂාපදවල දී අවධාරණය කරන්න.
- කුටිකාර ශික්ෂා පදවලින් අදහස් කෙරෙන්නේ භික්ෂුවක් තම හිතුමතේ ගොඩනැගිලි හදාගෙන ජීවත් වන්නෙක් නොවිය යුතු බව යැයි පහදා දෙන්න.
- සංඝභේද සහ දුබ්බච ශික්ෂාවලින් භික්ෂුවක් තම පිරිසට එරෙහි වීම හා පිරිස භේද කිරීම, කොතරම් බරපතල වරදක් දැයි ප්‍රකාශ වන බව පහදන්න.
- කුලදූසක ශික්ෂා පදයෙන් කියවෙන්නේ සැදැහැ ඇති දායකයන්ගේ ශ්‍රද්ධාව පලුදු කිරීම මහණකමට හානිවන බරපතල වරදක්ය යන්න වටහා දෙන්න.
- සංඝාදිසේසාපත්තියට කළ යුතු පිළියම් ආපත්තිභය සූත්‍රය (14) පාඩමේ එයි. එය ඇසුරු කරගෙන ඒ පිළිබඳ පැහැදිලි කර දෙන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- සංඝාදිසේස - ගරුකාපත්ති

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ අටවන පාඩම, කලු ලෑල්ල
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- සෑම කාලච්ඡේදයක් අවසානයේ දී ම එදිනට නියමිත සංඝාදිසේස පෙළ පාඩමේ තිබේ දැයි බැලීම.
- ඒ ඒ සංඝාදිසේසවලට අයත් නිදාන කථා මතක තිබීම සහ සැකෙවින් ඉදිරිපත් කිරීම.
- එක් එක් සංඝාදිසේසයකට අදාළ ප්‍රභේද හෝ අතිරේක විස්තර කොතෙක් දුරට දැන සිටී දැයි විමසීමේ ක්‍රියාකාරකම්වල යෙද වීම.
- සංඝාදිසේස පිළිවෙළින් නම් කොට ඒවායින් සිදුවන වරද කුමක් දැයි ලියා දැක්වීම.
- සියලු සංඝාදිසේස වරද හා වරද කළ පුද්ගල වශයෙන් වගුවක් සකස් කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- චන්ද විමල මහා නාහිමි, රේරුකානේ, උපසම්පදා ශීලය

# 9 පාඩම

## අවිනිශ්චිත විනිශ්චය (අනියත)

**01. නිපුණතාව :- 3.0**

- බෞද්ධ විනය හා ශික්ෂණ පිළිබඳ දැනුම වර්ධනය කර, භික්ෂු ජීවිතය හැඩගසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 3.1**

- භික්ෂු ජීවිතයේ නිපුණතා සාධනයට අදාළ මූලික භික්ෂු විනය නීති අනුගමනය කරගනිමින්, තම ජීවිතය සාර්ථක කරගනියි.

**03. කාලපරිච්ඡේද :-** 04 යි.

**04. ඉගෙනුම් පල :-**

- අනියත ශික්ෂාපද දෙක මොනවාදැයි අර්ථ සහිතව නම් කරයි.
- අනියත ශික්ෂාවන්ගෙන් චෝදනා ලැබීමකින් ශික්ෂාපද කඩවන බව පිළිගනියි.
- මෙම චෝදනාව සැදැහැවත් උවැසියක විසින් කළ යුතුබව පිළිගනියි.
- අනියත ශික්ෂාවන්ගෙන් චෝදනා නොලබා නීතිගරුක භික්ෂුවක් වශයෙන් ක්‍රියා කරයි.
- සැකය මත කෙරෙන චෝදනාවක් හෙයින් සැක ඇතිවෙන එවැනි දෙයින් වළකියි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- අනියත ශික්ෂාපද දෙක හොඳින් කියවා ඒමට උපදෙස් දෙන්න.

II ප්‍රවේශය

- "වුද්ධිහෙසා මහා රාජ, අරියස්ස විනයේ යො අච්චයං අච්චයතො දිස්වා යථා ධම්මං පටිකරොති, ආයතිං සංවරං ආපජ්ජති (දී.නි. සාමඤ්ඤඵල සූත්‍රය) මහ රජ යම් කෙනෙක් වරද වරද වශයෙන් දැක එයට සුදුසු පරිදි පිළියම් කරයි නම් නැවත එම වරද නොකරමියි. ආයති සංවරයෙහි පිහිටයි නම් එය මෙම සාසනයෙහි දියුණුවයි" යන පාඨය සඳහන් පුවරුවක් පන්තියේ ප්‍රදර්ශනය කොට වරද පිළිගැනීම මේ හා ඊට හිමි දඬුවම බාර ගැනීමේ අගය පැහැදිලි කරමින් පාඩමට ප්‍රවේශ වෙන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- අනියත ශික්ෂා පෙළ පන්තියේ සාමූහිකව සජ්ඣායනය කරන්න.
- ශික්ෂාපදවල අර්ථ පැහැදිලි කර දී ශික්ෂාපද දෙක අතර ඇති වෙනස ශිෂ්‍ය අවධානයට යොමු කරන්න.
- අනියත ශික්ෂාපදවලට අදාළ අවස්ථාවක දී භික්ෂුවගෙන් වූ ඇවත කුමක්දැයි නියම කළ හැක්කේ එම භික්ෂුව වරද පිළිගන්නේ නම් පමණි. එහෙයින් වරද පිළිගැනීමේ සාසනික වටිනාකම පැහැදිලි කර දෙන්න.

- සද්ධෙය්‍යවචසා උපාසිකා යන නියමය අනුව එම චෝදනාව කළ හැක්කේ සිල්වත් ගුණවත් සැදැහැ ඇති උපාසකයෙකුට හෝ උපාසිකාවකට පමණි. ඒ අනුව මෙයින් කෙනෙකුට ද්වේෂ සහගත සිතින් හෝ අපහාස කරන සිතින් චෝදනා කිරීමට ඉඩක් නොමැති බව පැහැදිලි කර දිය යුතුය.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- අනියත - නියත නොවන වැරදි
- සද්ධෙය්‍යවචසා උපාසිකා - ඇදහිය යුතු බස් ඇති උපාසිකාව

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළපොතේ නවවන පාඩම,
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- අනිය ශික්ෂාපද නිවැරැදිව සජ්ඣායන කිරීම.
- අනියත ශික්ෂාපද දෙක අතර වෙනස දැක්වීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ප්‍රාතිමෝක්ෂ විවරණය, ධම්මපරායන හිමි, බූජ්ජම්පොල.

# 10 පාඩම
## ත්‍රිපිටක සාහිත්‍යය

**01. නිපුණතාව :- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර ගුණාත්මක හා සාර්ථක යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මඟ සලසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 4.1**

- සූත්‍ර ධර්මයන්හි අන්තර්ගත ධර්ම කරුණු විග්‍රහ කරමින් ආගමික හා ශාසනික මෙහෙවරෙහි යෙදෙයි.

**03. කාලපරිච්ඡේද :-** 04 යි.

**04. ඉගෙනුම් පල :-**

- පෙළ, අටුවා, ටීකා, ටිප්පණි, සන්න, ගැටපද වශයෙන් බෞද්ධ සාහිත්‍යයේ ගැඹුරු බව හා පුළුල් බව හඳුනාගෙන ධර්ම ගෞරවය ඇතිකර ගනියි.
- විනය, සූත්‍ර, අභිධර්ම යන ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථාවලිය හා සංක්ෂිප්ත අන්තර්ගතය පිළිබඳ අවබෝධයක් ඇති කර ගනියි.
- ත්‍රිපිටකයේ පෞරාණික නාමකරණ දැන බෞද්ධ සාහිත්‍යයේ පරිනාමීය ප්‍රගමන පරීක්ෂා කරයි.
- ලාංකීය බෞද්ධ සාහිත්‍යය දැනගෙන අභිමානවත් පුරවැසියෙක් ලෙස ක්‍රියා කරයි
- ත්‍රිපිටක ධර්මයේ ප්‍රකට, අප්‍රකට, ගැඹුරු, සියුම් හා සරල ක්ෂේත්‍ර ගවේෂණයට පෙළඹෙයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- පෙළපොතෙහි ත්‍රිපිටක සාහිත්‍යය නම් 10 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් "තදේතං සබ්බම්පි බුද්ධ වචනං" යනාදී පාඨය ලියන ලද පත්‍රිකා ලබා දී ඒ ඇසුරින් පාඩම ඉදිරියට ගෙන යන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සමස්ත පාඩම ම විනය සූත්‍ර අභිධර්ම වශයෙන් බෙදී යන පරිදි රැගෙන යන්න.
- පාළි භාෂාවත් එහි සාහිත්‍ය වපසරියත් පහදා දෙන්න.
- ත්‍රිපිටකයේ පෞරාණික ප්‍රභේද පිළිබඳ ඓතිහාසික විවරණ ලබා දෙන්න.
- නවංගසත්ථු සාසන, ධම්මක්ඛන්ධ, යන ප්‍රභේද නිරවුල් කර දෙන්න.
- විනය පිටකය ග්‍රන්ථ වශයෙන් හඳුන්වා දෙන්න.
- සූත්‍ර පිටකය ග්‍රන්ථ වශයෙන් හඳුන්වා දෙන්න.

- අභිධර්ම පිටකය ග්‍රන්ථ වශයෙන් හඳුන්වා දෙන්න.
- අට්ඨකථා, ටීකා ආදියේ ප්‍රයෝජනය අවධාරණය කරන්න.
- පෙළ හා අටුවා ග්‍රන්ථ ව්‍යුහය රුක් සටහනක් ලෙස සකස් කරවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ඔස්සේ ශිෂ්‍යයන් තක්සේරු කරන්න.
- අපේක්ෂිත සාධක මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- පාළි - පෙළ, එකී භාෂාව
- මාගධී - මගධ දේශයේ භාවිත භාෂාව
- ධම්මවිනය - බුදු හිමිගේ දේශනා හා පැනවීම්
- බ්‍රහ්මචරිය - පවිත්‍ර ජීවිතය, බඹසර විසීම
- සන්න - පරිවර්තනය කර ලියන ලද්ද
- ධම්මක්ඛන්ධ - බුදු දහම අසූහතර දහසක කොටස්වලට බෙදීම
- ත්‍රිපිටක - විනය සූත්‍ර, අභිධර්ම විනය
- අට්ඨකථා - මුල් දෙසුමට විස්තර විවරණ නිදාන සැපයීම
- ටීකා - අටුවාවල දුරවබෝධ තැන් තවදුරටත් විවරණය කිරීම
- ටිප්පණී - ටීකාවෙන්ද නොකියවුනු කරුණු විවිරණය කිරීම
- ගැටපද - පාදයන්ට වෙන්වෙන්ව අර්ථ විවරණ සැපයීම

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම 01

"තදේතං සබ්බම්පි බුද්ධවචනං රසවසේන ඒකවිධං. ධම්මවිනය වසේන දුවිධං. පඨමමජ්ඣිමපච්ඡිමවසේන තිවිධං. තථා පිටකවසේන. නිකායවසේන පඤ්චවිධං. අංගවසේන නවවිධං. ධම්මක්ඛන්ධවසේන චතුරාසීතිසහස්සවිධං'ති වේදිතබ්බං." යන පාඨය සිංහල අරුත සහිතව ලියන පද පත්‍රිකා අවශ්‍ය ප්‍රමාණයක්.

- පෙළපොතේ දහවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය.

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

පහත සඳහන් නිර්නායක යොදා ගන්න.

- පාළි භාෂාවේ හා සාහිත්‍යයේ අගය හඳුනා ගැනීම
- ත්‍රිපිටකයේ ඉපැරණි පර්යාය භාවිත පිළිබඳ වැටහීම.
- ත්‍රිපිටක ග්‍රන්ථ ව්‍යුහය පිළිබඳ නිරවුල් අවබෝධය කරවීම.
- අට්ඨකථා හා ටීකා ග්‍රන්ථ ව්‍යුහය පැහැදිලි කිරීම.
- ත්‍රිපිටක ග්‍රන්ථ අන්තර්ගතයේ සංක්ෂිප්තය පිළිබඳ අවබෝධ කරවීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

සමන්තපාසාදිකා - බාහිර නිදාන කොටස

අංගුත්තර නිකාය - පහාරාද සූත්‍රය

බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ - පාළි සාහිත්‍යය

විමලවංශ නාහිමි, බද්දේගම - ත්‍රිපිටක සාහිත්‍යය 01, 02

# 11 පාඩම
## ගිහි සමාජ සම්බන්ධතාව (සිගාල සූත්‍රය)

**01. නිපුණතාව :- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර, ගුණාත්මක හා සාර්ථක යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 4.1**

- සූත්‍ර ධර්මයන්හි අන්තර්ගත ධර්ම කරුණු විග්‍රහ කරමින්, ආගමික හා ශාසනික මෙහෙවරෙහි යෙදෙයි.

**03. කාලපරිච්ඡේද :-** 09 යි.

**04. ඉගෙනුම් පල :-**

- ලෝකයේ සදිසාව සමඟ ආර්ය විනයෙහි සදිසාව ගැලපෙන ආකාරය කියයි.
- සතර කර්මක්ලේශ ආදී වූ අංග හය යනු මොනවාදැයි කියවෙන, පාළි පාඨ, ගාථා සහ ඒවායේ අර්ථ මතකයෙන් කියයි.
- ආර්ය විනයෙහි සදිසා නමස්කාරය නිවැරැදිව කිරීම තුළින් මෙලොව ද පරලොව ද සඵල වන බව පිළිගනියි.
- සදිසා සංග්‍රහය සිතට ගෙන තමාගේ සමාජික යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටුකරයි.
- මව් පියන් ඇතුළු සමාජ සදිසාවෙන් තමාට ඉටු වන මෙහෙවරට සරිලන මෙහෙවරක් තමාගෙනුත් ඉටු විය යුතු යැයි සලකා මානව හිතවාදී පුද්ගලයෙකු ලෙස කටයුතු කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- පූර්ව දිසාවට අයත් මාපිය යුතුකම් පිළිබඳ සඳහන් වෙන "භතො නෙසං භරිස්සාමි, කිච්චං නෙසං කරිස්සාමි, කුලවංසං ඨපෙස්සාමි, දායජ්ජං පටිපජ්ජාමි, අථ වා පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුප්පදස්සාමි" යන පාඨය කටපාඩම් කරගෙන එන ලෙස දැනුම් දෙන්න.
- "මාතාපිතා දිසා පුබ්බා - ආචරියා දක්ඛිණා දිසා
  පුත්තදාරා දිසා පච්ඡා - මිත්තාමච්චා ච උත්තරා
  දාසකම්මකරා හෙට්ඨා, - උද්ධං සමණබ්‍රාහ්මණා
  එතාදිසා නමස්සෙය්‍ය - අලමත්ථො කුලෙ ගිහී" යන ගාථාව කටපාඩම් කරගෙන එන ලෙස නියම කරන්න.

II ප්‍රවේශය

- පෙර දින ශිෂ්‍යයන්ට කටපාඩම් කර ගෙන ඒමට නියම කරන ලද පාඨය, සිගාල සූත්‍රයෙන් වෙනම ගෙන ඩිමයි කොලයක ලියා හෝ හැකිනම් බුද්ධ ජයන්ති ත්‍රිපිටක පොතින් කොපියක් ගෙන එය විශාල කර මුද්‍රණය කරවා බුද්ධ ජයන්ති පොත සමඟ පන්තියට රැගෙන ගොස් එය ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- සිගාල සිටු පුත්‍රයා සදිසා නමස්කාරය කිරීමට මුල් වූ කාරණය කුමක්දැයි විස්තර කර දෙන්න.
- දිසා නමස්කාරය වැනි දේ අර්ථවත් දේ නොවූ බව පැහැදිලි කොට ඒ වෙනුවට සදිසා නමස්කාරය සමාජයට ප්‍රයෝජනවත් නමස්කාරයක් ලෙස හඳුන්වාදීම සිගාලෝවාද සූත්‍රයෙන් සිදු වී ඇති බව පහදා දෙන්න.
- සදිසා නමස්කාරය සාර්ථකව ඉටුකරන්නකු වීමට නම් ඔහු පළමු කොට තමා යහපත් පුද්ගලයෙකු වී සිටිය යුතු බව සූත්‍රයේ මුලට ම එන දුරුකළ යුතු පාප ධර්ම ඇසුරින් පහදා දෙන්න.
- සූත්‍රයේ එන සුවිශේෂී පාළි ගාථා හා පාඨ ආදිය කට පාඩම් කරවන්න.
- එක් එක් දිසාවට ද්විපාර්ශ්වීය යුතුකම් මතකයෙන් කීමට පුරුදු කරවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- කර්ම ක්ලේශ සතර - ප්‍රාණ ඝාතය, අදත්තා දනය, කාම මිථ්‍යාචාරය, මුසාවාදය
- අගති ගමන සතර - ඡන්දය, ද්වේශය, භය, මෝහය

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ එකොළොස් වන පාඩම.
- දීඝ නිකාය 02 ත්‍රිපිටක බුද්ධ ජයන්ති පොත
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- සූත්‍රයේ එන සුවිශේෂ පාළි ගාථා සහ පාළි පාඨ කටපාඩමින් කීමේ හැකියාව.
- එම පාළි පාඨයන්හි අර්ථ මතකයෙන් කීමේ හැකියාව.
- බුදු දහමේ එන ධනය ඉපයීමේ සහ ඒවා සංරක්ෂණය කිරීමේ පිළිවෙළ පිළිබඳ කථාවක් කිරීමේ හැකියාව.
- මිත්‍ර ප්‍රතිරූපකයන් සහ සුහද මිත්‍රයන් කවුරුදැයි නම් වශයෙන් කීම.
- ආර්ය විනයේ සදිසා ආවරණය නම් වශයෙන් ලියා දැක්වීම.
- ආරම්භක රැස්වීමේ දී, පන්තියේ දී, ශිෂ්‍ය සමිතියේ දී හෝ සදිසා ආවරණයට අදාළ කථාවක් හෝ දේශනයක් කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ගිහිවිනය, ඤාණරතන මහා නාහිමි, වැලිගම
- අගාරික ප්‍රතිපදාව, සෝමිස්සර නාහිමි, මාපලගම

# 12 පාඩම

## ආගමික මතවාද පිළිගැනීමේ නිවැරැදි විදිය

## (කාලාම සූත්‍රය)

**01. නිපුණතාව :- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර, ගුණාත්මක හා සාර්ථක යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 4.1**

- සූත්‍ර ධර්මයන්හි අන්තර්ගත ධර්ම කරුණු විග්‍රහ කරමින්, ආගමික හා ශාසනික මෙහෙවරෙහි යෙදෙයි.

**03. කාලපරිච්ඡේද :-** 04 යි.

**04. ඉගෙනුම් පල :-**

- "මා අනුස්සවෙන" ආදි වූ යමක් පිළිගැනීමට එකම පදනම නොවිය යුතු කරුණු දහය මතකයෙන් කියයි.
- ඕනෑම දෙයක් පිළිගත යුත්තේ කුසල් ද අකුසල් ද, හරිද වැරැදි ද, නුවණැත්තන්ගේ පැසසුමට ලක්වේ ද ගැරහුමට ලක් වේද ඒවා සිතීම කීම හෝ කිරීම හිත පිණිස පවතී ද අහිත පිණිස පවතී ද යන්න මත බව පිළිගෙන කියයි.
- ඕනෑම ගැටලුවක් ප්‍රශ්නයක් දෙලොව සැප පිණිස හේවතුවන ආකාරයෙන් විසඳා ගනියි.
- ඕනෑම කාරණයක දි අන්තගාමී නොවී මධ්‍යස්ථ පිළිවෙතක් අනුගමනය කරයි.
- යුක්තිය සාධාරණය ගරු කරන පුද්ගලයෙකු ලෙස සමාජයේ කටයුතු කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- "අලං හි වො කාලාමා කංඛිතුං අලං විචිකිච්ඡිතුං, කංඛනීයෙ ච පන වො ඨානෙ විචිකිච්ඡා උප්පන්නා, එථ තුම්හෙ කාලාමා මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහේතු, මා ආකාරපරිවිතක්කේන, මාදිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරුති" යන පාඨය කටපාඩම් කරගෙන ඒමට දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- පෙර දින ශිෂ්‍යයන්ට කටපාඩම් කර ගෙන ඒමට නියම කරන ලද පාඨය, කාලාම සූත්‍රයෙන් වෙනම ගෙන ඩිමයි කොලයක ලියා හෝ හැකිනම් බුද්ධ ජයන්ති ත්‍රිපිටක පොතින් පිටපතක් ගෙන එය විශාලකර මුද්‍රණය කරවා බුද්ධ ජයන්ති පොත සමඟ පන්තියට රැගෙන ගොස් එය ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න.

- "ඇතත් නැතත් පරලොව සුදනෙනි මහත" යන සුභාෂිතයේ එන කවිය තාලයට ගායනා කොට එහි අර්ථ පහදා දෙමින් පාඩමට පිවිසෙන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- කාලාම සූත්‍රය දේශනා කරන්නට පසුබිම් වූ බුදු පියාණන් වහන්සේගේ කේසපුත්ත චාරිකාව පිළිබඳ විස්තර කරන්න.
- එතෙක් එහි අබෞද්ධයන් ලෙස පෙනී සිටි කාලාමයෝ කවර ආගම් දර්ශනයක් සත්‍යදැයි ඇසූ විට බුදුන්වහන්සේ විසින් දේශනා කරන ලද සැක උපදින අවිශ්වසනීය කාරණා දහය විස්තර කරන්න.
- එසේම යමක් පිළිගැනීමේ දී මේ "ධර්මය අකුසල ය, මේ ධර්මය වැරැදි සහගත ය, මේ ධර්මය නුවණැත්තන් විසින් ගරහන ලද්දේ ය. මේ ධර්මය පිළිගෙන පිළිපැදීම අතහිත පිණිස දුක් පිණිස පවතීයයි යම් විටක ඔබට ම වැටහේ නම් එවා අත්හරින්න. දුරැකරන්න" යන්න පහදා දෙන්න.
- ලෝභ ද්වේෂ මෝහ යන අකුසල් සිතුවිලි බොහෝ කල් අහිත පිණිස දුක් පිණිස පවතින බවත් අලෝභ අද්වේෂ අමෝහ යන කුසල් සිතුවිලි බොහෝ කල් හිත සුව පිණිස පවතින බවත් විස්තර කර දෙන්න.
- දැඩි ලෝභය ව්‍යාපාදය දුරු කොට මෝහයෙන් මුළා නොවී සිහිකල්පනාවෙන් යුතුව ක්‍රියාකරන පුද්ගලයා මෙලොවදී ලබන අස්වැසිලි හතර විස්තර කර දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- අකුසලමූලයන් - ලෝභ ද්වේෂ මෝහ
- ව්‍යාපාදය - තරහව

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළපොතේ දොළොස්වන පාඩම, අංගුත්තර නිකාය තික නිපාතයෙන් උපුටාගත් සූත්‍ර පිටපත

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- සුවිශේෂ පාළි ගාථා සහ පාළි පාඨ කට පාඩම.
- එම පාළි පාඨයන්හි අර්ථ මතකයෙන් කීම සහ ලිවීම.
- ඕනෑම දෙයක් පිළිගැනීමට එකම පදනම නොවිය යුතු කරුණු දහය පිළිබඳ විස්තර කිරීමේ හැකියාව.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- මනෝරථපූර්ණී අඞ්ගුත්තර නිකාය අට්ඨකතා, කාලාම සූත්‍ර වර්ණණාව
- බුදුන් වදාළ ධර්මය, රාහුල නාහිමි, වල්පොළ 3,4,5 පිටු

# 13 පාඩම
## දැහැමින් නැගෙති අදැහැමින් වැටෙති
## (පරාභව සූත්‍රය)

**01. නිපුණතාව :- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර, ගුණාත්මක හා සාර්ථක යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 4.1**

- සූත්‍ර ධර්මයන්හි අන්තර්ගත ධර්ම කරුණු විග්‍රහ කරමින්, ආගමික හා ශාසනික මෙහෙවරෙහි යෙදෙයි.

**03. කාලපරිච්ඡේද :-** 05 යි.

**04. ඉගෙනුම් පල :-**

- පරාභව සූත්‍රයට අදාළ පාළි ගාථා නිවැරැදිව සජ්ඣායනා කරයි.
- සූත්‍රයට අදාළ පාළි ගාථා අර්ථ සහිතව කටපාඩමින් කියයි.
- ධර්මයට කැමැති පුද්ගලයා දියුණු වන බවත් ධර්මයට අකැමැති අධාර්මික පුද්ගලයා පිරිහෙන බවත් පිළිගනියි.
- තමන් පිරිහීමට හේතුවන කාරණා මොනවා දැයි දැනගෙන හැකි තරම් ඒවායින් මිදී සිටියි.
- තමනුත් පිරිහීමේ දොරටුවලින් මිදී නිතරම අනුන්ටත් කියාදෙමින් පිරිහීමෙන් වළකා ගැනීමට කටයුතු කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- "සුවිජානො භවං හොති - සුවිජානො පරාභවො
  ධම්මකාමො භවං හොති - ධම්මදෙස්සී පරාභවො"
  යන ගාථාව කටපාඩම් කරගෙන එන ලෙස නියම කරන්න.

**II** ප්‍රවේශය

- ජාතියක් වශයෙන් සිංහලයාගේ පිරිහීමට හේතු වී ඇති කරුණු මොනවාදැයි විමසා ඒ පිළිබඳ සාකච්ඡාවකින් පාඩමට පිවිසෙන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- පරාභව සූත්‍රය දේශනා කිරීමට හේතු වූ පසුබිම් කථාව විස්තර කරන්න.
- පරාභව කාරණා ඇතුළත් ගාථා දොළහ වනපොත් කරවන්න.
- පිරිහීමට හේතු වන කරුණු පිමසූ විට ඒවාට බුදුරජාණන් වහන්සේ දුන් පිළිතුරු ඇතුළත් ගාථාවල අර්ථ විස්තර කරන්න.

- ශිෂ්‍යයන් කොටස් දෙකකට බෙදා ප්‍රශ්න ගාථාව හා පිළිතුරු ගාථාව දෙපක්ෂයට දී කිහිප වරක් (එනම් මේ පාඩම කරන කාලච්ඡේදයකට එක් වරක් වත්) සජ්ඣායනා කරවන්න.
- සූත්‍රයේ පිරිහීමට හේතුවන කරුණු සියල්ල දහ අටක් ඇති බවත් පාඩමේ දී ඒවා ගාථා අනුව කරුණු 12 කට වර්ග කොට ඇති ආකාරයත් නිරවුල්ව පහදා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- පිරිහීමේ දොරටු දොළහක් ඇති බව

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ දැහතුන්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- ගාථා කටපාඩමින් කීම.
- පරාභව සූත්‍රය සාම්ප්‍රදායික පිරිත් තාලය අනුව සජ්ඣායනා කිරීම.
- එම ගාථා සහ අර්ථ කටපාඩමින් කීමේ හැකියාව.
- එම පාළි පාඨයන්හි අර්ථ මතකයෙන් කීමේ සහ ලිවීමේ හැකියාව.
- පරාභව කාරණා වගුගත කොට දැක්වීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- පරමත්ථ ජෝතිකානාම සුත්තනිපාත අට්ඨ කතා, පරාභවසුත්ත වර්ණණාව

# 14 පාඩම
## වරදට බිය නිවනට පියවරයි
## (ආපත්තිභය සූත්‍රය)

**01. නිපුණතාව :- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර, ගුණාත්මක හා සාර්ථක යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 4.1**

- සූත්‍ර ධර්මයන්හි අන්තර්ගත ධර්ම කරුණු විග්‍රහ කරමින්, ආගමික හා ශාසනික මෙහෙවරෙහි යෙදෙයි.

**03. කාලපරිච්ඡේද :-** 10 යි.

**04. ඉගෙනුම් පල :-**

- ආපත්ති පැහැදිලි කරයි.
- ආපත්තිය හා පිළියම මොනවා ද යන්න පිළිගනිමින් කටයුතු කරයි
- ශික්ෂාපද භික්ෂූන් වහන්සේට සහ භික්ෂූණීන් වහන්සේලාට වෙන් වෙන් වශයෙන් ඇති ප්‍රමාණයන් වගුගත කරයි.
- විනයානුකූල ජීවිතයක් ගත කරයි.
- ශික්ෂාකාමී වෙයි

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- ආපත්ති භය සූත්‍රයේ එන පුරාණ දඬුවම් හතර මොනවා දැයි සොයා ගෙන එන ලෙස ශිෂ්‍යයන්ව දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- වර්තමානයේ ඒ ඒ වැරැදිවලට දෙන දඬුවම් කවරේදැයි විමසා සාකච්ඡාවක යෙදෙමින් පාඩමට පිවිසෙන්න.

නැතහොත්

- පාඩමේ සඳහන් පුරාණ දඬුවම් හතර සහ ආපත්ති හතර වගුගත කොට ඇති පුවරුවක් ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- ආපත්ති භය සූත්‍රයට අදාළ පෙළ සියලු දෙනා සමග සජ්ඣායනා කරන්න.
- උච්චාරණයට අපහසු වචන කීපයක් තෝරාගෙන එම වචන සිසුන් ලවා කියවන්න තේරුම ද පැහැදිලි කරන්න.

- පුරාණ දඬුවම් හතර විස්තර කොට එම දඬුවම්වලට බියෙන් කෙනෙක් වරදින් මිදෙනවා සේ ආපත්තිවලට බියෙන් කටයුතු කළ යුතු ආකාරය විස්තර කර දෙන්න.
- විනය පිටකයේ එන ශික්ෂා පද පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, පාටිදේසනීය වශයෙන් ප්‍රධාන කොටස් හතරකට බෙදී ඇති බව පැහැදිලි කරන්න.
- මෙකී ශික්ෂාපද භික්ෂූන් වහන්සේට සහ භික්ෂුණීන් වහන්සේලාට වෙන් වෙන් වශයෙන් ඇති ප්‍රමාණයන් පිළිබඳ වගුවක් සකස් කරවන්න.
- පාරාජිකාපත්ති, සංඝාදිසේසාපත්ති, පාචිත්තිය, පාටිදේසනීය යන ඇවැත්වලට පත් වුවහොත් ඊට කළ යුතු පිළියම් ද වෙන වෙනම විස්තර කර දෙන්න.
- ආපත්තිය හා පිළියම වශයෙන් වගුවක් සකස් කිරීමට උපදෙස් දෙන්න.
- භික්ෂුවක් නම් ඉතා කුඩා වරදෙහි නමුත් බිය දක්නා සුලුව සිතිය යුතු බව අවධාරණයෙන් කියා දෙන්න. (අනුමත්තේසු වජ්ජේසු භයදස්සාවි/න ච බුද්දං සමාචරේ කිඤ්චි යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං)
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරන්න.
- ආපත්ති භය යන සංකල්පයෙහි ඇති වැදගත් කම.
- පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, පාටිදේසනීය ශික්ෂා පද වර්ග හතර පිළිබඳ දැනුවත් වීම.
- දණ්ඩභය යන්න මෙම සූත්‍රයේ වරදට බිය වීමේ පදනම ලෙස දක්වා ඇති බව.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- සතර බිය - 1. අත්තානුවාද භය
  2. පරානුවාද භය
  3. දණ්ඩ භය
  4. දුග්ගති භය
- පැරණි දඬුවම් - දෙතිස් වද

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ දහ හතරවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය.

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- සූත්‍රය නිවැරැදිව සජ්ඣායනය කිරීමේ හැකියාව.
- ඒ ඒ ආපත්ති වර්ග සහ ඊට අදාළ පිළියම් කවරේද යන්න.
- ආපත්ති බිය ඒ ඒ දඬුවම්වලට ඇති වෙන බිය හා සංසන්දනය කර දැක්වීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

මනෝරථ පූර්ණී, අඞ්ගුත්තර නිකාය අට්ඨකථා, ආපත්තිභය සූත්‍ර වර්ණණාව.

# 15 පාඩම

## ඔබ ඔබේ රූපය හඳුනනවා ද?

**01. නිපුණතාව :- 4.1**

- ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර ගුණාත්මක හා සාර්ථක යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මඟ සලසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 4.2**

- අභිධර්ම පිටකයට අයත් රූප හා නිබ්බාණ පරමාර්ථ අධ්‍යයනය කර ගැඹුරු අවබෝධයකින් යුතුව කටයුතු කරයි.

**03. කාලපරිච්ඡේද :-** 07 යි.

**04. ඉගෙනුම් පල :-**

- රූප පරමාර්ථයක් වශයෙන් පැහැදිලි කරයි.
- රූප ප්‍රභේද පිළිගනිමින් කථා කරයි.
- රූප ප්‍රභේද වර්ගීකරණය කරයි.
- රූප ප්‍රභේද අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව හේතු ප්‍රත්‍යය වශයෙන් දක්වයි.
- රූපයේ යථාර්ථය දන අවබෝධයෙන් ක්‍රියාකරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- පෙළ පොතෙහි "ඔබ ඔබේ රූපය හඳුනනවා ද?" යන 15 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

**II** ප්‍රවේශය

- කාලච්ඡේද පහට අදාළ වන පරිදි අභිධර්මයේ රූප පරමාර්ථය ශිෂ්‍යයාට ගෝචර කර ගත හැකි ලෙස පහත දැක්වෙන න්‍යාය පදනම් පහක් යටතේ පාඩමට ප්‍රවේශ විය හැක.

1. සමුද්දේස - රූප පිළිබඳ නම් වශයෙන් හඳුනා ගැනීම.
2. විභාග - නම් වශයෙන් දක්වන රූප විධිමත් ලෙස බෙදා දැක්වීම.
3. සමුට්ඨාන - රූප උපදවන හේතු ප්‍රත්‍යය විමර්ශනය
4. කලාප - අන්‍යෝන්‍ය වශයෙන් රූප සම්බන්ධ වන ආකාරය පිරික්සීම.
5. ප්‍රවෘත්ති - හේතු ඵල සම්බන්ධතා ඇසුරෙන් රූපයේ පැවැත්ම සහ ස්වභාවය නිරවුල් කර ගැනීම.

## 06. පාඩම් සංවර්ධනය :-

- ශිෂ්‍ය කණ්ඩායම් දෙකකට වෙන් කොට භූත රූප - උපාදාය රූප, නිප්ඵන්න රූප - අනිප්ඵන්න රූප, කම්මජ රූප - චිත්තජ රූප, උපාදින්න රූප - අනුපාදින්න රූප ආදී දෙයාකාර බෙදීම් වෙන වෙන ම රැස් කොට ලියවා නැවත එම ලේඛන පිළිවෙළින් ගොනු කරවන්න.
- මිනිස් ශරීරයේ සතර මහා භූත පිහිටා පවතින අකාරය විශ්ලේෂණාත්මකව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- රූප කලාපයන්ගේ ප්‍රභේද වටහා ගැනීමට හැකිවන පරිදි රූක් සටහන් සකස් කරවා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරවන්න.
- රූප පරමාර්ථය හඳුනා ගැනීමට පහසු වන පරිදි රූප ප්‍රභේද සිසුන් ලවා වාචෝද්ගත කරවන්න.
- රූප පරමාර්ථය ඇසුරු කර ගනිමින් රූපයේ යථා ස්වභාවය ස්වකීය ශරීරයෙහි මෙනෙහි කරමින් මද වේලාවක් භාවනාවක යොදවන්න.
- නිසි තක්සේරුකරණ නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් සිටිනම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක යෙදෙන්න.
- අභිධර්මය සහ පරමාර්ථ පිළිබඳවත් චිත්ත චෛතසික පර්මාර්ථ දෙක පිළිබඳවත් පුනරාවලෝකනයක යොදවන්න.
- රූප පරමාර්ථය අභිධර්මයේ විවරණය කර ඇති ආකාර පහ ඇසුරෙන් එකිනෙක පැහැදිලි කර දෙන්න.
- රූප පරමාර්ථයේ ආකාර පහ පදනම් කර ගනිමින් සවිස්තරාත්මක වටහාගැනීමකට අවශ්‍ය විශ්ලේෂණ හා සංශ්ලේෂණ භාවිත කරන්න.
- පාඩමේ ඇති පාරිභාෂික ආභිධර්මික වචන සඳහා ප්‍රමාණවත් අර්ථ නිරූපණ සපයා දෙන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- සමුද්දේස - හෙළි කොට ඉදිරිපත් කිරීම.
- විභාග - බෙදා වෙන්කොට දැක්වීම.
- සමුට්ඨාන - උපදවන හේතු පරීක්ෂාව
- ප්‍රවෘත්ති - පැවැත්ම වටහා ගැනීම.
- කලාප - බෙදන ලද කොටස් අතර සාමූහික වර්ගීකරණය

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම 01 - "රුප්පතීති භවේ රූපං - විකාර පච්චයේ සති
  රූප රූපං තථා රූපං - පරියාපන්නතෝ පරං"
  යන ගාථාව ලියන ලද පුවරුවක්
- ඇමුණුම 02 - බ්‍රිස්ල් බෝඩ්. ප්ලැටිග්නම් ආදිය
- පෙළපොතේ පහළොස්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- රූප පරමාර්ථය බෙදා දැක්වීමේ හැකියාව

- රූප පරමාර්ථයේ අන්‍යෝන්‍ය හේතු ප්‍රත්‍යය සම්බන්ධය අවබෝධය
- රූපයේ ස්වභාවය ත්‍රිලක්ෂණ වශයෙන් වටහා ගැනීමේ හැකියාව
- ජීවිතයේ යථාර්ථය නිරවුල් කරගත හැකි බව පිළිගැනීම
- රූප උපදවන හේතු පිළිබඳ අවබෝධය

පහත ප්‍රශ්න සිසුන්ට ලබා දී ලිඛිතව හෝ වාචිකව ඇගයීම.

1. අටවිසි රූප කලාප බෙදිය හැකි ආකාර දක්වන්න.
2. උපදින ස්වභාව අනුව වර්ග කරන සත්ව ප්‍රභේද මොනවා ද?
3. රූප උපදවන හේතු පහදන්න.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- අභිධම්මත්ථ සංගහ
- විසුද්ධි මග්ග - ඛන්ධ නිද්දේස
- චන්ද්‍රවිමල නාහිමි, රේරුකානේ - අභිධර්ම මාර්ගය

# 16 පාඩම

## අපේ රූප විසි අටකි

**01. නිපුණතාව :- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර ගුණාත්මක හා සාර්ථක යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මඟ සලසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 4.2**

- අභිධර්ම පිටකයට අයත් රූප හා නිබ්බාණ පරමාර්ථ අධ්‍යයනය කර ගැඹුරු අවබෝධයකින් යුතුව කටයුතු කරයි.

**03. කාලපරිච්ඡේද :-** 05 යි.

**04. ඉගෙනුම් පල :-**

- අටවිසි රූප කලාප නම් වශයෙන් දැනගනියි.
- සතර මහා භූතයන්ගේ සාමාන්‍යය හා විශේෂ ලක්ෂණ පිරික්ෂා බලයි.
- දෙතිස් කුණප කොට්ඨාස සහ මහා භූත අතර ඇති සම්බන්ධය අවබෝධ කර තදනුගතව මනස මෙහෙයවයි.
- උපාදාය රූප පැහැදිලි කොට ගෙන භූත රූපවලින් උපාදාය රූප වෙන්කර ගනියි.
- සූවිසි උපාදාය රූප අරුත් වශයෙන් දැන පුද්ගල චර්යා ස්වභාවවල විවිධත්වය වටහා ගනිමින් ක්‍රියාකරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- පෙළපොතේ "අපේ රූප 28 කි." නම් 16 වැනි පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

**II** ප්‍රවේශය

- භෞතික වශයෙන් රූප වටහා ගැනීමටත් මහා භූත ඇසුරු කරගෙන ඒ හා දැඩිව බැඳුණු උපාදාය රූප හඳුනා ගැනීමටත් යෝග්‍ය කායික හා මානසික / භෞතික හා ආධ්‍යාත්මික සම්බන්ධතාව මත පදනම් වූ ආභිධර්මික රූප විවරණය ශිෂ්‍යයාට ග්‍රහණය වන සේ පැහැදිලි කිරීම.

**06. පාඩම් සංවර්ධනය :-**

- පොළොව, ජලය, ගින්න, වාතය යන මේවායේ තද ගතිය, වැගිරෙන ගතිය, උණුසුම හා ශීතල, තෙරපුම හෙවත් පීඩනය යන ස්වභාව නිරීක්ෂණය කරවන්න.

- මනුෂ්‍ය කායික ව්‍යුහ රූප සටහන්, ඡායාරූප හෝ සලරූ මඟින් ද්වත්තිංසාකාරය පහදා දෙන්න.

- කායගතාසති භාවනාව සඳහා උපදෙස් හෝ භාවනාවේ යෙදවීමෙන් මහා භූතයන්ගේ ශාරීරික ව්‍යාප්තිය අත්දකින්නට ඉඩ හරින්න.

- විකාර රූප දෙක සහ ලක්ඛණ රූප හතර පදනම් වූ කායික ක්‍රියාකාරිත්වය වැටහෙන පරිදි රූපයේ යථා ස්වභාවය ශිෂ්‍යයා මඟින් ප්‍රකාශ කරවා ගැනීමට අදාළ සංවාදයක යොදවන්න.

- නිසි තක්සේරුකරණ නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරන්න.

- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් සිටීනම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

- රූප පරමාර්ථය භූත උපාදාය වශයෙන් මූලික බෙදීමකට ලක්ව ඇති බව පැහැදිලි කර දෙන්න.

- මහාභූත සතරෙහි විශ්වීය හා ශාරීරික ව්‍යාප්තිය පිළිබඳ වැඩි අවධානයකට යොමුකරවන්න.

- උපාදය රූප 24 වඩාත් සරලව හඳුනාගත හැකි ආකාරයට පැහැදිලි කර දෙන්න.

- පාඩමේ ඇති සෑම ආභිධර්මික තාක්ෂණික වචනයක ම නිවැරැදි සිංහල අර්ථය පහදා දෙන්න.

- සියල්ල බෙදා දැක්වීමෙන් සමස්තයේ යථාර්ථය අවබෝධය සඳහා මඟ පාදා දෙන්න.

- ත්‍රිලක්ෂණය ඇසුරෙන් රූපය පිළිබඳ ගැටළුව නිරාකරණය කර දෙන්න.

- රූප විශ්ලේෂණයෙන් යථාර්ථාවබෝධයත් ක්ලේශ ප්‍රහාණයත් එමඟින් සාර්ථක ජීවිතයේ වටිනාකමත් තහවුරු කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- මුළු පාඩම පුරාම විග්‍රහ කරණුයේ මූලික වදන් සමූහයකි. එබැවින් අටවිසි රූප කලාප විවරණයන් පාඩම ඇසුරෙන් සිසුන්වෙත ළඟාකර දෙන්න.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- භෞතිකය නිරීක්ෂණය සඳහා පස් සාම්පලයක්, දිය බඳුනක්, ගිනි පෙට්ටියක්, බැලූනයක්
- මානව - ශාරීරික කොටස්වල රූප සටහන් හෝ ශ්‍රව්‍ය - දෘශ්‍ය උපකරණ
- ඇමුණුම 01 - චක්ෂුරාදී ඉන්ද්‍රිය රූපාදී විෂයයන්ට ගෝචර වන අන්දම හෙවත් ඉන්ද්‍රිය සංජානනය වටහා දීම සඳහා පන්ති කාමරයේ ක්ෂණික අත්දැකීමක් ක්‍රියාත්මක කිරීම.
- පෙළ පොතේ දහසයවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- මහාභූත සතරෙහි විශ්ව ව්‍යාප්තිය තේරුම් ගැනීම.
- මිනිස් සිරුරේ කොටස් මහා භූත වශයෙන් වෙන්කර ගැනීමේ ඇති හැකියාව.
- උපාදාය රූප විවරණය භෞතිකයට හා මනසට සම්බන්ධ වන ආකාරය තේරුම් ගැනීම.
- ශාරීරික ව්‍යුහය හා එහි ස්වභාවය වටහා ගැනීම.

- පහත ප්‍රශ්න ලිඛිතව හෝ වාචිකව ලබා දී ඇගයීම කළ හැක.
    01. රූප කලාප 28 කොටස් වශයෙන් බෙදෙන ආකාරය දක්වන්න.
    02. සතර ආහාර අතරින් කබලිංකාර ආහාරයේ ඇති විශේෂත්වය කුමක් ද?
    03. ජීවිත රූපය හෙවත් ජීවිතින්ද්‍රිය මඟින් පෙන්වාදෙන ජීවිතය යනු කුමක් ද?

- ඇමුණුම 01 හි ඇති අභ්‍යාසයන් ඇසුරෙන් ඉන්ද්‍රිය සංජානන ශක්තිය වටහා ගැනීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- සංයුත්ත නිකාය - ඛන්ධ සංයුත්ත
- මජ්ඣිම නිකාය 01 - මධුපිණ්ඩික සූත්‍රය
- අභිධර්මාර්ථ සංග්‍රහ - සිංහල සන්නය

# 17 පාඩම

## නිවනින් නිවීම

**01. නිපුණතාව :- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර ගුණාත්මක හා සාර්ථක යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 4.2**

- අභිධර්ම පිටකයට අයත් රූප හා නිබ්බාණ පරමාර්ථ අධ්‍යයනය කර ගැඹුරු අවබෝධයකින් යුතුව කටයුතු කරයි.

**03. කාලපරිච්ඡේද :-** 04 යි.

**04. ඉගෙනුම් පල :-**

- "නිබ්බාන" වචනාර්ථ හා ව්‍යාචාර්ථ වශයෙන් දැනගෙන ප්‍රකාශ කරයි.
- නිර්වාණය ප්‍රත්‍යක්ෂ කළ යුතු හෙවත් සාක්ෂාත් කළ යුතු පරමාර්ථයක් බව වටහා ගෙන ප්‍රකාශ කරයි.
- සතර පරමාර්ථ ඇතුළත් අභිධර්මයේ ගැඹුරු බව අවබෝධ කොට ධර්ම ගෞරවය උපදවා ගනියි.
- ත්‍රිවිධ බෝධි තේරුම් ගෙන ශ්‍රද්ධාවත් ප්‍රඥාවත් වැඩිය යුතු බව පිළිගෙන ප්‍රකාශ කරයි.
- මාර්ගඵල ලාභිත්වයේ අගය හා එහි ක්‍රමෝන්නත බව දැනගෙන ක්‍රියාකරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- පෙළපොතේ "නිවනින් නිවීම" නම් 17 පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් ගාථා දෙක සිසුන්ට ඉදිරිපත් කොට ඒ ඇසුරින් නිර්වාණයේ ස්වභාවය පහදන්න.
- "යෝ තස්සායේව තණ්හාය අසේසවිරාගනිරෝධෝ චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ" යන පාඨය භාවිතයට ගනිමින් ද ප්‍රවේශ විය හැක.

**06. පාඩම් සංවර්ධනය :-**

- ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ සහ සච්චවිභංග සූත්‍රයේ ඇති නිර්වාණයේ මූලාර්ථ පහදා දෙන්න.
- නිබ්බාන යන පදය සඳහා ඇති පර්යාය පද සිසුන් ලවා රැස්කරවා ප්‍රදර්ශන පුවරුවක් සකස් කරවන්න.

- අෂ්ටාර්ය පුද්ගලයන් පිළිබඳ ගවේෂණය කොට මාර්ගඵලලාභී චරිත තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- අටවිසි බුදුරජාණන් වහන්සේ, පසේ බුදුරජාණන් වහන්සේ, රහතන් වහන්සේ පිළිබඳ දත්ත රැස් කරන්න.
- තක්සේරුකරණ නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.
- නිවනින් නිවීම යනු බුදුදහමේ ඇති ආවසානික පරමාර්ථය බව අවධාරණය කරන්න.
- නිර්වාණ සාක්ෂාත්කරණයට පෙර ලෞකික ජීවිතයක නිවීම ද සාධනය කළ යුතු බව පහදා දෙන්න.
- සම්මුති සත්‍යයෙන් පරමාර්ථ සත්‍ය සපුරා නිවන් දුටු උතුමන්ගේ චරිත යොදා ගනිමින් සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.
- නිශේධාර්ථවාචී, නිර්වාණ පර්යාය පද අර්ථ වශයෙන් වටහා දෙන්න.
- සතර මඟ සතර ඵල පිළිවෙළ පැහැදිලි කර දෙන්න.
- සෝපධිසේස, අනුපධිසේස දෙකෙහි වෙනසත් ස්වභාවයත් තේරුම් කර දෙන්න.
- නිවන ත්‍රිශික්ෂා මාර්ගයත් සමඟ සම්බන්ධ වන බව පහදා දෙන්න.
- දුක්ඛනිරෝධගාමිනීපටිපදා ආර්ය මාර්ග අට මඟින් ශික්ෂා මාර්ගය සාධනය කළ හැකි බව පැහැදිලි වන සේ සාකච්ඡාවක යෙදෙන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

නිවන - අනුපදිසේස පරිනිර්වාණයෙන් පිරිනිවියාහට රූපාදී ප්‍රමාණ කිරීමක් නැත. කිසියම් මිනුමකින් යමෙක් යමක් කියයි නම් එයද නිවන් පසක් කළ උතුමාට නැත. සියලු ධර්මයන් නසන ලද කල්හි ඒ පිළිබඳව වාදපථයක් හෙවත් වාචනා මාර්ගයක්ද නැත.

වාත වේගයෙන් නිවීගිය ගින්නක් නැතිවූවා මිස ඒ පිළිබඳ සටහනක් ඉතිරි නොකරයි. නාම කායයෙන් මිදුණු රහත් උතුමෝ ද අස්ථයට ගියා මිස වෙනත් යමක් ඒ සම්බන්ධව ඉතිරි නොකරයි.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම 01 "අත්ථංගතස්ස න පමාණමත්ථි - යේන නං වජ්ජු තං තස්ස නත්ථි
  සබ්බේසු ධම්මේසු සමූහතේසු - සමූහතා වාදපථාපි සබ්බේ" (සුත්ත නිපාත)
  "අච්ඡි යථා වාතවේගේන ඛිත්තෝ - අත්ථං එලේති න උපේති සංඛං
  ඒවං මුනී නාමකායා විමුත්තෝ - අත්ථං එලේති න උපේති සංඛං" (සුත්ත නිපාත)
  නිබ්බාන පර්යාය පද ලිවීමට පුවරුවක්
- පෙළපොතේ දහහතරවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- නිබ්බාන පරමාර්ථය අර්ථකථන වශයෙන් විස්තර කිරීම.
- මාර්ග ඵල පිළිබඳ ඇති අවබෝධය.
- අභිධර්ම පරමාර්ථ සතර නිවැරැදිව විවරණය කිරීම.
- ත්‍රිවිධ බෝධිය පිළිබඳ නිරවුල් දැක්ම.
- අධ්‍යාත්මික සංවර්ධනය හා මිනිස් මනසේ ශ්‍රේෂ්ඨත්වය පිළිගැනීම.

- පාඩමේ අන්තර්ගතය ඇසුරු කර ගනිමින් වාචිකව හෝ ලිඛිතව ප්‍රශ්න ලබා දෙමින් තක්සේරුකරණයේ යෙදිය හැක.
    01. නිර්වාණය පිළිබඳ පැහැදිලි කිරීමක් සහිත සූත්‍ර දෙකක් හා ගාථා දෙකක් ඉදිරිපත් කරන්න.
    02. සෝපධිසේස නිබ්බාන හා අනුපධිසේස නිබ්බාන යනු කුමක් ද?
    03. ඕරම්භාගිය, උද්ධම්භාගිය සංයෝජන නම් කරන්න.

ඇමුණුම 01

- "අත්ථංගතස්ස න පමාණමත්ථි - යේන නං වජ්ජු තං තස්ස නත්ථි
  සබ්බේසු ධම්මේසු සමූහතේසු - සමූහතා වාදපථාපි සබ්බේ"

- "අච්ඡි යථා වාතවේගේන ඛිත්තෝ - අත්ථං එලේති න උපේති සංඛං
  ඒවං මුනී නාමකායා විමුක්තෝ - අත්ථං එලේති න උපේති සංඛං"

ඇමුණුම 02

පහත සඳහන් ක්‍රියාකාරකම්හි යෙදෙන්න.

01. දෙන ලද ගාථා දෙක සියලු සිසුන් එක්ව සජ්ඣායනය කරවන්න.
02. දෙන ලද ගාථා දෙකෙහි අර්ථ කියවන්න.
03. ''න තේ භවං අට්ඨමං ආදියන්ති'' යන පදයේ අදහස පහදන්න.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- විසුද්ධි මග්ග - පඤ්ඤාභූමි නිද්දේස
- මජ්ඣිම නිකාය - අග්ගිවච්ඡගොත්ත සූත්‍රය, සච්චවිභංග සූත්‍රය
- චන්ද්‍රවිමල හිමි, රේරුකානේ - අභිධර්ම මාර්ගය

# 18 පාඩම

# දහසකින් එකක්වත් නොවටිනා දේ

## 01. නිපුණතාව :- 5.0

- බෞද්ධ ශික්ෂා පද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබල සම්පන්න භික්ෂු චරිතයකට මඟ සලසා ගනියි.

## 02. නිපුණතා මට්ටම :- 5.1

- සහස්සවග්ගය, පාපවග්ගය, දණ්ඩ වග්ගයන්හි ඇතුළත් ගාථාවල අර්ථ සහ දහම් කරුණු හැඳින චරිතායනයෙන් කටයුතු කරයි.

## 03. කාලපරිච්ඡේද :- 09 යි.

## 04. ඉගෙනුම් පල :-

- ත්‍රිපිටක ග්‍රන්ථ ප්‍රමාණ දන එහි ධම්ම පදය පිහිටි තැනත් ධර්මග්‍රන්ථයක් හා බෞද්ධයාගේ අත්පොතක් ලෙස පිළිගෙන ප්‍රකාශ කරයි.
- සහස්ස වග්ගයේ ගාථා ඇසුරෙන් පුද්ගල හා සමාජ ජීවිතයේ විවිධ මානයන් ධර්මානුකූලව වටහාගෙන ප්‍රකාශ කරයි.
- ධම්මපද ගාථා කටපාඩමෙන් නිවැරැදිව සජ්ඣායනය කරයි.
- ගාථාවල නිදාන කථා පදනම් කර ගනිමින් ධර්ම, අර්ථ, නිරුක්ති, කුසලතා ප්‍රකට කරයි.
- අවබෝධයක් සහිත සංයත ජීවිතයක් සකසා ගනියි.

## 05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-

I පෙර සූදානම,

- සහස්ස වග්ගය දැක්වෙන පෙළපොතෙහි ''දහසින් එකක්වත් නොවටිනා දේ'' නම් 18 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ සිසුන් දැනුවත් කරන්න.
- සහස්ස වග්ගයේ පළමු ගාථා දෙක කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් ආකාරයට ගාථා දෙක බැගින් ලියන ලද පුවරු හෝ ප්‍රදර්ශන පත්‍රිකා ප්‍රදර්ශනය කරමින් එම ගාථා ශබ්ද නගා නිවැරැදිව සජ්ඣායනය කර සිසුන් සමඟ ද සජ්ඣායනා කරන්න.
- එක් එක් ගාථාවකින් කියවෙන අදහස කුමක් ද? යන ප්‍රශ්නය පදනම් කර ගනිමින් සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- ත්‍රිපිටකය සූත්‍රපිටකය ඛුද්දක නිකාය ධම්මපදය වග්ග 26, ගාථා 423 යන තොරතුරු පැහැදිලි කරන්න.

- එක් දිනකට ගාථා දෙක බැගින් කටපාඩම් ගන්න.
- ගාථාවල දුරවබෝධ වචන අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකතු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.
- නිදාන කථාව පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේනම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.
- සංඛ්‍යාත්මක ප්‍රකාශන භාවිතයෙන් ධර්මෝපදේශ ඉදිරිපත් කර ඇති බැවින් මෙම වග්ගය "සහස්ස වග්ග" යැ'යි නම් කර ඇති බව පහදන්න.
- නිරර්ථක ජීවිතයෙන් අර්ථ සම්පන්න ජීවිතයක් ගොඩනඟා ගැනීමට සහස්ස වග්ගයෙන් ගත හැකි ප්‍රයෝජනත්, ඵලදායී දැනුම ප්‍රායෝගික ජීවිතය සරු කළ හැකි බවත්, සත්‍යය හා නිවැරැදි ස්වල්පය අසත්‍යය හා වැරැදි විශාල ගණනකට වඩා ශ්‍රේෂ්ඨ බවත් ඒත්තු ගන්වන්න.
- මිථ්‍යාවෙන් යථාර්ථය වෙන් කළ හැකි මඟ පැහැදිලි කරන්න.
- සාර්ථක ජීවිතයක ඇති අගය තහවුරු කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- අත්ථපද - නිර්වාණ ප්‍රතිසංයුක්ත අර්ථ සාධක පද
- අනත්ථපද - නිර්වාණ ප්‍රතිපක්ෂ අර්ථ විරහිත පද
- ධම්මපද - දහම් පද
- අමතපද - මරණ රහිත හෙවත් අමෘත මහා නිර්වාණය කියවෙන පදය
- උදය වසය - පඤ්චස්කන්ධයන්ගේ හටගැනීම හා නැතිවීම
- සක්කතචාරී - නිරන්තරයෙන් කයින් වචනයෙන් සංයත පැවතුම් ඇති තැනැත්තා
- චත්තාරො ධම්මා - ආයු, වර්ණ, සැප, බල යන සතර ගුණධර්ම

## 08. ගුණාත්මක යෙදවුම් :-

ඇමුණුම 01

- සහස්ස වග්ගයේ ගාථා දෙක බැගින් ලියන ලද පුවරු හෝ පත්‍රිකා අටක්
- පෙළ පොතේ දහඅටවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- ධම්මපද ගාථා නිවැරැදිව සජ්ඣායනය හා කටපාඩම
- ගාථාවල අර්ථය සරල ලෙස පැහැදිලි කිරීම
- නිදාන කථා මතකයෙන් සරලව ඉදිරිපත් කිරීම.
- ඕනෑම කරුණක වැදගත්කම හා නොවැදගත්කම තෝරා බේරා ගැනීම.
- ධම්මපද ග්‍රන්ථය පිළිබඳ අවබෝධය.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ඛුද්දක නිකාය - ධම්මපද පාළි
- ධම්මපදට්ඨ කථා

# 19 පාඩම

## පාපයට නම් බිහිසුණුය

**01. නිපුණතාව :-5.0**

- බෞද්ධ ශික්ෂා පද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබල සම්පන්න භික්ෂු චරිතයකට මඟ සලසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 5.1**

- සහස්සවග්ගය, පාපවග්ගය, දණ්ඩ වග්ගයන්හි ඇතුළත් ගාථාවල අර්ථ සහ දහම් කරුණු හැඳින චරිතායනයෙන් කටයුතු කරයි.

**03. කාලපරිච්ඡේද :-** 07 යි.

**04. ඉගෙනුම් පල :-**

- ධම්මපදයේ පාප වග්ගයේ ගාථා ඇසුරින් පාපය සහ එහි විපාකයේ බලවත්බව දැනගෙන ප්‍රකාශ කරයි.
- ධම්මපද ගාථා නිවැරැදිව සජ්ඣායනා කරයි.
- ගාථා හා නිදාන කථා පදනම් කර ගනිමින් ධර්ම, අර්ථ, නිරුක්ති, කුසලතා ප්‍රකට කරයි.
- හොඳ නරක පිළිබඳ අවබෝධයෙන් හිරි, ඔත්තප්ප යන ලෝක පාලන ධර්මවලින් පිරිපුන් චරිතයක් ගොඩනඟා ගනියි.
- ධර්මය විනය නීතිය සදාචාරය සංස්කෘතිය දැන ක්‍රියා කරයි.
- පුණ්‍යවන්ත අයෙකු ලෙස මානව ධර්ම අර්ථ සම්පන්න කරගත් සන්නිවේදකයෙක් බවට පත්වෙයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- පාප වග්ගය සඳහන්ව ඇති "පාපය නම් බිහිසුණුය" නැමැති 19 පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- පාප වග්ගයේ පළමු ගාථා දෙක කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් පරිදි ගාථා දෙක බැගින් ලියන ලද පුවරු හෝ පත්‍රිකා සිසුන්ට ප්‍රදර්ශනය කරමින් ගාථා ශබ්ද නඟා නිවැරැදිව සජ්ඣායනය කර සිසුන් සමඟ ද නැවත සජ්ඣායනය කරන්න.
- එක් එක් ගාථාවකින් කියවෙන අදහස කුමක් ද? යන ප්‍රශ්නය පදනම් කර ගනිමින් සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- පාප වග්ගයේ ගාථා දෙක බැගින් කට පාඩම් ගන්න.
- ගාථාවල දුරවබෝධ වචන හා අර්ථ අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- නිදාන කථාව පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේනම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.
- පාප, පුණ්‍ය වචන දෙකෙහි අරුත් පහදන්න.
- කර්ම හා කර්ම ඵල අතර සම්බන්ධය තේරුම් කර දෙන්න.
- පාපකර්ම හා ඒවායේ විපාකවල ස්වභාවය පෙන්වා දෙන්න.
- පාපයෙන් වැළකෙන තැනැත්තාගේ සිතෙහි පින් සිතුවිලි බලවත් වන ආකාරය සාකච්ඡා කරන්න.
- සුගතිගාමී හා දුගතිගාමී ජීවිතවල වෙනස පෙන්වා දෙන්න.
- පාපය වළක්වා ගැනීමෙන් පුද්ගල හා සමාජ ජීවිතය බබළන ආකාරය සනාථ කරන්න.
- නිදාන කථාවලින් හෙළි කරන ජීවන දර්ශනය අවධාරණය කරන්න.
- පහත සඳහන් විශේෂ වචන සඳහා අර්ථකථන සපයා දෙන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- පුඤ්ඤ - සිත පිනා යාම හෙවත් පින
- පාප - පව, පවිටු, දුෂ්ට, දුශ්චරිත
- පච්චති - විපාක දීම, පැසවීම
- මාප්පමඤ්ඤේථ - සුළුකොට නොතැකිය යුතුය
- නත්‍ථි පාපං අකුබ්බතෝ - නොකරන්නාට පවක් නැත
- අනංගනස්ස - නොකැළඹුණු සිත් ඇත්තෝ
- නප්පසහේථ මච්චු - මරණය අභිබවනය නොකළ හැක්කේය
- අප්පදුට්ඨස්ස - තමාටවත් අනුන්ටවත් දූෂට නොවූ හෙවත් නිරපරාද තැනැත්තා හට

## 08. ගුණාත්මක යෙදවුම් :-

ඇමුණුම 01

- පාපවග්ගයේ ගාථා දෙක බැගින් ලියන ලද පුවරු හෝ පත්‍රිකා හයක්
- පෙළපොතේ දහනව වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- ධම්මපද ගාථා නිවැරැදිව සජ්ඣායනය හා කටපාඩම
- ගාථාවල අර්ථය සරල ලෙස පැහැදිලි කිරීම
- නිදාන කථා මතකයෙන් ඉදිරිපත් කිරීම
- පින් - පව්, හොඳ - නරක තෝරා බේරා ගැනීමේ ඇති හැකියාව
- කර්ම කර්මඵල විශ්වාසය පිළිගැනීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ඛුද්දකනිකාය - ධම්මපද පාළි
- ධම්මපදට්ඨ කථා
- පාපතර පුද්ගලයින් මෙලොවදී ම විඳි විපාක පිළිබඳ සිද්ධි සඳහන් පුවත් පත් වාර්තා ආදිය

# 20 පාඩම

## ඔබ දඬුවමට බිය නම් අනුන් ද එසේම ය

**01. නිපුණතාව :- 5.0**

- බෞද්ධ ශික්ෂා පද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබල සම්පන්න භික්ෂු චරිතයකට මඟ සලසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 5.1**

- සහස්සවග්ගය, පාපවග්ගය, දණ්ඩ වග්ගයන්හි ඇතුළත් ගාථාවල අර්ථ සහ දහම් කරුණු හැඳින චරිතායනයෙන් කටයුතු කරයි.

**03. කාලපරිච්ඡේද :-** 08 යි.

**04. ඉගෙනුම් පල :-**

- ධම්මපදයේ දණ්ඩ වග්ගයේ ගාථා කටපාඩමෙන් නිවැරැදිව සජ්ඣායනා කරයි.
- දණ්ඩ වග්ගයේ අන්තර්ගත ගාථාවලින් ලබා දෙන ධර්මෝපදේශ ඇසුරෙන් පුද්ගල හා සමාජ සන්දර්භයේ ගුණාත්මක සංවර්ධනය අත්කර ගනියි.
- ගාථාවල නිදාන කථා පදනම් කර ගනිමින් ධර්ම, අර්ථ, නිරුක්ති, කුසලතා ප්‍රකට කරයි.
- නිරවද්‍යතා පූර්වක ජීවිතාවබෝධය සහිත හිතකාමී ජීවිතයක් ගත කරයි.
- දණ්ඩනය, හිංසනය, ඝාතනය වැනි ග්‍රාම්‍ය චර්යා බැහැර කොට සාමකාමී සමාජයක අවශ්‍යතාව උද්දීපනය කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- දණ්ඩ වග්ගය දක්වෙන පෙළ පොතෙහි "ඔබ දඬුවමට බිය නම් අනුන් ද එසේම ය" නමැති 20 වෙනි පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- දණ්ඩ වග්ගයේ පළමු ගාථා දෙක කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් ආකාරයට ගාථා දෙක බැගින් ලියන ලද පුවරු හෝ පත්‍රිකා ප්‍රදර්ශනය කරමින් එම ගාථා ශබ්ද නඟා නිවැරැදිව සජ්ඣායනය කර සිසුන් සමඟ ද සජ්ඣායනය කරන්න.
- එක් එක් ගාථාවකින් කියවෙන අදහස කුමක් ද? යන ප්‍රශ්නය පදනම් කර ගනිමින් සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- එක් දිනකට ගාථා දෙක බැගින් කටපාඩම් ගන්න.
- ගාථාවල දුරවබෝධ වචන අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකතු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.

- නිදාන කථාව පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේනම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.
- දණ්ඩවග්ගයේ දණ්ඩ යන වචනය භාවිත කර ඇති විවිධාර්ථ පහදා දෙන්න.
- ආත්මෝපමාව උපයෝගී කර ගනිමින් සුවදායී සමාජයක් ගොඩනැගිය හැකි බවත්
- අවිහිංසා සංකල්පය ලොව ජයගත හැකි අද්විතීය මඟ වන බවත්
- බාහිර අංගෝපාංගවලින් පුද්ගලයකු පිළිබඳ විනිශ්චයකට එළඹිය නොහැකි බවත්
- ආත්ම දමනය සංයමය උසස් කුසලතාවක් වන බවත්
- ලැජ්ජාව පාපයෙන් ගැළවීමට හොඳම මඟ බවත්
- ශ්‍රද්ධා, ශීල, වීර්ය, සමාධි, ධර්ම විනිශ්චය ආදිය තුළින් සසර දුක දුරු කළ හැකි බවත් පහදා දෙන්න.
- දණ්ඩ, අත්තානං උපමං කත්වා, පෙච්ච, පටිවදෙය්‍යු, සාරම්භකථා, පටිදණ්ඩා, ගෝචරං, නෙත්තිකා, උසුකාරා, තච්ඡකා වැනි වදන් සඳහා විශේෂයෙන් අර්ථ සපයන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- දණ්ඩ - දඬුවම, දණ්ඩනය
- අත්තානං උපමං කත්වා - ආත්මෝපමාව හෙවත් තමා උපමා කොට
- පෙච්ච - පරලොව
- පටිවදෙය්‍යු - නැවත පෙරළා පරොස් බස් කීම
- සාරම්භකථා - එකට එක කීම
- පටිදණ්ඩ - ආපිට දඬුවම් විඳීම
- ගෝචරං - තණ බිම
- නෙත්තිකා - ජලය ගෙන යන්නෝ
- උසුකාරා - ඊතල සාදන්නා
- තච්ඡකා - ලී වඩුවෝ

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම 01- දණ්ඩ වග්ගයේ ගාථා දෙක බැගින් ලියන ලද පුවරු හෝ පත්‍රිකා
- පෙළපොතේ විසි වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- ධම්මපද ගාථා නිවැරැදිව සජ්ඣායනය හා කටපාඩමින් කීම.
- ගාථාවේ සරල අර්ථය පැහැදිලි කිරීමේ හැකියාව.
- නිදාන කථාව පැහැදිලිව සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම.
- දණ්ඩනය, හිංසනය, විසංවාදී බව, දසවිධ විපාක යන මේවායේ අහිතකර බව හා ආත්ම දමනය, අවිහිංසාව යන සංකල්පයන්ගේ හිතකර බව අවධාරණය කිරීම.
- ජීවිතයේ නිරවද්‍යතාව පිළිබඳ ගුණාත්මක දැක්මක් පැවතීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ඇමුණුම 01 (ප්‍රවේශය සඳහා) අදාළ පුවරු හෝ පත්‍රිකාවල ඇති ගාථා
- ධම්මපදට්ඨ කථා ආශ්‍රිත නිදාන කථා

# 21 පාඩම
## බෞද්ධ දර්ශනය හෙවත් විදර්ශනාව

**01. නිපුණතාව :- 6.0**

- බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින් යථාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි.

**02. නිපුණතා මට්ටම :- 6.1**

- විදර්ශනා භාවනාව ප්‍රගුණ කරයි.

**03. කාලපරිච්ඡේද :-** 07 යි.

**04. ඉගෙනුම් පල :-**

- නිර්වාණාවබෝධයට පාදක වන ප්‍රඥාව විදර්ශනාව බව ප්‍රකාශ කරයි.
- ජීවිතය සැමදා එකලෙස සිතන පතන ආකාරයෙන් නොපවතින්නේ යැයි විශ්වාස කරන බව කියයි.
- භෞතික සම්පත් විනාශ වන අවස්ථාවලදී අවබෝධයෙන් ඉවසා දරා ගනියි.
- අට ලෝ දහමින් සිදුවන අභියෝගවලදී හැකි තරම් නොසැලී සිටීමට වෑයම් කරයි.
- දෛනික ජීවිතය කළමනාකරණය කරගනිමින් කුසලයට යොමුවුණු ජීවිතයක් ගොඩනගා ගනියි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය පිළිබඳ හැකිතාක් කරුණු සොයා ගෙන පැමිණෙන ලෙස දැනුම් දෙන්න.

II ප්‍රවේශය

- "නිච්චේ නිච්චන්ති සඤ්ඤාවිපල්ලාසො" යන පාඨය කලුලෑල්ලේ ලියා එහි අර්ථය පිළිබඳ ශිෂ්‍යයන්ගේ අවධානයට යොමු කරමින් පාඩමට පිවිසෙන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- මීට පෙර සමථ භාවනාව අධ්‍යයනයෙන් ලත් දැනුම උපයෝගී කරගෙන භාවනාව පිළිබඳ පැහැදිලි කරන්න.
- නිවන අවබෝධ කරගැනීමේ අනුපූර්ව ප්‍රතිපදාව ත්‍රිශික්ෂාව බව පැහැදිලි කරන්න.
- ත්‍රිශික්ෂාව හඳුන්වන පාඨ පාඩම් කර ගැනීමට උපදෙස් දෙන්න.
- ත්‍රිශික්ෂාව හඳුන්වා දී එයින් ප්‍රඥා ශික්ෂාව විදර්ශනාව බව පහදා දෙන්න.
- අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන දර්ශනයට අනුව තමා ගැනත් බාහිර ලෝකය ගැනත් සලකා බැලීමේ සාකච්ඡාවක් පවත්වන්න.
- ත්‍රිලක්ෂණයට අනුව සලකා බැලීමෙන් ගැටලු විසඳා ගැනීමට සහ අභියෝග ජය ගැනීමට හැකි වන බව තහවුරු කරන පැවරුම් දෙන්න.
- සංඛත ධර්ම සහ සංඛත ලක්ෂණ කවරේදැයි සාකච්ඡා කරන්න.

- ත්‍රිලක්ෂණය සංඛත ධර්මයන්ගේ පොදු ලක්ෂණ බව තහවුරු කෙරෙන රූප සටහන් පන්ති පුවරුවේ ප්‍රදර්ශනය කරවන්න.
- පුහුදුන් පුද්ගලයා මම ය මාගේ යැයි සිතාගෙන පින් පව් රැස්කරන්නේත් සසර සැරිසරන්නේත් අනිත්‍යාදිය පිළිබඳ විපර්යාස දෘෂ්ටිය නිසාය යන්න පිළිබඳ පැවරුමක් හෝ ක්‍රියාකාරකමක් දෙන්න.
- ක්ලේශ ප්‍රහාණ ක්‍රම තුන ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- අනුසය, පරියුට්ඨාන, වීතික්කම යන අවස්ථා තුනෙහි පවතින ක්ලේශයන් සීල සමාධි ප්‍රඥා හෝ සීල සමථ විදර්ශනා යන භාවනා ක්‍රමයෙන් දුරු වන ආකාරය රූප සටහන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. එම රූප සටහන පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- විදර්ශනා භාවනාවෙන් ලැබෙන ලෝකෝත්තර ප්‍රතිඵල මෙන්ම ලෞකික ප්‍රතිඵල විස්තර කරන පැවරුමක් දෙන්න.
- ප්‍රායෝගික ක්‍රියාකාරකමක් ලෙස සියල්ල අනිත්‍යයි. අනිත්‍ය වාගේ ම දුකයි. අනිත්‍ය නිසාත් දුක නිසාත් මම මගේ යැයි ගත යුත්තක් නැත, යන කල්පනාව ඔස්සේ ශිෂ්‍යයන් භාවනාවක යොදවන්න.
- තක්සේරුකරණ නිර්ණායක අනුව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- සාධන මට්ටමට ළඟා නොවූ සිසුන් වේ නම් ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක යොදවන්න.
- ත්‍රිශික්ෂාව - අනිත්‍ය,දුක්ඛ,අනාත්ම
- සමථභාවනාව සහ විදර්ශනා භාවනා අතර ඇති වෙනස තුළනාත්මකව දක්වන්න.
- අනිත්‍ය දුක්ඛ අනාත්ම පිළිබඳ පුහුදුන් ලෝකයා තුළ ඇති විපල්ලාස පහදා දෙන්න.
- කෙලෙස් පිළිබඳ අනුසය පරියුට්ඨාන වීතික්කම අවස්ථා පැහැදිලි කර දෙන්න.
- තදංග, වික්ඛම්භන, සමුච්ඡේද යන කෙලෙස් ප්‍රහාන ක්‍රම තුන පැහැදිලි දෙන්න.
- විදර්ශනාවෙන් කෙලෙසුන් සමුච්ඡේද ප්‍රහාණය වන අයුරු පහදා දෙන්න.
- විදර්ශනා භාවනාවේ ප්‍රතිඵල විමසීමට ලක් කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- තදංග - තාවකාලික
- වික්ඛම්භන - කෙටි කලක් පවතින
- සමුච්ඡේද - සපුරා බැහැරවීම

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොත,
- ගුරු මාර්ගෝපදේශය,

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- පාඩමේ එන මූලික කරුණු පිළිබඳ වගුවක් සකස් කිරීම.
- පාළි පාඨ හා ත්‍රිලක්ෂණ, සංඛත ධර්ම, විපල්ලාස ආදී සිද්ධාන්ත පිළිබඳ අර්ථාව බෝධය.
- සමථ විදර්ශනා භාවනා ක්‍රම දෙක පිළිබඳ වෙනස පැහැදිලි කිරීම.
- විදර්ශනාවේ ප්‍රතිඵල පිළිබඳ විස්තර කරීමේ හැකියාව පරීක්ෂා කිරීම.
- ඉදිරි පාඩම සඳහා සූදානම් වී පැමිණිය යුතු කරුණු නොහොත් ක්‍රියාකාරකම් නියම කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- චන්ද විමල මහා නාහිමි, රේරුකානේ, විදර්ශනා භාවනා ක්‍රමය

# 22 පාඩම

## සිහියේ සිවුකොන (සතර සතිපට්ඨානය)

**01. නිපුණතාව :- 6.0**

- බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින් යථාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි.

**02. නිපුණතා මට්ටම :- 6.1**

- විදර්ශනා භාවනාව ප්‍රගුණ කරයි.

**03. කාලපරිච්ඡේද :-** 06 යි.

**04. ඉගෙනුම් පල :-**

- සතර සතිපට්ඨානය හැඳින්වෙන පාඨය කටපාඩමින් කියයි. එහි අර්ථ දක්වයි.
- දුක්දොම්නස් නැති කර ගැනීමටත් කෙලෙසුන්ගෙන් පිරිසිදු වීමටත් නිර්වාණාවබෝධයටත් ඇති ඍජු මාර්ගය සතර සතිපට්ඨානය බව පිළිගෙන ප්‍රකාශ කරයි.
- සතර සතිපට්ඨාන භාවනාව ප්‍රගුණ කිරීමෙහි යෙදෙයි.
- කායානුපස්සනාවට අනුව මෙනෙහි කිරීමෙන් කය පිළිබඳ ආශාව දුරු කරයි. ආශාවන් සහ ඇගයීම්වලින් මිදෙයි.
- වේදනානුපස්සනාවට අනුව බලමින් දුක සැප දෙකෙහි වෙනසක් නැතිව ජීවත් වීමට පුරුදු වෙයි.
- සතිපට්ඨාන සූත්‍රයේ අන්තර්ගත කරුණු මතකයෙන් කියයි. ප්‍රභේද බෙදා දක්වයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- සතර සතිපට්ඨානයේ කියවෙන මූලික පාඨය කටපාඩම් කරගෙන එන ලෙස දැනුවත් කරන්න

II ප්‍රවේශය

- මනුෂ්‍ය ශරීරයක රූපයක් කලුලෑල්ලේ රඳවා කය පිළිබඳ හැඳින්වීමක් කිරීම.
- පටික්කූල මනසිකාරයේ එන දෙතිස් කුණපයට අනුව බෙදා දක්වන ලද රූප සටහනක් යොදාගෙන ශරීරයේ සැබෑ තත්ත්වය සාකච්ඡා කරමින් ද පාඩමට ප්‍රවේශ විය හැකිය.

**06. පාඩම් සංවර්ධනය :-**

- “ඒකායනෝ අයං භික්ඛවේ මග්ගො” යන පාඨය ආශ්‍රයෙන් සතර සතිපට්ඨාන භාවනාව හඳුන්වා දෙන්න.
- එම සූත්‍ර පාඨයේ කටපාඩම සහ අර්ථය ගන්න.
- කායානුපස්සනාවේ කර්මස්ථාන 14 හඳුන්වා දෙන්න. ඒවා කටපාඩමින් කීමට සලස්වන්න.
- එම කර්මස්ථාන 14 පිළිබඳ විස්තර සතිපට්ඨාන සූත්‍රය ආශ්‍රයෙන් සාකච්ඡා කොට ඒවායේ සවිස්තර සටහනක් පිළියෙල කරවීමට උපදෙස් දෙන්න.

  උදා:- හතරවන පටික්කූල මනසිකාරයේ දී දෙතිස් කුණපය ලියා දක්වන්න.

  මේ ආකාරයෙන් මූලික කාරණා හයේ ම ප්‍රභේද ලියවන්න.

- එම කර්මස්ථාන විපස්සනා භාවනාවට නගන ආකාරය සාකච්ඡා කරන්න.
- වේදනානුපස්සනාවේ එන වේදනාවේ නව ආකාරය කට පාඩම් ගැනීම සහ අර්ථ ගැනීම කරන්න.
- වේදනානුපස්සනාව පිළිබඳවද කායානුපස්සනාවේ කියූ විදර්ශනාවට නැගීමේ නව ආකාරය ගළපමින් පහදා දෙන්න.
- චිත්තානුපස්සනාවේ සිත පිළිබඳ 16 ආකාරය මතකයෙන් කීමට පුරුදු කරවන්න. එහි අර්ථ ද පැහැදිලි කර දෙන්න.
- එම චිත්තානුපස්සනාව නව වැදෑරුම් විදර්ශනාවට නගන ආකාරය ගළපා දක්වන්න.
- ධම්මානුපස්සනා සතිපට්ඨානයේ ප්‍රධාන ප්‍රභේද පහ මතකයෙන් කීමට පුරුදු කරවන්න.
- ධම්මානුපස්සනාවේ එක් එක් ප්‍රභේදයක අනු ප්‍රභේද හඳුන්වා දෙන්න. ඒවා ද මතකයෙන් කීමට හුරු කරවන්න.
- සෑම කාලච්ඡේදයක් අවසානයේ ම කළ පාඩම පිළිබඳ ක්‍රියාකාරකමක යොදවන්න.
- පාඩම අවසානයේ දී සමස්ත සතිපට්ඨාන සූත්‍රයේ එන කාරණා පිළිබඳ මතක සහ අර්ථාවබෝධය තක්සේරු කිරීමේ ක්‍රියාකාරකම් නියම කරන්න.
- සියලු ප්‍රභේද බෙදා දක්වන රූප සටහනක් සකස් කරවා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරවන්න.
- ඒකායනෝ අයං භික්ඛවේ මග්ගො යන ආරම්භක පාඨයේ එන සතර සතිපට්ඨානය වැඩීමේ පරමාර්ථය වටහා දීම.
- සතර සතිපට්ඨානය නාමික වශයෙන් සහ ප්‍රභේද වශයෙන් හඳුනා ගැනීම.
- ප්‍රභේදවලට සහ අනුප්‍රභේදවලට බෙදා දැක්වීම.
- කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යන අනුපස්සනා හතර මොනවාදැයි සාමාන්‍ය දැනීම සහ ඒවායේ විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- ඒකායනෝ මග්ගො - එකම මගය
- ඉරියාපථ - භාවනාවේ සතර ඉරියවු
- පබ්බය - කොටස, පුරුක, සන්ධිය
- සතිපට්ඨානය - සිහිය පිහිටුවා ගැනීම

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ විසිදෙවන පාඩම.
- සතිපට්ඨාන සූත්‍රය සම්පූර්ණයෙන් ඇති පොතක් හෝ ඡායා පිටපතක්.
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- සතර සතිපට්ඨානය හඳුන්වන පාඨයේ කටපාඩම සහ අර්ථ ගැනීම.
- ප්‍රභේද සහ අනුප්‍රභේද රූප සටහන් මගින් ඇඳ දැක්වීම.
- සතිපට්ඨාන හතරේ ප්‍රභේද මතකයෙන් කීම.
- ධම්මානුපස්සනාවේ එන ධර්ම කාරණා පිළිබඳ මතකය මැනීම.
- සූත්‍රයේ එන දේශනාපාඨ අතරින් වැදගත් යැයි සිතෙන පාඨ කට පාඩම් ගැනීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- චන්ද විමල මහා නාහිමි, රේරුකානේ, සතිපට්ඨාන භාවනා ක්‍රමය

# 23 පාඩම

## බුදු දහමේ හේතුඵල වාදය

**01. නිපුණතාව :- 7.0**

- බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර, සත්ත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවධිකමින් යුතුව, ලෝක ධර්මතා හමුවේ නො සැලී කටයුතු කරයි.

**02. නිපුණතා මට්ටම :- 7.1**

- පටිච්ච සමුප්පාද ධර්මය අධ්‍යයනය කොට හේතුඵල සමවායෙන් යුතුව කටයුතු කරයි.

**03. කාලපරිච්ඡේද :-** 06 යි.

**04. ඉගෙනුම් පල :-**

- පටිච්ච සමුප්පාද අනුලෝම පාඨය මතකයෙන් කියයි.
- සත්ත්වයාගේ දුක ඇතිවන්නේ සහ නැතිවන්නේ හේතු ඵල ක්‍රමයකට අනුව බව පිළිගෙන ප්‍රකාශ කරයි.
- පටිච්ච සමුප්පාදයේ ද්වාදසාකාරය අර්ථ සහිතව අනුපිළිවෙළින් ලියා දක්වයි.
- සමාජ දුක පටිච්ච සමුප්පාද ක්‍රමයට හෙවත් හේතුඵල ක්‍රමයට ඇතිවන ආකාරය පැහැදිලි කරයි.
- දුකක් වේදනාවක් ගැටලුවක් ඇති වූ හැම විටම පුරුද්දක් වශයෙන් ඊට හේතුව සෙවීමට පෙළඹෙයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- අවිජ්ජා පච්චයා සංඛාරා දී පාඨය කටපාඩම් කරගෙන ඒමට නියම කරන්න

II ප්‍රවේශය

- "යේ ධම්මා හේතුප්පභවා" යනාදී ගාථාව කලු ලෑල්ලේ ලියා ඊට පසුබිම් වූ අස්සජි තෙරුන්ගේ සහ උපතිස්ස පරිබ්‍රාජකයාගේ හමුව පිළිබඳ කථා පුවත ඉදිරිපත් කරමින් පාඩමට පිවිසෙයි.
- "යේ ධම්මා හේතුප්පභවා" යනා දී ගාථාව සහ අර්ථය කියා දී එයින් කියවෙන්නේ පටිච්චසමුප්පාද න්‍යාය බව පහදා දෙමින් පාඩමට පිවිසිය හැකිය.

**06. පාඩම් සංවර්ධනය :-**

- ලෝකයේ පවතින ආගම් හා ඒවායේ දර්ශන පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- පටිච්චසමුප්පාද යන වචනයෙහි අර්ථය පැහැදිලි කරදෙන්න.
- පටිච්චසමුප්පාදය යනු සාස්වත හා උච්ඡේද යන අන්ත දෙකට නොවැටී මධ්‍යයේ ගමන් කරන බෞද්ධ මධ්‍යම ප්‍රතිපදාව බව පහදා දෙන්න.

- "අස්මිං සති ඉදං හෝති" යනාදී සූත්‍රයට අනුව දුක ඇතිවන ආකාරයේත් නැතිවන ආකාරයේත් හේතුඵල ක්‍රමය පැහැදිලි කරන්න.
- අවිජ්ජා පච්චයා සංඛාරා ආදී අනුලෝම පාඨය ගෙන හැර දක්වමින් දුක ඇතිවීමේ හේතුඵල ක්‍රමයත්, අවිජ්ජායත්වේව අසේස විරාග නිරෝධා සංඛාර නිරෝධො යන ප්‍රතිලෝම පාඨය ගෙන හැර දක්වමින් දුක නැතිවීමේ හේතුඵල ක්‍රමයත් පහදා දෙන්න.

01. දීඝනිකායේ මහා නිදාන සූත්‍රයේ එන "ඉති ඛො පනෙතං ආනන්ද වේදනං පටිච්ච තණ්හා, තණ්හං පටිච්ච පරියේසනා, පරියේසනං පටිච්ච ලාභො, ලාභං පටිච්ච විනිච්ඡයො, විනිච්ඡයං පටිච්ච ඡන්දරාගො, ඡන්දරාගං පටිච්ච අජ්ඣොසානං, අජ්ඣොසානං පටිච්ච පරිග්ගහො, පරිග්ගහං පටිච්ච මච්ඡරියං, පච්ඡරියං පටිච්ච ආරක්ඛො, ආරක්ඛාධිකරණං පටිච්ච දණ්ඩාදාන, සත්ථාදානකලහවිග්ගහවිවාදතුවංතුවං පෙසුඤ්ඤමුසාවාදා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති" (දී.නි. 02 86 පිටුව) යන පාඨය පත්‍රිකාවක් මගින් සපයා දෙන්න.

02. එහි අර්ථය පාඩමට අනුව පැහැදිලි කර දෙන්න.

03. ඒ අනුව සමාජයේ පවතින දුක් කම් කටොළු මෙසේ හේතුඵල ක්‍රමයට සිදුවන ආකාරය සාකච්ඡා කරන්න.

- තක්සේරුකරණ නිර්නායකයන්ට අනුව පාඩමට අදාළව ශිෂ්‍යයන්ගේ දැනුම, අවබෝධය, කටපාඩම සහ කරුණු පහදා දීමේ හැකියාව තක්සේරුකරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- "යො පටිච්චසමුප්පාදං පස්සති සො ධම්මං පස්සති, යො ධම්මං පස්සති සො පටිච්ච සමුප්පාදං පස්සති" යනු පාඩමේ මුල ඇති පාඨයේ පෙළයි. එය එම පාඨය විස්තර කිරීමේ දී යොදා ගන්න. (ම.නි මහාහත්ථිපදොපම සූත්‍රය)
- අචේලකස්සප සූත්‍රයේ එන දුක පිළිබඳ "සයං කතං දුක්ඛං" ආදී සතර ආකාරය පහදා දීම.
- පංච නියාම ධර්ම - උතු නියාම, බීජ නියාම, කම්ම නියාම, ධම්ම නියාම, චිත්ත නියාම.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ 23 වන පාඩම.
- පටිච්ච සමුප්පාදයේ අනුලෝම ප්‍රතිලෝම පාඨය සඳහන් පිටපතක්
- ගුරු මාර්ගෝපදේශය.

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- ගාථා පාඨ සහ සූත්‍ර පාඨ අර්ථ සහිතව පාඩම් ගැනීම.
- පටිච්ච සමුප්පාද පාඨය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් කටපාඩමින් කීමේ හැකියාව.
- අනුලෝම පාඨයේ අර්ථය කීමට හැකි විය යුතුය.
- අනුලෝම ක්‍රමයට අනුව දුක ඇති වීමත් ප්‍රතිලෝම ක්‍රමයට දුක නැති වීමත් පැහැදිලි කර කිවහැකි විය යුතුය.
- සමාජගත දුක පටිච්ච සමුප්පාද ක්‍රමයට පැහැදිලි කර දක්වීමේ සමර්ථතාව.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- චන්ද විමල මහා නාහිමි, රේරුකානේ, පටිච්ච සමුප්පාද විවරණය

# 24 පාඩම

## කලොත් කර්මය භවය එතැන ය

**01. නිපුණතාව :- 7.0**

- බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර, සත්ත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවධියෙන් යුතුව, ලෝක ධර්මතා හමුවේ නො සැලී කටයුතු කරයි.

**02. නිපුණතා මට්ටම :- 7.2**

- බෞද්ධ කර්ම සංකල්ප විග්‍රහ කරමින්, තම ජීවිතය සාර්ථක කොට ශාසනික මෙහෙවරෙහි යෙදෙයි.

**03. කාලපරිච්ඡේද :-** 07 යි.

**04. ඉගෙනුම් පල :-**

- කර්මය යනු කුමක්දැයි කියවෙන ධර්ම පාඨ ගෙන හැර දක්වයි.
- හුදු ක්‍රියාව නොව චේතනාන්විතව කළ දෙයක් පමණක් කර්මය වන බව පිළිගෙන ප්‍රකාශ කරයි.
- කර්මය සහ පුනරුප්පත්තිය අතර ඇති සම්බන්ධය පැහැදිලි කරයි.
- කර්මයේ ප්‍රභේද වගු ගත කරයි.
- ''කම්මස්සකෝම්හි'' ආදි පාඨයෙන් කියවෙන තමා කරන දෙයට තමා ම වගකිව යුතුබව තේරුම් ගෙන පවට බියෙන් මහණකම පිරිසිදු කරගෙන යාමට වෑයම් කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- ධම්මපදයේ සමක වග්ගයේ පළමුවන ගාථා දෙක අර්ථ සහිතව කටපාඩම් කර ගෙන ඒමට දැනුවත් කරන්න.

**II** ප්‍රවේශය

- දස ධම්ම සූත්‍රයේ එන කම්මස්සකොම්හි කම්මදායාදො ආදී පාඨය පිළිබඳ ශිෂ්‍යයන්ගේ මතකය අවදි කොට එහි අර්ථය පැහැදිලි කොට අප හැම කෙනෙක්ම කර්ම විපාක විඳිමින් සිටින අය බව ඒත්තු ගන්වමින් පාඩමට පිවිසීම.

**06. පාඩම් සංවර්ධනය :-**

- ''චෙතනාහං භික්ඛවේ කම්මං වදාමි'' යනාදී පාඨය පැහැදිලි කරමින් කර්මය යනු කුමක් දැයි හඳුන්වා දෙන්න.
- යම් ක්‍රියාවක් කුසලයක් ද අකුසලයක් දැයි තීරණය කිරීමේ ක්‍රම පහදා දෙන්න.
- සියල්ල කර්මයෙන් සිදු නොවන බව නියාම ධර්ම ඇසුරෙන් පහදා දෙන්න.
- කර්මය හා පුනර්භවය අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධය පැහැදිලි කර දෙන්න.

- කර්මයේ ප්‍රභේද පැහැදිලි කර දී ඒවා මතක තබා ගැනීමට උපදෙස් දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායකයන්ට අනුව පාඩමට අදාළව ශිෂ්‍යයන්ගේ දැනුම, අවබෝධය, කටපාඩම සහ කරුණු පහදා දීමේ හැකියාව තක්සේරුකරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- හුදු ක්‍රියාව නොව ඒ ක්‍රියාවට පසුබිම් වූ චේතනාවම බුදු දහමේ කර්මය ලෙස සැල කෙන බවත් කර්මය කුශල හෝ අකුශල වන්නේ එම චේතනාව අනුව බවත් පැහැදිලි විය යුතුය.
- නියාම ධර්ම අනුව කර්මය යනු සියල්ල සිදු කරන එකම බල වේගය නොවන බව තහවුරු කළ යුතුය.
- ගති, කාල, උපධි හා පයෝග යන මේවායේ සම්පත්තිය හෝ විපත්තිය අනුව කර්මය විපාක දීම හෝ නොදීම තීරණය වන බව වටහා දිය යුතුය.
- කර්මයේ ප්‍රතිසන්ධි විපාක සහ ප්‍රවෘතිති විපාක ඇති බව පහදා දීම.
- කර්මය විපාක දෙන ආකාරය අනුව ප්‍රභේද දොළහකට බෙදෙන ආකාරය පිළිබඳ අවබෝධය සහ මතක තබා ගැනීම අවශ්‍ය ය.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ විසි හතරවන පාඩම,
- බ්‍රිස්ටල් බෝඩ්, ප්ලැටිග්නම්
- ගුරු මාර්ගෝපදේශය.

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- කර්මය යනු කුමක් දැයි සරලව හැඳින්වීම.
- සියල්ල කර්මයෙන් සිදු නොවන බවට සාධක වන කරුණු වගුගත කොට දැක්වීම.
- කර්මය පිළිබඳ සියලු කරුණු අනු පිළිවෙළින් රූප සටහනකින් දැක්වීම. එය පන්තියේ දී ශිෂ්‍යයන් ලවා ක්‍රියාකාරකමක් ලෙස කරවීම වැදගත්ය.
- මෙම පාඩමට අදාළ සූත්‍රපාඨ ගාථා සහ කර්ම ප්‍රභේද මතකය මැන බැලීම.
- සියල්ල කර්මයෙන් සිදු නොවේ යන්න තහවුරු කරමින් කරන කෙටි ධර්ම දේශනයක් හෝ කථාවක්.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- කර්මය සහ පුනර්භවය
- කර්මය සහ විපාක

} මූලාශ්‍රය පාදක කරගත් ග්‍රන්ථ

# 25 පාඩම

## බුදු දහමේ චරණය

**01. නිපුණතාව :- 7.0**

- බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර, සත්ත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවධිකමින් යුතුව, ලෝක ධර්මතා හමුවේ නො සැලී කටයුතු කරයි.

**02. නිපුණතා මට්ටම :- 7.3**

- ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඉගෙන, අවබෝධයෙන් කටයුතු කරයි.

**03. කාලපරිච්ඡේද :-** 06 යි.

**04. ඉගෙනුම් පල :-**

- ආර්ය අෂ්ඨාංගික මාර්ගය නම් වශයෙන් හා විස්තර වශයෙන් කියයි.
- සතර මඟ සතර ඵල ඔස්සේ නිවන් දැකිය හැක්කේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් පමණක් බව පිළිගනියි.
- සීලය ආරක්ෂා කිරීම ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ අංකයක් බව සලකා ශික්ෂාපද ගෞරවයෙන් රකියි.
- ආර්ය මාර්ගයේ දෙවන පියවර වූ සිත සමාධිගත කර ගැනීමේ ඉලක්කයෙන් භාවනාවල යෙදෙයි.
- මුළු පැවිදි ජීවිතයම ආර්ය මාර්ගයේ ගමන් කිරීමක් විය යුතු බැවින් නිස්සරණාධ්‍යාශයෙන් මහණදම් පුරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- "ඉදං ඛොපන භික්ඛවේ දුක්ඛ නිරෝධගාමිණී පටිපදා අරියසච්චං" යනාදී වශයෙන් පාඩමේ එන පාඨය වන පොත් කර ගෙන එන ලෙස දැන්වීම.

**II** ප්‍රවේශය

- කාම සුඛල්ලිකානු යෝගයට යන මාර්ගය සහ ශරීරයට දුක් දෙන තාපස මාර්ග දෙක මැදින් ගමන් කරන මාර්ගයක් හා ඒ මාර්ගය කෙළවර වන නිර්වාන නගරය රූප සටහනකින් ඇඳ මධ්‍යම ප්‍රතිපදාව හඳුන්වා දෙමින් පාඩම පිවිසෙයි.

**06. පාඩම් සංවර්ධනය :-**

- බෝසතාණන් වහන්සේ කම් සැප අත්හැර දුෂ්කර ක්‍රියාව ද අත්හැර මැදුම් පිළිවෙතෙහි ගමන් කොට බුද්ධත්වයට පත්වූ පුවත විස්තර කර දෙන්න.
- අන්ත දෙකට නොවැටී ගමන් කිරීම මධ්‍යම ප්‍රතිපදාව බවත් එය ආර්ය අෂ්ඨාංගික මාර්ගය බවත් පහදා දෙන්න.

- සත්තිස් බෝධි පාක්ෂික ධර්ම නම් කොට ඒවා කට පාඩම් කරවන්න, ආර්ය අෂ්ඨාංගික මාර්ගය එම ධර්ම තිස් හතෙන් අටක් බව පෙන්වා දෙන්න.
- බුදුදහමේ පරම නිෂ්ටාව වන නිවන් අවබෝධය ක්‍රමානුකූල ප්‍රතිපදාවක ගමන් කිරීමෙන් ම සිදු කර ගත යුක්තක් බවත් එම ප්‍රතිපදාව ආර්ය අෂ්ඨාංගික මාර්ගය බවත් පහදා දෙන්න.
- ආර්ය සත්‍ය හතරෙන් දුක්ඛ සත්‍යය අභිඤ්ඤෙය්‍ය හෙවත් පිරිසිඳ දත යුක්තක් බවත්, සමුදය සත්‍යය පහාතබ්බ හෙවත් දුරු කළ යුක්තක් බවත්, සමුදය සත්‍යය සච්ඡිකාතබ්බ හෙවත් ප්‍රත්‍යක්ෂයෙන් අත්දැකිය යුක්තක් බවත්, මාර්ග සත්‍යය භාවේතබ්බ හෙවත් පුරුදු පුහුණු කළ යුතු බවත් පහදා දෙන්න.
- ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග අට එකින් එක සවිස්තරව වටහා දෙන්න.
- සංයුක්ත නිකායේ ජටා සූත්‍රයේ එන

  සීලේ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ - චිත්තං පඤ්ඤං ච භාවයං
  ආථාපි නිපකෝ භික්ඛු - සෝ ඉමං විජටයේ ජටං

යන ගාථාව අර්ථ සහිතව කියා දෙන්න.

- ඒ ඇසුරින් බෞද්ධ ප්‍රතිපදාව ත්‍රිශික්ෂාවට අනුව පිළිවෙළින් අනුගමනය කළයුතු අකාරය පැහැදිලි කරන්න. එහිදී ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඒ ත්‍රිශික්ෂාවන්ට බෙදෙන ආකාරය වටහා දෙන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- බැහැර කළ යුතු අන්ත දෙක - අත්තකිලමථානු යෝගය සහ කාමසුඛල්ලිකානු යෝගය

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ විසිපහ පාඩම,
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- කර්මය යනු කුමක් දැයි සරලව හැඳින්වීම.
- සියල්ල කර්මයෙන් සිදු නොවන බවට සාධක වන කරුණු වගුගත කොට දැක්වීම.
- කර්මය පිළිබඳ සියලු කරුණු අනු පිළිවෙළින් රූප සටහනකින් දැක්වීම. එය පන්තියේ දී ශිෂ්‍යයන් ලවා ක්‍රියාකාරකමක් ලෙස කරවීම වැදගත්ය.
- මෙම පාඩමට අදාළ සූත්‍රපාඨ ගාථා සහ කර්ම ප්‍රභේද පිළිබඳ මතකය මැන බැලීම.
- සියල්ල කර්මයෙන් සිදු නොවේ යන්න තහවුරු කරමින් කරන කෙටි ධර්ම දේශනයක් හෝ කථාවක්.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- චතුරාර්ය සත්‍ය, චන්ද විමල මහා නාහිමි, රේරුකානේ

# 26 පාඩම
## මිහින්තලාවයි දහම් අමාවයි

**01. නිපුණතාව :- 8.0**

- ශාසන ඉතිහාසය හැඳින, බෞද්ධ ආගමික වත්පිළිවෙත් හා ඓතිහාසික උරුමය ආරක්ෂා කිරීමට පියවර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 8.1**

- මහින්දාගමනය සහ ශ්‍රී ලංකාවේ ශාසන ව්‍යාප්තිය හැඳින, ශාසන චිරස්ථිතිය උදෙසා කටයුතු කරයි.

**03. කාලපරිච්ඡේද :-** 04 යි.

**04. ඉගෙනුම් පල :-**

- මහින්දාගමනය සහ ශ්‍රී ලංකාවේ ශාසනික ව්‍යාප්තිය විස්තර කරයි.
- මහින්දාගමනයෙන් ශ්‍රී ලංකාවේ ශාසනික ව්‍යාප්තිය සිදු වූ බව පිළිගෙන ප්‍රකාශ කරයි.
- මහින්දාගමනයෙන් සිදු වූ ශාසනික සේවාව ලැයිස්තුගත කරයි.
- අතීත උරුමයන් රැක ගැනීමට කැප වෙයි.
- ශාසනික ව්‍යාප්තියට ක්‍රියාකාරීව දායක වෙයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- මිහිඳු මාහිමියන් සහ ධර්ම දූත පිරිස ඇතුළත් පින්තූර සොයාගෙන ඒමට උපදෙස් දෙන්න.
- එම පිරිසගේ නම් සහ "සමණාමයං මහා රාජ" යන ගාථාව ද පාඩම් කර ගෙන එන ලෙස දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- මිහිඳු හිමියන් මිහින්තලාවට වැඩමවීම දැක්වෙන සිතුවමක් ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න.
- "සමණා මයං මහාරාජ" යන ගාථාව සිසුන් සමඟ සජ්ඣායනා කර එහි අර්ථය සාකච්ඡා කරමින් පාඩම ආරම්භ කරන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- මහින්දාගමනයට පෙර බුදුරජාණන් වහන්සේගේ වැඩමවීම ඇතුළු බුදුදහම පිළිබඳව ආරංචිය ලංකාවේ පැතිර තිබූ බවට ඇති සාධක පැහැදිලි කරන්න.
- අශෝක රජතුමා සහ දේවානම් පියතිස්ස රජු අතර මහින්දාගමනයට පෙර ඇති වී තිබුණු මිත්‍ර සම්බන්ධතාව විස්තර කරන්න.
- මහින්දාගමනය පිළිබඳ පුවත විස්තර කොට එහි වැදගත් කරුණු ශිෂ්‍යයන්ට මතක තබාගැනීමට උපදෙස් දෙන්න.
- ශ්‍රී මහා බෝධියත් සමග මෙහෙණි සස්න ලක්දිවට පැමිණි ආකාරය සාකච්ඡා කරන්න.

- මහින්දාගමනය සිංහල සංස්කෘතියේ ආරම්භය ලෙස සැලකිය හැකි බවත් එයින් ලංකාවේ සිදු වූ සංස්කෘතික සාමාජික හා දේශපාලනමය අභිනව සංවර්ධනය පිළිබඳවත් විමර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- බුදුසමය පැමිණීමට හේතු වූ අශෝක රජුගේ විදේශීය ධර්ම ප්‍රචාරක මෙහෙවර පිළිබඳව ශිෂ්‍යයන්ට කරුණු සිහිපත් කර දෙන්න.
- මහින්දාගමනය පිළිබඳ තොරතුරු මහාවංසයේ 13 සිට 20 දක්වා පරිච්ඡේදවල දැක්වේ.
- මිහින්තලා පර්වතයට එම නම ලැබී ඇත්තේ මිහිඳු හිමියන්ගේ නම හා සම්බන්ධ වීමෙනි. (මිහිඳු+ තලය = මිහින් තලය)
- මිහින්තලාවෙහි අම්බස්තල චෛත්‍ය ඉදිවීමත් එම පර්වතය පූජනීය ස්ථානයක් බවට පත්වීමත් නිසා එය චේතිය ගිරි හෙවත් සෑගිරි නමින් ද ව්‍යවහාරයට පත් විය.
- තත්ථ මාසං වසිත්වාන, ජෙට්ඨමාසස්සුපොසථෙ
  ථෙරො චතුහි ථෙරෙහි, සුමනෙනාථ භණ්ඩුනා
  සද්ධිං තෙන ගහට්ඨෙන, න රතො ඤාතිහෙතුනා
  තස්මා විහාරා ආකාසං, උග්ගන්ත්වා සො මහිද්ධිකො
  ඛණෙනෙව ඉධාගම්ම, රම්මෙ මිස්සක පබ්බතෙ
  අට්ඨාසි විලූකූටම්හි, රුචිරම්බත්ථලෙ වරෙ

  (එහි (මෑණියන් විසූ වෙදිස නුවර) මසක් වැස පොසොන් පුන් පොහෝ දවස්හි ස්ථවිර තෙමේ තෙරුන් සතර දෙනා ය සුමන සාමණේර ය භණ්ඩුක නම් ඒ අනාගාමී කුමාරය ය යන මොවුන් හා කැටිව නෑයින් බලා එහි නොඇලුනු සේක් ඒ විහාරයෙන් අහසට නැගී මහා ඍද්ධි ඇතිසේක් ක්ෂණයකින් ම මෙහි වැඩ සිත්කළු මිස්සක පර්වතයෙහි පියල් කුළ උතුම් රුචිර අඹතලයෙහි වැඩ සිටි සේක)- මහාවංශය 13 පරිච්ඡේදය - 18,19,20 ගාථා - ශ්‍රී සුමංගල නාහිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඩිතුමන්ගේ පරිවර්තනය.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම 01 - "සමණාමයං මහා රාජ - ධම්මරාජස්ස සාවකා
  තවෙව අනුකම්පාය - ජම්බුදීපා ඉධාගතා" ගාථාව ලියන ලද පුවරුව
  (මහාවංශය 14 පරිච්ඡේදය - 09 ගාථාව)
- පෙළ පොතේ විසිහය වන පාඩම,

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- මිහිඳු හිමියන් ඇතුළු ධර්මදූත පිරිස ලක්දිවට වැඩමවීම පිළිබඳ පුවත පන්තියේ දී විස්තර කරන්න.
- අශෝක රජතුමාගෙන්, දෙවන පෑතිස් රජතුමාගෙන් සහ මිහිඳු හිමියන්ගෙන් ලංකාවේ බුදු සසුන පිහිටු වීමට ඉටු වූ මෙහෙවර වෙන වෙනම ලයිස්තු ගතකරන්න.
- මහින්දාගමනය හෙවත් බුදු සසුන ලක් දිවට ලැබීම නිසා සිංහල සංස්කෘතියේ ඇති වූ නවෝදය පිළිබඳ රචනාවක් ලියන්න.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ලංකාවේ බුදුසමයේ ඉතිහාසය - රාහුල හිමි, වල්පොල.
- ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය.
- මහාවංශයේ 13 සිට 20 වෙනි පරිච්ඡේද දක්වා.

# 27 පාඩම
## මහතෙර සසුනෙන් බිඳී ගිය වාදය - මහායානය

**01. නිපුණතාව :- 8.0**

- ශාසන ඉතිහාසය හැඳින, බෞද්ධ ආගමික වත්පිළිවෙත් හා ඓතිහාසික උරුමය ආරක්ෂා කිරීමට පියවර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 8.2**

- භාරතීය මහායාන බුදුදහමේ ව්‍යාප්තිය හැඳින, අවබෝධයෙන් කටයුතු කරයි.

**03. කාලපරිච්ඡේද :-** 04 යි.

**04. ඉගෙනුම් පල :-**

- මූලික සංඝ පරම්පරාව කලකදී බෙදීයාමට හේතු වූ කාරණා සහ බෙදී ගිය ආකාරය ගැන දැනුවත්ව ප්‍රකාශ කරයි.
- භාරතීය මහායාන බුදුදහමේ ව්‍යාප්තිය පියවර වශයෙන් ගෙනහැර දක්වයි.
- වර්තමානයේ ද ථෙරවාද මහායාන සම්ප්‍රදාය දෙක පැවතීගෙන යන බව පිළිගෙන ප්‍රකාශ කරයි.
- මහායාන බුදු දහමේ මූලික කරුණු ලැයිස්තුගත කරයි.
- සංඝ සාමග්‍රිය අගයමින් ශාසනිකව සහයෝගයෙන් කටයුතු කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- ලෝකයේ ථෙරවාදී බෞද්ධ රටවල් සහ මහායාන බෞද්ධ රටවල් මොනවාද? ඒ රටවල්වල ඒ සම්ප්‍රදාය දෙක අතර අද පෙනෙන්නට තිබෙන සමානකම් සහ වෙනස්කම් මොනවාද? යන තොරතුරු සොයාගෙන ඒමට සිසුන් යොමු කරන්න.

II ප්‍රවේශය

- ථෙරවාදය යනු ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගී වූ මහාකාශ්‍යප තෙරුන් ප්‍රමුඛ 500ක් මහ තෙරුන් වහන්සේලා විසින් සම්මත කරගෙන නොවෙනස්ව පවත්වාගෙන ආ සම්ප්‍රදාය සේම බුදු පසේබුදු මහරහත් යන තුන්තරා බෝධියෙන්ම නිවන් දැකිය හැකිය යැයි පිළිගන්නා සම්ප්‍රදාය බවත්
- මහායානය යනු දෙවන සංගීතියෙන් කැඩීගිය මහාසාංඝිකයන්ගෙන් ඇරඹුණා වූ ද බුද්ධත්වයෙන් ම නිවන් දැකිය යුතුය යන මතයෙහි පිහිටියාවූ ද සියලු දෙනාම බෝධිසත්වයන් ලෙස ප්‍රතිපදාව රැකිය යුතු යැයි පිළිගන්නා වූ ද සම්ප්‍රදාය බවත් පහදා දෙමින් පාඩමට පිවිසෙන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- බුදුරදුන් ජීවමාන සමයෙහි පටන් සංඝ සමාජයේ යම් යම් මතවාද ඇති වූ නමුත් බෙදීමකින් තොරව පැවතීගෙන ආ සංඝසාසනය දෙවන සංඝායනාවෙන් පසු නිකාය දෙකකට බෙදීගිය ආකාරය සාකච්ඡා කරන්න.

- සිවුවන ධර්ම සංසායනාව සහ එහි දී ලියැවුණු විභාෂානම් අටුවා ග්‍රන්ථ පිළිබඳව පැහැදිලි කරන්න.
- මහායානයේ මූලික ඉගැන්වීම් වන ධර්ම සූත්‍ර දහය, දස භූමි සංකල්පය, පාරමිතා සංකල්පය, සහ ත්‍රිකාය සංකල්පය පිළිබඳ හඳුන්වා දී එහි එන වැදගත් කරුණු සිහිතබා ගැනීමට උපදෙස් දෙන්න.
- බෝධිසත්ව සංකල්පය පිළිබඳ කරුණු පහදා දී සාකච්ඡාවට භාජනය කරන්න.
- මහායානය සංවර්ධන කළ පඬිවරු සහ ථෙරවාදී සම්ප්‍රදාය සහ මහායාන සම්ප්‍රදාය අතර පවත්නා සමාන අසමානතා පිළිබඳ ව ද සාකච්ඡාකොට කරුණු මතක තබා ගැනීමට උපදෙස් දෙන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- දෙවන සංගායනාවට හේතු වූ වජ්ජි පුත්ත භික්ෂූන්ගේ දස වස්තුව.

දසඅකැප වස්තු

| | | |
|---|---|---|
| 01. | සිංගිලෝණකප්ප | :- අඟක ලුණු තබා ගනිමින් ආහාරයට ගැනීම කැප ය. |
| 02. | ද්වංගුලකප්ප | :- ඉර හැරී හෙවනැල්ල අඟල් දෙකක් වැටෙන තුරු ආහාරය වැළඳීම කැප ය. |
| 03. | ගාමාන්තරකප්ප | :- වරක් වළඳා අවසන් කොට තවත් ගමකට ගොස් දන් වැළඳීම කැප ය. |
| 04. | ආවාසකප්ප | :- සීමාව තුළ පිහිටි කුඩා ආවාසයන්හි වෙන වෙන ම පොහොය කිරීම කැප ය. |
| 05. | අනුමතිකප්ප | :- එක් සීමාවක් ඇතුළත වාසය කරන භික්ෂූන්ගේ කැමැත්ත නොගෙන වෙන් වෙන් වශයෙන් පොහොය කොට නැවත කැමැත්ත ලබාගැනීම කැප ය. |
| 06. | ආචිණ්ණකප්ප | :- කැප අකැප දෙයක් පිළිබඳ නොසලකා චිරාගත දේ පිළිගැනීම කැප ය. |
| 07. | අමථිතකප්ප | :- කිරිත් නොවූ දීකිරිත් නොවූ කිරි අවේලාවෙහි වැළඳීම කැප ය. |
| 08. | ජලෝගිකප්ප | :- රා බවට නොපැමිණි මී රා පානය කිරීම කැප ය. |
| 09. | අදසක නිසීදනකප්ප | :- වාටියක් නොමැතිව අඳනය පරිහරණය කැප ය. |
| 10. | ජාතරූපරජතකප්ප | :- රන් රිදී මිල මුදල් පිළිගැනීම කැප ය. |

## 08. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

- මූලික සංඝසාසනය කලකදී බෙදීයාමට හේතු වූ කාරණා සහ බෙදී ගිය ආකාරය පිළිබඳ පන්තිය ඉදිරියේ විස්තරයක් කරන්න.
- මහායානයේ මූලික ඉගැන්වීම් පිළිබඳ සටහනක් පිළියෙල කරන්න.
- දස භූමි, විභාෂාත්‍රය සහ මහා යාන පාරමිතා මතකයෙන් කියන්න.
- මහායාන සම්ප්‍රදාය සහ ථෙරවාද සම්ප්‍රදාය අතර වෙනස පැහැදිලිකරමින් රචනයක් ලියන්න.
- මහායානයේ මූලික කරුණු වගුවක් සකස් කොට ප්‍රදර්ශනය කරන්න.

## 09. වැඩිදුර පරිශීලනයට :-

- ලක්දිව මහායාන අදහස් - සාසනරතන හිමි, මොරටුවේ.
- ආගම හා සමාජය - පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ.

# 28 පාඩම

## දහමත් දැන දෙසුමත් දැන දහම් දෙසමු

**01. නිපුණතාව :- 8.0**

- ශාසන ඉතිහාසය හැඳින, බෞද්ධ ආගමික වත්පිළිවෙත් හා ඓතිහාසික උරුමය ආරක්ෂා කිරීමට පියවර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 8.3**

- ආගමික කටයුතු පිළිබඳ අධ්‍යයනය කොට, වත් පිළිවෙත්වල නිරත වෙයි.

**03. කාලපරිච්ඡේද :-** 07 යි.

**04. ඉගෙනුම් පල :-**

- ධර්ම දේශනා, මතක ධර්ම දේශනා, අනුමෝදනා ආදී විවිධ අවස්ථාවන්හි දේශනා පවත්වන ආකාරය පිළිබඳව දැනුවත්ව ප්‍රකාශ කරයි.
- ධර්ම දේශකයෙක් බුද්ධ ගෞරවයෙන් ධර්ම ගෞරවයෙන් හා මනා සූදානමකින් ධර්ම දේශනා කළ යුතුබව පිළිගෙන ප්‍රකාශ කරයි.
- ධර්ම දේශක ගුණාංග අනුගමනය කරමින් ධර්ම දේශනා පවත්වයි.
- භික්ෂුවක් වශයෙන් ධර්ම දේශනා කිරීම තමාට පැවරුණු අනිවාර්ය වගකීමක් ලෙස සලකා කැපවීමෙන් කටයුතු කරයි.
- තමනුත් ධර්මානුකූලව පවතිමින් අනුනුත් ධර්මානුකූලව පැවතීමට යොමුකරවයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- කිසියම් මාතෘකාවක් යටතේ කෙටි ධර්ම දේශනාවක් පැවැත්වීමට සෑම පැවිදි ශිෂ්‍යයෙකුට ම සූදානමින් පැමිණෙන ලෙස දන්වන්න.

II ප්‍රවේශය

- ශිෂ්‍යයෙකු ලවා සූදානම් වූ ධර්ම දේශනාවක් පවත්වන්ට සලස්වා අනතුරුව එහි ගුණ දොස් විමසමින් පාඩමට පිවිසෙන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- ධර්මය ලෝකයාට දේශනා කිරීමේ වැදගත්කම පැහැදිලි කර දෙන්න.
- සමාජයේ ධර්ම කථිකයන් සේ පිළිගැනෙන විවිධ ආකාර පහදා දී ඒ අතරින් සැබෑ ධර්ම කථිකයා කවුරුදැයි සාකච්ඡා කරන්න.
- ධර්ම දේශනාව ධර්ම ගෞරවයෙන් සිදු කළ යුත්තක් බවත්, එය සූදානම්ව සැලකිල්ලෙන් කළ යුතු බවත් පාඩමේ සඳහන් සූත්‍රධර්ම ඇසුරින් ශිෂ්‍යයන්ට අවධාරණය කරන්න.
- ධර්ම දේශකයෙකු වෙත තිබිය යුතු ගුණාංග පහ පැහැදිලි කර දෙන්න.

- කඨිනය යනු කුමක් දැයි ශිෂ්‍යයන්ට හොඳින් පහදා දෙන්න.
- වස් විසීමේ පිළිවෙත ශිෂ්‍යන්ට පහදා දෙන්න.
- කඨිනය පූජාකිරීම සහ භික්ෂුව කඨින ඇතිරීම කෙසේ සිදු කරන්නේ දැයි සාකච්ඡා කරන්න.
- කඨිනයක් ලබන භික්ෂුවට ලැබෙන ආනිසංස පැහැදිලි කර දෙන්න.
- පාඩමේ දක්වා ඇති පාඨ ඇසුරු කරගෙන මතක ධර්ම දේශනාවක් පැවැත්වීම සඳහා පුහුණුවීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
- දානාදී පින්කම්වලදී අනුමෝදනා දේශනාවක් පවත්වන ආකාරය පාඩමේ සඳහන් පාඨ යොදා ගෙන ශිෂ්‍යයන්ට ප්‍රගුණ කරවන්න.
- ධර්ම දේශනාවක් පැවැත්වීමේ දී ශ්‍රාවකයාගේ සිත් තුළ එම ධර්මය කාවැදීමට අනුගමනය කළ යුතු සච්චවිභංග සූත්‍රයේ සඳහන් ක්‍රමවේද හත පැහැදිලි කර දෙන්න.
  සැ.යු. - මෙය හුදෙක් කරුණු ඉගැන්වීමේ පාඩමක් නොව ධර්ම දේශනා පුහුණු කිරීමේ උපදේශක පාඩමක් ලෙස සලකා මෙහි දක්වා ඇති පියවරයන් ප්‍රායෝගිකවම පුහුණු කරවිය යුතුය. ඒ සඳහා හැකි හැම විටම අමතර කාලච්ඡේද හෝ අමතර වෙලාවන් යොදාගෙන කැපවීමකින් කළ යුතු බව යෝජනා කෙරේ.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- ධර්ම දේශකයන් හතර දෙනා - ධම්ම කථික සූත්‍රය අං.නි. 02, 266 පිටුවේ සඳහන් වේ.
- සකස්ව දහම් දෙසීම - සීහ සූත්‍රය අං.නි. 03, 194 පිටුවේ සඳහන් වේ.
- ආනුපුබ්බී කථා - උපාලි සූත්‍රය ම.නි 02, 60 පිටුවේ සඳහන් වේ.
- ධර්ම දේශක ගුණාංග - උදායී සූත්‍රය අං.නි 03, 300 පිටුවේ සඳහන් වේ.
- වස්විසීම, සතිකරණය - වස්සූපනායිකක්ඛන්ධකය, මහාවග්ග පාළිය 01.
- කඨින සහ කඨිනය ඇතිරීම - කඨිනක්ඛන්ධකය, මහාවග්ග පාළිය 02.
- කඨිනානිසංස නාගිතාපදානය - කඨිනවංසය - යක්කඩුවේ ප්‍රඥාරාම හිමි.
- මතක ධර්ම දේශනාව සඳහා යොදා ගත හැකි වෙනත් සූත්‍ර -
  - සල්ල සූත්‍රය, සුත්තනිපාතය 182 පිටුව.
  - උරග සූත්‍රය, සුත්තනිපාතය 06 පිටුව.
  - උරග පේතවස්තුව - පේතවත්ථු 18 පිටුව.
- ඉහත සඳහන් සූත්‍ර ආශ්‍රය කරගෙන ධර්ම දේශනාව පිළිබඳව ප්‍රායෝගික පුහුණු වීම් කරවන්න.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ විසි අටවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- ලෝකයාට දහම් දෙසීමේ වැදගත් කම කවරේ දැයි විස්තර කරන්න.
- ධර්ම දේශනාව වරදවා පවත්වන ධර්ම කථිකයන් කවුරුද, සැබෑ ධර්ම කථිකයා කවුරුදැයි පැහැදිලි කරන්න.
- ධර්ම දේශනා ගුණාංග කෙටියෙන් පැහැදිලි කරන වගුවක් සකස් කරන්න.
- වස් එළඹීම සහ සතිකරණය සිදුකරන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.
- කඨිනය යනු කුමක් දැයි හඳුන්වා කඨින විනය කර්මය සිදු කරන ආකාරය පැහැදිලි කරන්න.

- කඨිනයක් ලබන භික්ෂුවට ලැබෙන පඤ්චවිධ ආනිසංස පැහැදිලි කරන්න.
- කඨිනානිසංස දේශනාවක් ශිෂ්‍ය සමිතියේ දී සැකෙවින් පවත්වන්න.
- ශිෂ්‍ය සමිතියේ ධර්ම දේශනා වාරයේ දී වරින් වර මංගල දේශනා අවමංගල දේශනා අනුමෝදනා දේශනා පුහුණු වී පවත්වන්න.
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රය - අං.නි 05, 234 පිටුව.
  සිඟාලෝවාද සූත්‍රය - දීඝ.නි 03, 288 පිටුව.
  මංගල සූත්‍රය - ඛුද්දක නිකාය 01 ඛුද්දක පාඨ, 06 පිටුව.
  පත්තකම්ම සූත්‍රය - අං.නි 02, 124 පිටුව.
  චූල්ලකම්ම විභංග සූත්‍රය - ම.නි 03, 332 පිටුව.
  පරාභව සූත්‍රය - සුත්ත නිපාතය, 36 පිටුව.
  වසල සූත්‍රය - සුත්ත නිපාතය, 44 පිටුව. ආදී සූත්‍ර හදාරා පොහෝදා

දේශනා හෝ ශිෂ්‍ය සමිතියේ දේශනා පවත්වන්න.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- බණ කියන හැටි, සීලරතන නාහිමි, හෙණ්ඩියගල.

# 29 පාඩම

## රජු දැහැමි වේ නම් රට දැහැමි වේ ම ය

**01. නිපුණතාව :- 9.0**

- සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝගි කොටගෙන, ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 9.1**

- බෞද්ධ, දේශපාලනය, ආර්ථික දර්ශනය, හැඳින යහපත් පාලනයකට දායක වෙයි.

**03. කාලපරිච්ඡේද :-** 04 යි.

**04. ඉගෙනුම් පල :-**

- බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති මොනවාද යන්න පැහැදිලි කරයි.
- නායකත්ව අවස්ථාවන්ට මුහුණ දීමේ දී බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ගුරු කොට ගත හැකි බව පෙන්වාදෙයි.
- දස සක්විති වත්, දස රාජ ධර්ම, සප්ත අපරිහානිය ධර්ම, සතර සංග්‍රහ වස්තු ලැයිස්තුගත කරයි.
- නිවැරැදි නායකත්ව ලක්ෂණවලට ගරු කරයි.
- දෛනික ක්‍රියාකාරකම්හි දී නායකත්ව ලක්ෂණ පෙන්වයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- පෙළ පොතෙහි 29 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- දස සක්විති වත්, දස රාජ ධර්ම, සප්ත අපරිහානිය ධර්ම, සතර සංග්‍රහ වස්තු යන බෞද්ධ පාලන ප්‍රතිපත්ති ඇසුරෙන් නායකත්වය හා ධර්මිකත්වය උදෙසා ඇති වැදගත්කම පෙන්වා දෙමින් සාකච්ඡාව මෙහෙය වන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අතර දස සක්විති වත්, දස රාජ ධර්ම, සප්ත අපරිහානිය ධර්ම, සතර සංග්‍රහ වස්තු වැදගත් වන බව පැහැදිලි කරන්න.
- සිගාලෝවාද සූත්‍රය, චක්කවත්ති සිහනාද සූත්‍රය, රාජෝවාද ජාතකය යන මූලාශ්‍රයවල බෞද්ධ පාලන ප්‍රතිපත්ති ඇතුළත් වන බව සාකච්ඡා කරන්න.
- සදාචාරවත් සමාජයක් බිහිවීමේ පදනම ධාර්මික රාජ්‍ය පාලනය බව පැහැදිලි කරන්න.

- පාලකයා ජනතාවට පියෙකු ලෙස කටයුතු කළයුතු බව පැහැදිලි කරන්න.
- කිසියම් රාජ්‍යයක ස්ථාවරත්වය හෝ අස්ථාවරත්වය රඳා පවතින්නේ පාලකයන්ගේ ක්‍රියා කලාපය අනුව බව පැහැදිලි කරන්න.
- රජු දැහැමි වුවහොත් සියලුම ජනයා සුවසේ ජීවත් වනබව උම්මාදන්ති ජාතකයේදී ද අවධාරණය කර බව විස්තර කරන්න.
- සබ්බං රට්ඨං සුඛං සේති - රජා චේ හෝති ධම්මිකෝ" යන පාඨය කටපාඩම් කරීමට උපදෙස් දෙන්න.
- ගාවං චේ තර මානානං - උජුං ගච්ඡති පුංගවො යන ගාථාව කටපාඩම් කරීමට උපදෙස් දෙන්න.
- ගව නායකයා ඇදට යනවිට සෙසු ගවයන් ද ඇදට ගමන් කරයි. රාජ්‍ය සංකල්පයේ ද රජු වැරැදි මාර්ගයක් ඔස්සේ රට පාලනය කරනවිට ඔහු වටා සිටින සෙසු පිරිස් ද වැරැදි දේ කරමින් රටපුරා අධාර්මිකත්වය, ප්‍රචණ්ඩත්වය, දූෂණය ඇති කරවමින් ක්‍රියා කරන බව පෙන්වා දෙන්න.
- දස සක්විති වත් නිවැරැදිව පාඩම් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දස රාජ ධර්ම නිවැරැදිව පාඩම් කර ගැනීමට උපදෙස් දෙන්න.
- "දානං සීලංච පරිච්චාගං - අජ්ජවං මජ්ජවං තපං" ගාථාව පාඩම් කර ගැනීමට උපදෙස් දෙන්න.
- සප්ත අපරිහානීය ධර්ම පාඩම් කර ගැනීමට උපදෙස් දෙන්න.
- බුද්ධකාලීන වජ්ජි සමූහාණ්ඩුව ස්ථාවර ව පැවතියේ මෙම සප්ත අපරිහානීය ධර්ම අනුගමනය කළ නිසා බවත් එහි වැදගත්කමත් පෙන්වා දෙන්න.
- සතර සංග්‍රහ වස්තු පාඩම් කර ගැනීමට උපදෙස් දෙන්න.
- සතර සංග්‍රහ වස්තු නිවැරැදිව පැහැදිලි කර දෙන්න.
- රාජ්‍යය පාලකයා සියල්ලන්ට සමානත්මතාවෙන් හා ජාති, කුල, ආගම් ආදිය මත ජනතාව වර්ග නො කොට සියල්ලන්ට සමාන ව සැළකිය යුතු බව පෙන්වා දෙන්න.
- රාජ්‍යය පාලනයේ ධාර්මික පාලන රටාවක් අනුගමනය කළයුතු බව
- රාජ්‍යය පාලනය ධර්මයට අනුව කළ යුතු බව
- නායකයෙකු අවස්ථෝචිතව නිවැරැදි තීරණ ගනිමින් කටයුතු කළයුතු බව
- පරිත්‍යාගශීලීව කටයුතු කිරීමෙන් අනුන් දියුණුව සලසාගන්නා බව පැහැදිලි කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :

| | | |
|---|---|---|
| මූලධනය | - | ප්‍රාග්ධනය |
| බිත්තර වී | - | නැවත වගාකිරීම සඳහා යොදාගන්නා වී |

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ විසිනවය පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- තමා තුළ නායකත්ව ලක්ෂණ ගොඩනගා ගැනීමේ දී බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ඉවහල් කර ගත හැකි අන්දම පෙන්වා දෙන්න
- නිවස තුළ ද නිවැරැදි නායකත්වයක් ගොඩනැගීමෙන් දියුණුව සැලසෙන අයුරු පෙන්වා දෙන්න
- අදාළ ගාථා කටපාඩමෙන් පවසමින් එහි අදහස ඉදිරිපත් කරන්න.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ඛු.නි., ජාතකපාළි II, උම්මා දන්ති ජාතකය, 242 පිටුව.
- (දී.නි., iii, චක්කවත්ති සීහනාද සූත්‍රය, 100 පිටුව.)
- (ඛු.නි., ජාතකපාළි, මහාහංස ජාතකය, 352 පිටුව.)
- දී.නි., ii, මහා පරිනිබ්බාන සූත්‍රය, 212 -126 පිටු.
- දී.නි., III, සිගාලොවාද සූත්‍රය, 310 පිටුව.)

# 30 පාඩම

## දහම රකින්නා දහමින් රැකේ

**01. නිපුණතාව :- 9.0**

- සමාජ ආර්ථික දේශපාලනික හා සංස්කෘතික සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කොට ගෙන ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 9.2**

- බෞද්ධ දේශපාලනය ආර්ථික දර්ශනය හැඳින යහපත් පාලනයකට දායක වීම.

**03. කාලපරිච්ඡේද :-** 05 යි.

**04. ඉගෙනුම් පල :-**

- බෞද්ධ ආර්ථික දර්ශනය විස්තර කරයි.
- බුදුදහම තුළ නිවැරැදි ආර්ථික දර්ශනයක් දේශනා කොට ඇති බව පිළිගනිමින් කටයුතු කරයි.
- බෞද්ධ ආර්ථික දර්ශනය සඳහන් සූත්‍ර අන්තර්ගතයන් වෙන් වෙන්ව විස්තර කරයි.
- නිවැරැදි ආර්ථික දර්ශනයෙන් කටයුතු කරයි.
- යහපත් රැකියාවන්හි නිරත වෙයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- පෙළපොතේ ඇති "දහම රකින්නා දහමින් රැකේ" නැමැති 30 වැනි පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් "දාළිද්දියම්පි භික්ඛවේ" යනාදී පාඨයත්, සතර සැප ලේඛනයකුත් පන්ති කාමරයේ දී ප්‍රදර්ශනය කොට ඒ ඇසුරින් පාඩමට ප්‍රවේශ විය හැකිය.

**06. පාඩම් සංවර්ධනය :-**

- ව්‍යග්ඝපජ්ජ, චක්කවත්ති සීහනාද, සිගාලෝවාද, අණන වැනි සූත්‍ර බෞද්ධ ආර්ථික දර්ශනය සඳහා මූලික න්‍යාය පෙන්වාදෙන සූත්‍ර බව පෙන්වා දෙන්න.
- ධනය ඉපයීමේ දී බුදු දහම නිර්දේශ කරන ක්‍රමවේදය පැහැදිලි කර දෙන්න.
- වැරැදි වෙළෙඳාම් පෙන්වා එමගින් සිදුවන සමාජ හානිය පිළිබඳ ශිෂ්‍යය අදහස් ලබා ගන්න.
- වෙළෙඳාමේ දී සිදු කරන වැරැදි හා විෂමාචාරී ක්‍රියා පිළිබඳ විවේචනයක යෙදෙන්න.
- ආර්ථික සුරක්ෂිතතා සංකල්පය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම සූත්‍ර ඇසුරෙන් පහදන්න.
- අපායමුඛ හය මඟින් සිදුවන ආර්ථික පරිහානිය පිළිබඳ සාකච්ඡාවක නිරත වන්න.
- ධන විසර්ජනය, උපාර්ජනය, පරිභෝජනය, පරිහරණය, ආයෝජනය, බලි ප්‍රදානය හා තැන්පතු සම්බන්ධ සිගාලෝවාද සූත්‍ර විග්‍රහය පැහැදිලි කර දෙන්න.

- අදාළ නිර්ණායක යටතේ තක්සේරුකරණයේ යෙදෙන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේනම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත වන්න.
- ලෝක ආර්ථික සංවර්ධනය, පරිහානිය, සම්පත් හිඟය, අවිධිමත් භාවිතය, ආර්ථික උපායමාර්ග ආදී සංකල්ප පිළිබඳ සරල අදහසක් සිසුනට ලබාදෙන්න.
- දිළිඳුකම ජය ගැනීමට බෞද්ධ ආර්ථික ප්‍රතිපත්තිවල ඇති පුද්ගල හා සමාජ හිතකාමී බව
- පංචබලි සංකල්පය හා සමාජ යුතුකම්
- නිවන් මඟට මං පාදන බෞද්ධ ආර්ථික දර්ශනය
- සප්ත ආර්ය ධනය පිළිබඳ බෞද්ධ සංකල්පයේ අගය
- "සන්තුට්ඨී පරමං ධනං" යන දේශනා පාඨය තුළින් මතු කරන තෘප්තිමත් ජීවන සංකල්පය වැනි බෞද්ධ ආර්ථික සංකල්පවලින් සිසු මනස පෝෂණය කරන්න.
- සතර සම්පදා ආර්ථික සහ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා උපයෝගී වන න්‍යායක් බව සනාථ කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- පංචබලි - ඤාති බලි, අතිථි බලි, පුබ්බපෙත බලි, දේවතා බලි, රාජ බලි.
- උදුම්බර ඛාදක - අතුපතර කඩමින - මොර කන්න උන් විලසින
  අන් නැයන් කරන - නසා රට තොට නුපයන් ධන
- සතර සම්පදා - උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා, සමජීවිකතා
- සප්ත ආර්‍ය ධනය - සද්ධා ධනං, සීල ධනං - හිරි ඔත්ත පියං ධනං
  සුත ධනං ච චාගොච - පඤ්ඤාමේ සත්තමං ධනං

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම 01 -
  "දාළිද්දියම්පි භික්ඛවේ දුක්ඛං ලෝකස්මිං ගිහිනෝ කාමභෝගිනෝ" යන පාඨය හා එහි සිංහල අරුත ලියන ලද පුවරුවක් සහ සතර සැප නම් වශයෙන් (අත්‍ථිසුඛ, භෝග සුඛ, අණනසුඛ, අනවජ්ජසුඛ) ලියන ලද පුවරුවක්
- පෙළපොතේ තිස් වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්නායක :-

පහත සඳහන් නිර්ණායක ඇගයීම සඳහා යොදාගන්න.

- බෞද්ධ ආර්ථික දර්ශනය අන්තර්ගත සූත්‍ර පිළිබඳ අවබෝධය
- ධනෝපාර්ජනය සම්බන්ධයෙන් වැදගත් වන බෞද්ධ ඉගැන්වීම වටහා ගැනීම.
- ධන සුරක්ෂණය සම්බන්ධයෙන් වැදගත් වන බෞද්ධ ඉගැන්වීම් වටහා ගැනීම
- ධන විසර්ජනය සම්බන්ධයෙන් වැදගත් වන බෞද්ධ ඉගැන්වීම් වටහා ගැනීම
- පාඩමට අදාළ සූත්‍ර පාඨ ගාථා සහ ලේඛන මතකයෙන් ඉදිරිපත් කිරීම සහ පැහැදිලි කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- දීඝ නිකාය - චක්කවත්ති සීහනාද සූත්‍රය, සිගාල සූත්‍රය
- අංගුත්තර නිකාය - ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, අණන සූත්‍රය, පත්තකම්ම සූත්‍රය
- ධර්මසේන හෙට්ටි ආරච්චි - බෞද්ධ ආර්ථික දර්ශනය

## ත්‍රිපිටක ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව තක්සේරුකරණය හැඳින්වීම

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළින් නිපුණතා පාදක විෂය මාලාව හඳුන්වා දීමේ දී පාසල පදනම් කරගත් තක්සේරුකරණය පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එසේම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන්) සිදු වනඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම් ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනා ගෙන ඒවා දියුණු කරමින් හා පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟාකර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළෙකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැ යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයාගේ කාර්යභාරයයි. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාරගෝපදේශකත්වය ලබා දිය හැකිය. එම මගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමකින් සාක්ෂාත් වූයේ දැ යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව

ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතුය. මේ සඳහා පවත්නා හොඳම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමය යි. යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවයෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

| | |
|---|---|
| 1. පැවරුම් | 2. ව්‍යාපෘති |
| 3. සමීක්ෂණ | 4. ගවේෂණ |
| 5. නිරීක්ෂණ | 6. ප්‍රදර්ශන ඉදිරිපත් කිරීම |
| 7. ක්ෂේත්‍ර චාරිකා | 8. කෙටි ලිඛිත පරීක්ෂණ |
| 9. ව්‍යුහගත රචනා | 10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. ශ්‍රවණ පරීක්ෂණ |
| 13. ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. කථනය |
| 15. ස්වනිර්මාණ | 16. කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. සංකල්ප සිතියම | 18. ද්විත්ව සටහන් ජර්නල |
| 19. බිත්ති පුවත්පත් | 20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21. ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. විවාද |
| 23. සාකච්ඡා මණ්ඩල | 24. සම්මන්ත්‍රණ |
| 25. ක්ෂණික කථා | 26. භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම සෑම එකක්මත්, සෑම විෂයක් සම්බන්ධයෙන්මත්, සෑම විෂය ඒකකයකටමත්, යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.